**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය ඇවදි විය

(දොළොස්වන වෙළුම)

# නොපෙනෙන සත්‍යය

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

**නොපෙනෙන සත්‍යය**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම
**වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය
**K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
   https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
   https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado Unity -
   https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
   https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
   https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
   https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
   https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
   https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
   https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana -
    https://youtube.com/@BuddothpadoTVdammaDesana

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඥාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

   2.1 කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

   2.2 කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කළ්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

   බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥ්ඥාණය)

   - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
   - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
   - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
   - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
   - ශූන්‍යතා අවබෝධය
   - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍ෂයඥාණය)
     (සිත = අරමුණ = ආත්මය)

   1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

   1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

   1.3 යෝනිසෝමනසිකාරය

   1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව
   **ශ්‍රාවකයා උට්ඨාන වීරියෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඤාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඤාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතූපපාත ඤාණය, ආසවක්‍ෂය ඤ්ඤාණය)

2.2. **කෘතඤාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඤාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැගලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



නුවණැත්තෝ වහා අල්ලා
ගැනීමට අපහසු වූ වහා ඇතිව
නැතිවන්නාවූ කැමති අරමුණක
ගැටෙන්නා වූ සිත දමනය කරයිද, දැමූ
සිත සුව ගෙන දේ.
සඳහම්පිපාසයෙන්
පෙලෙන්නා වූ ලෝ සතහට,
බුද්ධෝත්පාදයෙන් ගලාබසින
දම් අමා ගඟුලේ ගිලී,
සසර දුක් ගින්දර නිවාගෙන
උතුම් මුනි බවට පත් වී,
සදා අමරණීය බවට පත්වන්න
සියලු දෙනාටම
මේ සත්‍ය ධර්මය හේතුවේවා!
“ධර්මය දානය සියලුම දන් දිනයි
ධර්ම රසය සියලු රස දිනයි
රහත් ඵලය සියලු දුක් දිනයි.”

# පටුන


| | | |
|---|---|---|
| 01 | ඔබට ඔබ නැති තැන නිවන එතනයි | 13 |
| 02 | මම උපදින්නේ මැරෙන්නේ මේ මොහොතේ | 30 |
| 03. | සත්‍ය ධර්මය නොදන්නා වූ අසෘතවත් පෘතග්ජනයාට සසර දිගය | 43 |
| 04. | ඔබ තුළ සිටින මාරයා ඔබේම සිතුවිලි | 52 |
| 05. | ‘ලෝකය’ යනු සැබෑ නොවූ සිහිනයක් පමණි | 67 |
| 06. | මරුවාට අසුවිය නොහැකි තැනක් තිස්එක් ලෝකධාතුවෙහිම නැත | 75 |

# 01

# ඔබට ඔබ නැති තැන නිවන එතනයි

**ආර්යයන් වහන්සේ :** සම්මුතිය තුළ අපි කතාබහ කරන්නෙ පෘථග්ජනයන් එක්ක. හැබැයි මේ මාර්ගයේ යන යෝගාවචර ස්වභාවය තුළ අපේ ස්වභාවය පෘථග්ජන ස්වභාවයන් නෙවෙයි නේ. ඒක නිසා අපි එතනදි ඒ විදියටයි අපේ කතිකාව සිද්ධ වන්නෙ. මේ ගැන හිතල අපි කතාබහ කරන්න ඕනි. සාමාන්‍ය විදියට තමන්ගෙ ස්වභාවයේ හැසිරෙන එක තමයි හරි, ඒක වැරදි නෑ. හැබැයි සාමාන්‍ය විදියට තමන්ගේ ස්වභාවය හිතල ගන්නත් බෑ. අනවශ්‍ය විදියට එහෙම රඟදක්වන්නත් බෑ. එතකොට රඟපානව කියන එක සිද්ධ වන්නෙ නෑ. කොහොමත් අර පුරුද්දට එන දේ තමයි කියවෙන්නෙ. ඉතින් අර අවබෝධය ඇති කර ගන්න එක තමයි එතන විසඳුම. වෙන විසඳුමක් නෑ. කතා කරන විලාසය වෙනස් කරල හරියන්නෙ නෑ. සාමාන්‍ය විදියට කතාබහ කරන එක කමක් නෑ. ඒ හැම එකම ධර්මයේ තියෙනවා. ඉතින් අවබෝධය තුළ මෙතන සත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මයක්, කෙනෙක්, දෙයක් නොවන ස්වභාවයක අභ්‍යන්තරයෙනුත් ප්‍රායෝගිකව හැම මොහොතෙම ඒ ස්වභාවයට පත්වුණු ස්වභාවයක් දැනෙනව නම් අන්න ඒක අපි අගය කරනවා. මේක ඇත්තටම හංගන්න පුළුවන් එකක් නෙමෙයි. මේ අවබෝධය හංගන්න බෑ. අවබෝධය කොහොමත් අවබෝධයක් විදිහට පවතිනව. හොඳයි අපි කතා කරමු. හොඳයි කියන්න කාරණාව.

**මෙහෙණින් වහන්සේ:** අපට තිබුණ අවසාන සාකච්ඡාවේදී කම්පන ස්වභාවයට බැස ගත්තා කියල නොබැස ගන්න අරමුණෙත් ඔබ වහන්සේ පැහැදිලි කරල දුන්න නේ ආර්යයන් වහන්ස, ඊට පස්සෙ නොපෙනෙන සත්‍ය කියන දේශනා ටික අහන කොට බැස ගත්ත අරමුණ මොකක්ද,

නැති අරමුණ මොකක්ද, කියන එක හොඳට පැහැදිලි වෙන්න පටන් ගත්තා ආර්යයන් වහන්ස. ඊට පස්සෙ නැවත ඔබ වහන්සේ පැහැදිලි කළා නැවත ආයතන 6 හොඳට මෙනෙහි කරන්න කියලා. ඒ වෙලාවේ අභ්‍යන්තරයට දැනෙන ස්වභාවයෙන් ඔබවහන්සේ ඒක පැහැදිලි කළා. ඊට පස්සෙ ආයෙත් ආයතන 6 මෙනෙහි කරන්න ගත්තා ආර්යයන් වහන්ස, නමුත් මෙනෙහි කරන්න කියල හිතල කරන්න ගියොත් ආර්යයන් වහන්ස දැනෙනව එතන කෙනෙක් ඉස්මතු වෙනවා, එතන එහෙම කෙනෙක්නෑ. අභ්‍යන්තරයෙන් අවදි වෙන සිහියටමයි මේක දැනෙන්න ඕන කියන ස්වභාවය දැනුණා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අන්න හරි, ඒක ගොඩාක් වැදගත්. මෙනෙහි කරනව කියන එකක් නෑ. **ඇත්තටම යෝගාවචර භූමියේ මෙනෙහි කරන්නේ බැස ගත්තොත් පමණයි.** එතකොට මෙතනදි ඇත්තටම සිද්ධ වෙන්නේ මෙනෙහි කරනවා කියනකොට, අපි කරනව වගේ දෙයක්. නමුත් මෙතන ඇත්තටම, යෝනිසෝමනසිකාරයයි යථාභූත ඥානයයි කියන කොට, ඇත්තටම මෙනෙහි වෙන එකක් තමයි සිද්ධ වන්නේ. සිහියට හසුවනවා මේක දැන් බැසගත්තා කියල, අන්න එතනදි මෙනෙහි වෙනවා. යෝගාවචර භූමියේ අපි කතා කරන තැන ගොඩක් දියුණු තැනක්. මේ 'ඕභාසය' කියල කතා කරන තැන. මේක සාමාන්‍ය එසේ මෙසේ කතාවක් නෙමෙයි. මේක ඇවිල්ල අනුරුද්ධ ස්වාමීන් වහන්සේත් බුදුන් වහන්සේත් අතර අරහත්වයට පත්වන අනාගාමී භූමියෙන් එහා කෙරෙන කථිකාවක්. අනාගාමී භූමියෙන් එහා කෙරෙන අරහත්ත මාර්ගය තුළ කෙරෙන කථිකාවතක් තමයි මේ "ඕභාසය ඨිථියව" පවතිනවා කියන තැනට එන එක ඒක ඇත්තටම සාමාන්‍යයෙන් ගොඩක් දුර මේ මාර්ගය තුළ ඇවිත් තියෙනව. දර්ශන ඥානය හොඳින් තියෙනව. දර්ශන ඥානය හොඳින් තියෙන නිසා ආත්ම දෘෂ්ටියක් නෑ. මෙතන ආත්ම සංඥාව දියවෙන ස්වභාවයට තමයි මේ එන්නෙ.

මේ ඇවිල්ල තියෙන්නේ ඛේමක සූත්‍රයේ තියෙනවා ඛේමක **ස්වාමීන් වහන්සේ කියනව ආත්ම දෘෂ්ටිය පංච උපාදානස්කන්ධය ආත්ම වශයෙන් නොගනී කියල.** ඒ කියන්නේ ආත්ම දෘෂ්ටියෙන් ගත්තෙ නෑ කියලා. ආත්ම දෘෂ්ටිය ගන්නේ නැති බව. **වේදනාව මම මගේ කියල**

**ගන්නෙ නැති බව** ඛේමක ස්වාමීන් වහන්සේ දේශනවා කරනව එතනදි. ඊට පස්සේ ඛේමක ස්වාමීන් වහන්සේ කියනව **ඒ වුණාට මෙතන මාන උද්දච්ච ඒ කියන්නෙ දැනෙන ගතිය තියෙනව කියල. තවම ක්ෂීනාස්‍රව අරහත්වයට පත්වුණේ නැහැ කියල.** එතකොට ආත්ම දෘෂ්ටිය පංච උපාදානස්කන්ධය ආත්ම වශයෙන් නොගනී, මම මගේ කියල වේදනාව මගේ කර ගත්තෙනෑ කියල ඒ ආරම්මණයේ ප්‍රකාශ කරනව. ඛේමක ස්වාමීන් වහන්සේ වේදනාව මම මගේ කියල ගත්තේ නැහැ කියන එක කියනව නේ. ස්ථවිර ස්වාමීන් වහන්සේල අහනව නේ එහෙම නම් ඔබ රහත් වෙලාද කියල. ඊට පස්සෙ ඛේමක ස්වාමීන් වහන්සේ කියනව නේ මම මගේ කියන දෘෂ්ටිය අතහැරිය පංචඋපාදානස්කන්ධය, ඒ කියන්නේ එන අරමුණ නේ පංච උපාදානස්කන්ධය කියන්නේ. අරමුණ මම මගේ කියල ගත්තේනෑ. ගන්නෙ නෑ. ඛේමක ස්වාමීන් වහන්සේ ඒක අත්හැරලා තියෙන්නෙ. **ආත්ම දෘෂ්ටිය අත හැරලා තියෙන්නෙ. හැබැයි ඒ වුණාට ආත්ම සංඥාව තියෙනව.** ඒ නිසා තමයි ඛේමක ස්වාමීන් වහන්සේ කියන්නෙ ආත්ම දෘෂ්ටිය අත හැරිලා, මම මගේ කියල ගන්නේ නෑ, ඒ වුණාට මම තාම ක්ෂීනාව අරහත්භාවයට පත්වුණේ නෑ කියලා. එතකොට ස්ථවිර ස්වාමීන් වහන්සේලට ඒක තමයි ප්‍රශ්නයක් වෙන්නෙ. ආත්ම දෘෂ්ටියත් නැත්නම් මම මගේ කියල ගන්නෙත් නැතිනම් සලායතන නිරෝධයක් දකිනව නම්, "ආයතන නිරෝධෝ නිබ්බාණෝ" කිව්වට, නමුත් ඒකට පත්වෙන්නෙ ක්ෂය ධම්මා වය ධම්මා කියන විදියට පත්වෙන්න තියෙනව පත්වෙලා නැහැ.

හැබැයි අපි සාමාන්‍යයෙන් ධර්මයේ අහනව "සලායතන නිරෝධෝ නිබ්බාණෝ කියල switch එකක් එබුව වගේ මේක වන්නේ නැහැ. සලායතන නිරෝධය දකිනවා. දෘෂ්ටියෙන් මිදෙනව. හැබැයි ඒ වුණාට අර ක්ෂය ධම්මා, වය ධම්මා කියන 'නිබ්බිදන්ති විරාගන්ති නිරෝධන්ති පටිනිස්සග්ගානුපස්සී' කියන අර ක්ෂය වීම සිද්ධ වෙන්න තියෙනවා. මේකයි ඛේමක ස්වාමීන් වහන්සේ කියන්නෙ. තවම අරහත්වයට පත්වූයේ නැහැ කියල. දැන් මේක තමයි මහා ආශ්චර්යවත් දේශනයක් වන්නෙ. ඒ කියන්නේ සලායතන නිරෝධය දැක්කෙ නෑ නෙවෙයි නේ. සලායතන නිරෝධය දැක්කා. සලායතන නිරෝධෝ නිබ්බාණෝ කියන්නෙ, නිවන් දකින්න ඕන කියලයි භික්ෂූන් වහන්සේලා කියන්නෙ. ඛේමක ස්වාමීන්

වහන්සේ කියනව නමුත් ඒක වෙලා නැහැ තවම, තවම මට ආත්ම සංඥාව තියෙනව කියල. තවම මාන උද්ධච්ච තියෙනව කියලා වචන දෙකෙන්ම කියනව මානය තියෙනව කියල. ඒකෙන් අපිට හොඳටම ප්‍රත්‍යක්ෂ වෙනවා මේ ආයතනයට හිමිකාරයෙක් නැති බව, දකින කොට අර උපක්ලේශ සූත්‍රයට එනව ඕභාසය මතුවෙනව කියන එක තියෙනව. අර ඕභාසයට ගළපල බැලුවම මේ කතා කරනව කියන්නෙ ආත්ම දෘෂ්ටිය නෑ. ආයතන නිරෝධය දකිනව කියන්නෙ, ආයතනවල දෙයක් කියල ගන්නෙ නෑ.

ආයතන දෙයක් කියල ගන්නෙ නෑ කියන්නෙ ස්පර්ශ මට්ටමින් දකිනවා. ඒ කියන්නෙ sparke sences මට්ටමින් දකිනව නිකම් ආයතන විතරයි sences මට්ටමින් දකිනව. ඒවට හිමිකාරයෙක් නැති වෙනව. මම මගේ කියල ගන්නෙ නෑ කියන්නෙ හිමිකාරයා නැති වෙනවා. දිවට රස දැනුණට මගේ කියල එන්නෙ නෑ. සිතුවිලි ආවට මනෝ විඤ්ඤාණයට, සිතුවිලි මගේ වෙන්නෙ නෑ. මම කියල ආත්ම දෘෂ්ටියේ බැස ගෙනනෑ. එතකොට ගන්ධ රස පහස සියල්ලම මම මගේ කියල බැස ගෙනනෑ. වේදනාවත් එහෙමයි. කාය ප්‍රසාදය, ඒකත් මම මගේ කියල බැසගෙන නෑ. **මම මගේ කියල ගත්තෙ නෑ කියන්නෙ ආත්ම දෘෂ්ටිය බිඳ වැටිලයි තියෙන්නෙ.**

එහෙනම් ඛේමක ස්වාමීන් වහන්සේ රහත් වෙලා ඉන්න ඕන බව ස්ථවිර ස්වාමීන් වහන්සේල කිව්වට, ඛේමක ස්වාමීන් වහන්සේ කියනව මට ආත්ම සංඥාව තියෙනව කියලා. තවම උද්දම්භාගයේ සංයෝජනවල මාන උද්ධච්ච තියෙනව කියල. තවම උද්දම්භාගයේ සංයෝජනවල රූප රාග අරූපරාග ගියාට මාන උද්ධච්ච දුරුවුණේ නැහැ කියලා. මෙන්න මේක මහත් ආශ්චර්යක්. මේ පැහැදිලි කිරීම. 'උපක්ලේෂ සූත්‍රය' අනුව ඕභාසය කියල අර ගන්න කොටත් මෙතන ඕභාසය පේනව. **රූප දර්ශනයෙන් මිදෙනව කියන්නෙ ආයතනභයෙන් මිදෙනව. හැබැයි 'ඕභාසය' තියෙනව. 'ඕභාසය' ආත්ම සංඥාව අන්න තියෙනව ඇවිල්ල බැසගෙන. මේක ඉතාම ගැඹුරුයි. මේක තියෙන්නෙ අරහත්ත මාර්ගය තුළ, අරහත්ත ඵලයට පත්වන තැන. මේක දියවී ගෙන ගිය තැනයි අරහත්ත ඵලයට පත්වෙන්නෙ.** දැන් රූප දර්ශනයෙන් මිදිලා. මෙතන

මෙහෙම දෙයක් නැති බව දකින කොට අපට අරමුණු බැස ගන්නෙ නෑ කොහේවත්. **බාහිරත් දෙයක් නෑ සිතෙත් දෙයක් නෑ තමයි ඊට පස්සේ, මිදිලා. ඒ මොහොතේ නිවන දැක්කට නිවනට පත්වෙන්නෙනෑ. මෙන්න මේකයි රැවටෙන්න එපා කියන්නෙ.**

ඒකයි ආත්ම දෘෂ්ටිය මෙතන නෑ. මොකද මෙතන දෙයක් නැහැ නේ. දෙයක් නැත්නම් මෙතන කෙනෙකුත් නෑ. එහෙනම් ආත්ම දෘෂ්ටිය නෑ. ඒ වුණාට දීර්ඝ කාලයක් තිස්සේ ආපු ආරෝපණය දියවන්නෙ නෑ කියන එකයි. ආරෝපණය තමයි මේක ක්ෂීණාස්‍රව රහතන් වහන්සේ ගිය මග, ක්ෂය ධම්මා වය ධම්මා කියන්න හේතුව, සංඛත ධම්ම සකස් වන ධම්ම, වේගෙට සකස් වෙන ඒවා, අර ආරෝපණය කියන එකෙන් හොඳට තේරෙනවා මේක ක්ෂය වනවා. ක්ෂය වී ගෙන යන ධර්මයක් ආත්ම සංඥාව ක්ෂය වී ගෙන යනව කියල පෙන්නුවෙ ඔන්න ඔය නිසයි. ආත්ම දෘෂ්ටියනෑ. ඒ කියන්නෙ සිතුවිලිවලින් මම මගේ කියන දෘෂ්ටිය බිඳ වැටිල ඉවරයි, සිතුවිල්ලෙන් නේ පටන් ගන්නෙ මම මගේ කියල දෘෂ්ටිය. අපි හිතනවනේ මේ මම ඉන්නව කියල. මම ඉන්නව කියල හිතන එක වෙනයි. මම ඉන්නව වගේ දැනෙන එකකුත් එනව නේ යටින්. අන්න දැනෙන ආත්ම සංඥාව වෙනයි, හිතන එක වෙනයි, තේරුණා නේද? දැනෙන එක දියවන එකයි මේ කතාවේ තියෙන්නෙ.

මේකේ අන්තිමටම එන අරමුණේ රූප දර්ශනය ප්‍රකට වෙන්නෙ නෑ. මිදුණු ස්වභාවයක් අත්දකිනවා. ගොඩක් අයට සමාධිමත් ස්වභාවයක් එනවා 'ඕභාසය' තියනකොට. 'ඕභාසය' කියන්නෙ සමාධිය. ඒ සමාධි ස්වභාවයක් එනව. ඒ කියන්නෙ වටපිට බලන කොට වුණත් මේක දකින කෙනාට මිදුණ ගතියක් දැනෙන්න ගන්නවා. හැබැයි ඒත් නිවන නෙවෙයි, නිවනට පත්වෙලා නෙමෙයි. අන්න ඒ ස්වභාවය බලන කොට මම ඉන්නව. ඒ කියන්නෙ ඒ ස්වභාවය තුළ හරි සැහැල්ලුවක් තියෙනව නේ. හරි සාන්තයි නේ. ආර්යයන් වහන්සේ කියන එක හරිනේ. හරි සුකුමයි නේ බලන කොට ඒ ස්වභාව, එයාගේ ආත්මීය ස්වභාවය එතන තියෙන්නේ. 'ඕභාසය' තුළ දන්නෙම නැතුව ආත්ම සංඥාව බැසගෙන. කොහොමද මේ මායාව හිතන්නවත් බෑ. ඒ කියන්නෙ විඤ්ඤාණ මායාවෙන් මිදිල, නමුත් අර ස්වභාවය තුළ ආත්ම සංඥාවක් තියෙනව. මේක තමයි

මේකේ ආශ්චර්යමත් දෙයක් මේ පැහැදිලි කරන්නෙ. ඇත්තටම මේ පැහැදිලි කිරීම බුදු සමයට ගියා වගෙයි.

බුදුන් වහන්සේ කරන්න ඕන පැහැදිලි කිරීමක් මේ කරන්නෙ. අපට 'උපක්ලේෂ සූත්‍රවල' අනුරුද්ධ ස්වාමීන් වහන්සේම ප්‍රකාශ කරන හැමදේම මෙතනදී අපට හොඳ අවබෝධයක් තියෙන්න ඕන. නැත්නම් ගළපා ගන්න බෑ මේක. මේක ගළප ගන්න එක ලේසිනෑ. බේමක සූත්‍රයේ බලන්න. මේ කාරණා. 'මාලුඛ්‍යපුත්‍ර සූත්‍රයට අප ඊළඟට යන්න ඕන. මාලුඛ්‍යපුත්‍ර සූත්‍රය අපි දේශනා කළා. නමුත් ඒ වගේම කාරණාවක් තියෙනව එතන. ඊළඟ ස්ටෙප් එකට එනව. අලමරිය ඥාන දර්ශනයට එනකොට. ඒ කියන්නෙ මෙතන බැස ගත්ත ප්‍රමාණය ස්වභාවයෙන් දියවී ගෙන යනව. හැබැයි දියවී ගෙන ගියාට මේක තමයි vision එකක් විදියට දැක්මක් විදියට මෙහෙණින් වහන්සේලාත් ගන්න ඕන මේ වෙන්නේ මොකද්ද කියන එක. ඕභාස ස්වභාවය, **ආත්ම ස්වභාවය තිබුණාට ඒකත් දියවී ගෙන යනව.** ඒ කියන්නෙ එතන **මාන, උද්ධච්ච දියවී ගෙන ගිහින් අරහත්වයට යනව.** හැබැයි ඒ ස්වභාවය තුළ මොකක්ද වෙන්නෙ? **අර සාමාන්‍ය විදියට රූප දර්ශනය, සාමාන්‍ය විදියට ඕභාසය තිබුණාට දෙකෙන්ම බැස ගත්තෙ නැති ස්වභාවයක් මතුවනව අන්තිමට. ඕකයි 'අවිතක්ක අවිචාර' ස්වභාවය තුළ අලමරිය ඥාන දර්ශනය කියන 'අධිගත සමාධිය' කියන්න හේතුව.** එතන ආත්ම සංඥාව දෙපැත්තකට නෑ අර මිදුණ ස්වභාවයෙන් අර දැනෙනව වගේ මාන ස්වභාවය දියවී ගෙන ගිහින් ක්ෂීනාස්‍රව රහතන් වහන්සේගේ ස්වභාවයට පත්වෙනවා කියන එකේ දී, අවසානයේ දී වෙනද විදියටම පේනව ඇහෙනව දැනෙනව වුණාට අවධියක් තියෙනවා. අවධිය දැන් ප්‍රකටයි. අවධිය ප්‍රකට වෙන්න ඕන ඉස්සෙල්ලම මේකට එන්න. අවධිය හොඳින් පත්තියම් වෙන්න ඕන කියල අපි කියන්නෙ. **අපි ඉන්නෙ පෘථග්ජන ස්වභාවයේ ඉඳල රූප දර්ශනයත් එක්ක.**

හැබැයි අවධිය කියන එක මතුවෙන්නෙ විදර්ශනා සමාධියෙන්මයි. මේ විදර්ශනා සමාධියත් හොඳින් බහුලීකත වෙන්න ඕන. මේක සමථ සමාධියේදීත් තියනව බහුලී කතා වෙන්න ඕන කියල. මෙතනත් තියනව බහුලීකතා වෙන්න ඕන කියල. නිතරම සමාධිය තමාට ප්‍රායෝගික වන්න ඕන මේ 'ඕභාසය' කියන එක මිදුණ ස්වභාවය, එතකොට ඒක පත්තියම්

වෙනව. ඒක පත්තියම් වුණාට පස්සෙ තමයි හැම මොහොතෙම දැනෙන ස්වභාවයක් එන්නෙ. අවිධිමත් ගතියක් දැනෙන්නෙ.

ඒ දැනෙන අවිධිමත් ගතියේ ස්වභාවය. හැබැයි ආත්ම ස්වභාවයක් නෑ. නමුත් රූප දර්ශනයක් තියෙනව. ඕභාසයකුත් තියෙනව. ආත්මීය ස්වභාවයත් දැනෙන්නෙත් නෑ. අවසානයට ගියහම තමයි ඒක එන්නෙ. හැබැයි ඔය ආත්ම ස්වභාවය නොදැනෙන ස්වභාවය තුළත්, මේ රූප දර්ශනයත් තියෙනව අවධියක් තියෙනවා කියන ස්වභාවය මතුවෙනවා, ඒක තමයි 'අලමරිය ඥාන දර්ශනය' කියල කියන්නෙ. ඒ කියන්නෙ අරහත්වයට පත්වන්න කලිනුත් මේ ස්වභාවය මතුවෙනව. නමුත් ඒ දැනෙන ස්වභාවය තුළම මතුවනව, නමුත් ඒ දැනෙන ස්වභාවය තුළම එනව දියවී ගෙන යන ස්වභාවයක්, තමන්ට අරහත්වයට පත්වුණ ස්වභාවය දැනෙන්න ගන්නව. ඒක දැනෙන්න ගන්නව කිව්වට, දැනෙන කෙනෙක්නෑ. සිහියට නුවණට ඥානයට හසුවෙනවා. කම්පනය හසුවෙනවනේ. කම්පනය දියවෙන එකත් හසුවෙනව. දියවෙන්නෙ නැති ස්වභාවයත් හසුවෙනවා. දියවෙලා ගිය ස්වභාවයත් හසුවෙනවා.

කම්පනය හසුවෙනව නම්, දියවෙන ස්වභාවයත් හසුවෙනව නම්, දියවෙලා ගිහිල්ල නොදැනෙන ස්වභාවයත් හසුවන්නෙ නැතුව බැහැනේ. ඒකත් හසුවෙනව. ඒකයි ඥානයට හසුවනව කිව්වෙ. "ඤායස්ස අධිගමාය" කිව්වෙ ඒකයි. "නිබ්බානස්ස සච්ච කිරියාය" කිව්වෙ ඒකයි. "සත්තානං විසුද්ධියාය දුක්ඛ දෝමනස්ස අත්ථගමාය සෝක පරිද්දවා නං සමතික්කමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ච කිරියාය" කියල පංච විධ ආනිශංස හිමිවෙනවා කියන්නෙ මෙන්න මේ නිවැරදි මාර්ගය හඳුනගෙන ගිය කෙනෙකුට විතරයි.

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. එතැනින් පස්සෙ ඔබ වහන්සේගේ දේශනාවක් ඒ අතරට හමුවුණා අවාරෙට සිරීපාදෙ ගිය දේශනාවක්. ඒකෙදි ඔබ වහන්සේ කියන්නෙ "මමත් එක්ක මම ගමනක් යනවා" කියල ඊට පස්සෙ ආර්යයන් වහන්ස මේ දැනෙන ස්වභාවය ඒකෙන් තවත් සියුම් වෙන ස්වභාවයක් දැනෙන ස්වභාවය අනුව ඔබවහන්සේ ලොකු තත්ත්වයක් එතන කියන්නෙ. එතන මම කියන තැන ආයතනවලින් හැදුණ ආත්මය නේ ආර්යයන් වහන්ස, එතකොට

'මමත් එක්ක මම ගමනක් යනවා.' සිහිය නේ එතන. මුල් ටිකට හොඳට ගැළපෙනවා. ඊට පස්සෙ ඔබ වහන්සේ අවසානයට කියනව නේ ආත්මය යන්න ගියා, සිහිය ගිලිහී ගියා කියල ආර්යයන් වහන්ස ඔබ වහන්සේ පැහැදිලි කළා නේ ඕභාසයේ කෙනෙක් ඉන්නවා කියන ස්වභාවය. ඕභාසය තියෙන තැන කෙනා ඉන්නබව දැනෙනවා කියන ස්වභාවය. එතකොට ආර්යයන් වහන්ස, මේක සිහියට හසුවෙන ස්වභාවය තුළ අවසානයේදී දැනීමක් තියෙන්නෙ. දැක්කා නම් දැක්කා විතරයි වගේ කියන ස්වභාවයක් වින්දට එතනම පවතින්නෑ කියන ස්වභාවය දැනෙනව. මේ කියන දේ ඔබ වහන්සේට දැනෙනවා ඇති මම හිතන්නෙ.

**ආර්යයන් වහන්සේ:** ඔය කතාව අපි නිතරම කියන කතාවක්. ඒක ගොඩක් වැදගත්. ඒ කියන්නේ අපි ලෙනගලදී ඔය කතාව කියනවා ගල උඩ ඉන්න වෙලාවෙදි. එතනදි අපි ඕක පොතේ ලියනව. "මමත් එක්ක මම ගමනක් ආවා, මාව දාලා මම යන්න ගියා" කියල. ඒ කියන්නෙ ඇත්තටම මේ සක්මන් භාවනාව කරන කොටත් සිද්ධ වෙන එකක් අපි ඒක අත් දැකපු දෙයක්. **සක්මන් භාවනාව පටන් ගන්න කොට මමත් එක්ක මම සක්මන් කරනවා. හැබැයි සක්මන අවසාන වෙන කොට මම නැතුව මම සක්මන කරනවා. මමත් එක්ක මම සක්මනට එනවා. සක්මනින් යන කොට මම නැතුව මම යනවා.** මේක පුදුම සක්මනක්, සක්මන් කරන්නම වටිනවා.

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. අපි අර කාය සංඛාර, වචී සංඛාර ඒ තැන්වලදී මම නැතුව ඒ ක්‍රියාව කරන හැටි, එතනදි 'සෙන්සර්' හය විතරක් දැනෙන තැනදි, එහෙම දැනි දැනී තිබ්ල කතාකරන කෙනෙක් නෑ වගේ 'මනෝ සෙන්සර්' එකෙන් සිහිවෙනවා. ඊට පස්සෙ අහසෙ විදුලි කොටන කොට මේ ජනෙල් සෙලවෙනව වගේ ස්වරාලය කම්පනය වෙලා වචනය පිටවෙන හැටි.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඒක ආශ්චර්යයක් නේ. ඒ පොඩි දරුවා කතා කරන හැටි කියන එක හරි ආශ්චර්යයි නේද? අහසේ විදුලි කොටන කොට මේ ජනෙල් සෙලවෙනව වගේ අපගේ කන්බෙරය වයිබ්‍රේෂන් වෙන කොට, ඒ වයිබ්‍රේෂන් එකට කම්පනයට ස්වරාලය ප්‍රතිකම්පනය

වෙනවා කියන එක. අතන කන් බෙරයත් පටලයක් නේ. ඒක වයිබ්‍රේෂන් වෙනව අහසෙ විදුලි කොටනව වගේ. එතකොට ස්වරාලය ළඟ පටලය අර ප්‍රතිකම්පනය වෙනව. ඒකත් හරියට මේ ජනෙල් සෙලවෙනව වගේ. එතකොට 'මිම්, මම් මම් මා කියල අම්ම කියන හැටි, පොඩි දරුව දිහා බැලුවොත්, පුදුම ස්වභාදහමක්නේ තියෙන්නෙ. ආත්මයක් කරනව නෙවෙයිනේ. ඒ වචනය ආත්මෙකින් කියන්නෙ නැහැ නේ. මේක system එකෙන් නේ එන්නෙ. හැම වචනයක් ම සිස්ටම් එකක්නේ. මේක තේරුම් ගන්නව කියන්නේ කන්න නැතත් කමක් නෑ, බොන්න නැතත් කමක් නෑ මේ තමයි අපේ ආහාරය. පුදුම අවබෝධයකට එන්නෙ. කියන්න වචන නෑ ඒකට.

ඇත්තටම මුලින්ම ඕන කෙනෙක් සක්මනට යන කොට දැන් යෝගාවචර භූමියේ, එහෙමනේ **මුලින් කෙනෙක් නැතුව, මුලින්ම 'සවිතක්ක සවිචාර' ස්වභාවයකින්නේ සක්මනට ඇතුල් වෙන්නෙ. ඊට පස්සෙ ටික දුරක් යන කොට මෙතන තද ගතිය සීමා කරනව ස්පර්ෂයට. ඒ කියන්නෙ කාය ප්‍රාසාදයට. තද ගතිය තද ගතියක් විතරයි; කියන තැනට සිහියක් පවත්වා ගෙන යනවා. ඇත්තටම සිහිය එළඹෙනවා. ධර්මය දකින කෙනාට සිහිය එළඹෙනවා. එතකොට එතන ආත්මයක් නැති බව දැනෙන්න ගන්නව ධර්මය මෙනෙහි වෙනව. එතකොට ආත්මයක් නැතුව තද ගතිය විතරක් අරමුණු වෙන සක්මනක යෙදෙනව.** එතකොට ආත්මය නෑ සක්මනේ යෙදෙනව. මේක **බහුලීකතා වෙන්න ඕන. මේක නිතර නිතර තමන්ට පත්තියම් වෙන්න ඕන.** ඒ කියන්නෙ අනුසෝතය නෙවෙයි නේ. මේක පටිසෝතය නේ. පටිසෝතය පත්තියම් වෙන්න ඕන. **පත්තියම් කර ගන්න තමන් දක්ෂ වෙන්න ඕන. කුසලය තියෙන්න ඕන.** තමන් පරිවර්තනය වෙන්න ඕන. ඕකට හොඳ වචනයක් තියෙනව ධර්මය තුළ. පරිවර්තන වෙනව කියන එකට. ඒ කියන්නේ අපි අනුසෝතයට පත්තියම් වෙලා ඉන්නෙ දන්නෙ නැති වුණාට. අනුසෝතය තුළ හැම තිස්සෙම ආත්ම සංඥාවක් දෙනව අපිට මේ ඉන්නව තියෙනව කියල පේන්නෙ නැති වුණාට දෘෂ්ටිය තුළ දැනෙන පැත්තෙනුත් එනවා.

Senses වල සේරම ධර්මය දැක්කෙ නැත්නම් කොහොමත් Senses වල ප්‍රසාදය මම කියල ඉවරයි. මම වෙලා **Senses වල ප්‍රසාදය මේක**

**දැනෙන දැනීම් සියල්ලම ආත්ම දෘෂ්ටියෙන් අරගෙන ඉවරයි,** එනකොටම ඉත්ථ සංඥාවකින් එන්නෙ. තියෙනව වගේ දැනෙන ගතියකින් එන්නෙ. **තියෙනව වගේ දැනෙන ගතිය මගේ වෙලා ඉවරයි, 'මම' 'මගේ' 'මගේ ආත්මය' මෙතන හැදිල ඉවරයි.** දැන් මෙතන මොකද වෙන්නෙ. **ධර්මය දකින කොට තද ගතිය තද ගතියක් විතරක් වෙනව,** ධර්මය දන්හුටයි "ජානතෝ අහං භික්ඛවේ ඵස්සතෝ ආසයවානම් ඛෙයයම් වදාමි" දන්නහුටයි තමයි මේක දැනෙන්න ගන්නේ ප්‍රායෝගිකව අත් දකින්න ලැබෙනව.

මේ තද ගතිය විතරයිනේ දැනෙන්නෙ. කෝ මේ මමෙක්යැ මේ තද ගතිය විතරයි. මේ **කකුලට නේ දැනෙන්නෙ තද ගතියක්. කොහේද මමෙක් ඉන්නේ. හොඳටම මේක දැනෙන්න ගන්නව. ප්‍රාසාදය හොඳට දැනෙන්න ගන්නව. ඊට පස්සෙ සුළඟ ඇවිල්ල ඇඟේ වදින කොට ඒක අරමුණු කරපු ගමන්ම දැනෙන්න ගන්නව මේකත් ප්‍රසාදයක් නේ.** රස්නයක් හරි අව්වක දැනුණාම ඒකත් ප්‍රසාදයක්. මොනව හරි දැක්කත් ප්‍රසාදයක්. ශබ්දයක් ඇහුණාත් ප්‍රසාද වීමක්. සක්මනක් නොවෙයි මේ තනිකරම යන්නෙ ඍද්ධිමය ස්වභාවයක්, මේක ටික ටික ප්‍රසාද දැන දැන, අන්තිමටම සේරම මමයාගේ කතාවක්ම නැතිවෙලා. අරමුණු කළේ තද ගතිය විතරක් නම් පඨවි සංඥාව විතරයි. තද ගතියක් විතරයි හැමතැනම. කෙනෙක් නෑ. ආත්මයක් නෑ. ආත්මය හම්බ වෙන්නෙ නෑ. **විදර්ශනා සමාධියේ තියෙන විශේෂය තමයි මේ ආත්ම දෘෂ්ටිය බිඳ වැටෙන එක. 'සක්කාය දිට්ඨිය' ප්‍රහීන වෙනවා.**

**සක්කාය දිට්ඨිය ප්‍රහීන වුණාම මොකද වෙන්නෙ ඍද්ධිමය ස්වභාවයකින් යන්නෙ සක්මන. කෙනෙක් නැහැ.** ඇයි සක්කාය දිට්ඨිය නැහැ නේ, 'විචිකිච්ඡාව' මොකක්වත් මේ කතාවේ නෑ මේක ප්‍රායෝගිකව අත් දකින කොට. මේකෙ සම්පූර්ණයෙන්ම පරාවර්තන කතාවක් නෑ. තුන් සංයෝජනයම ප්‍රහීනයි. සක්මන තුළම කෙළින්ම ඉන්නෙ ඍද්ධියෙන්. මේකෙ කෙළින්ම බැස ගන්නෙ නෑ, මොකුත් බැස ගන්න දෙයක්, කතාවක් කරන්න විදියක් නෑ. මේකෙ තනිකරම 'ඕභාසය' මෙතන අත්දකින්න ලැබෙනව මිදුණු ස්වභාවය සක්මනේ තියෙනව, සක්මනේ ඕභාසය හොඳින් අත්දකින්න තියෙනව. ඒ නිසා තමයි අපි

පොළොන්නරුව ගියත්, අනුරාධපුරේ ගියත්, සිතුල්පව්ව ගියත් කොහේ ගියත් සක්මන් මළු බලන්නෙ. ආශ්චර්යයි, අද්භූතයි, මෙච්චර සක්මන් මළු හැදුවෙ ඇයිද කියල හිතෙනව.

ඒ කාලෙ ලෙන් කුටි නේ තිබිල තියෙන්නෙ. ඒකත් ස්වභාව දහමට සමීපයි. ලෙන් කුටියක් කොතැනද සක්මන් මළුවත් එතන. පුදුම හිතෙනවා. ඒක හොඳටම තේරෙනවා. මෙතන දවසම සක්මන් කරන්නත් බැහැනේ. ඔන්න වාඩි වෙනව. ඒත් ඉන්නෙ සෘද්ධියෙන් ඊට පස්සෙ. මිහින්තලේ ලෙන් කුටි තියනව වෙනමම ඈත්වෙහෙර පැත්තෙන් තියෙනව පොඩි කඳු ගැටයක්. ඒකෙන් බහින්න තියෙනව කළුදිය පොකුණ පැත්තට එතන තියෙනව ගල්ලෙන් ගොඩාක්. එතන හුළං කපොල්ල කියල ගල්ලෙනක් තියෙනව. ඒකෙ ගහල නෑ එහෙම. නමුත් ඒකෙ මැද්දෙ වාඩි වුණාම එක පැත්තකින් හුළං එනව. පඨවි සංඥාවට ගොඩක් වටිනව මේ ලෙන. මේ ලෙනේ තමයි අපි උදෑසන හිරු එළිය වැටෙන මොහොතට ඔතනට එනවා. ඔය කුටියට ඇවිල්ල ඔතන වාඩිවෙනවා. වාඩි වුණාම ලෙනේ එක පැත්තකින් හුළං එනවා. අනිත් පැත්තෙන් හුළං පිටවෙන්නෙ. මිහින්තලේ කන්ද උඩ ලෙනේ කථාව මේ කියන්නෙ.

මේකෙ පුදුමාකාර පඨවි සංඥාවක් අත් දකින්න ලැබෙනව. හුළං වැදිල යනව එනව. **පඨවි සංඥාව කියන්නෙ මේ හුළං වදින එක පුදුමාකාර විදියට සෘද්ධිමය ස්වභාවයක් එනව. කෙනෙක් පුද්ගලයෙක් නෑ අර වදින සංඥාව නිරුද්ධ වන සංඥාව එච්චරයි. සත්ව පුද්ගල කථාවක් නෑ.** මේවා අපි දකින්නෙ. අපි උදේ පාන්දර හිරු එළිය නැග එන වෙලාවට මිහින්තලේ කන්දට මෙහා පැත්තෙන් ඈත්වෙහෙර අස්සෙන් එන්නෙ. කඳු මුදුන අස්සෙන් හිරු එළිය යන්තම් නැග එන කොට එතන ඇවිල්ල වාඩි වෙලා ඉන්නව. හුළං එනව මෙහෙන් යනව. ඇත්තටම පුදුමාකාරයි 60 දහසක් රහතන් වහන්සේලා වැඩ සිටි භූමියේ අදත් අපිත් ඒ ලෙසම වැඩ සිටිනවා. අපිට එහෙම දැනෙනව ඒ සෘද්ධිමය ස්වභාවය ඒ විදියටම අත් දකිනවා. ඊට මෙහා වැලි මලුව වගේ තියෙනව. එතන පුළුවන් වැලිමලුවෙ සක්මන් කරන්න. නමුත් අපි උදේ පාන්දර එතනට එන්නෙ නම් අර සුළං කපොල්ලෙ අර ලෙනේ ඒ අත්දැකීම ලබන්න.

මේවා හැමෝටම වටිනාකම් තේරෙන්නෙ නැහැනේ. මේ රටේ මිණිමුතු තියෙන්නෙ කොහේද, මේ රටේ මිණි මුතු තියෙන්නෙ යන්න ඕන මෙන්න මේ ලෙනකට. ඊකටත් හැමෝටම භාග්‍යයක් නැහැනේ. පාන්දර 4.00ට විතර ටෝච් එකක් අරගෙන ඔතනට එන්නත් එපැයි. ඊකටත් යම්කිසි උත්සාහයක් වීර්යක් තියෙන්නෙ එපායැ. ඔතනට එන්නත්.

ඒ වෙලාවට ඇවිල්ලත් එතන වාඩිවෙන්න බයක් සැකක් තියෙන කෙනෙකුට බැහැනේ. බයක් සැකක් තියෙන කෙනෙක් ඔතනට එන්නෙ නෑ. ඒ සතුනට බය නැති කමක් තියෙන්න ඕන. සත්තු ගැන හොඳ අවබෝධයක් තියෙන්න ඕන. මේ යුගය ඒ යුගය නෙවෙයි නේ මේ යුගය වල්බිහි වෙලා නේ. නමුත් අපි ඒ යුගයේ දී ගියා නේ. අපි ගිහිල්ල මල් පූජා කර කර ඉන්නෙ නැහැනේ. අපි යන්නෙ කර්මස්ථානයට. කර්මය ක්ෂය කරන්න. අපිට ඕනෙ ඊක. හිරු නැගෙනහිර පැත්තට තමයි ලෙන් දොරේ කට තියෙන්නෙ. එතන වාඩි වුණාම ප්‍රපාතය වගේ පල්ලෙහා. එතන වාඩි වුණාම හොඳට හිරු එළිය එනව. එක පැත්තකින් හුළං වේගෙන් එනව. හුළං ගලාගෙන මේ පැත්තෙන් පිටවෙනව. මේ වගේ අත්දැකීම් ගොඩාක් අපට තියෙනවා.

මේක පුදුම භූමියක්. මම හිතන්නෙ නෑ ලෝකයේ කොහේවත් මේ වගේ භූමියක් හමුවෙයි කියල යෝගාවචරයෙකුට. අපි හිටපු තැන් බලන කොට, කවුරුවත් කැමති වෙන්නෙ නැහැනේ එළිවෙනකම් දිඹුලාගල ගල උඩ ඉන්න. මේ මිනිසුන්ට ඊක දැනෙන්නෙ නැහැනේ. ඊක ලේසි නෑ. ඒ කියන්නෙ සත්ව පුද්ගලයෙකුට ලේසි නෑ. සත්ව ස්වභාවයෙන් අයිනට වෙලා හිතේ ස්වභාවයක් තියෙනව නේ සත්ව ස්වභාවය සිතුවිලි වැඩ කරන ස්වභාවය. ඒ කියන්නේ ඊකෙන් අයිනට වෙන්න ඕන. මේ සිත අභිබවා ගෙන යන්න ඕන. ඥානයට අවධි වන්න ඕන. ඒ ඥානයම තමන් හැම තිස්සෙම ප්‍රකට කර ගන්න ඕන ඥානයමයි. ඥානයට බලගන්වා ගන්න ඕන. ඒ සිහියට ඥානයට හසුවෙච්ච දවසක් දෙකක්, තුනක් මාසයක් අවුරුද්දක් ගත කරන්න ඒ සිතිවිලිවලට කවදාවත් තැනක් හම්බවන්නෙ නෑ. ඔබව කවදාවත් ආයේ සිතුවිලි ලෝකයට ගන්න බෑ. ඔබ යන්නෙ ඥානයටමයි. ඔබ පරිවර්තනය වෙනව පුදුමාකාර විදියට.

'**ලහු පරිවර්ථන**', අන්න වචනය, ලහු පරිවර්ථනයට එනව ආයෙ ගන්න බෑ පෘථග්ජන භූමියට. කිසි දවසක පෘථග්ජනයෙක් කරන්නබෑ. ඥානයට අවධි වෙනව. ඒ 'ධම්ම අභිඤ්ඤා' සකස් කර ගන්න.

කොයිතරම් නම් කැප කිරීම් කරන්න ඕනද? "අභිඤ්ඤා ඥානයට හසුව පරම සත්‍ය" කියලා දේශනා දාන කොට මේවත් අවඥාවට ලක් කරා සමහර අය. ඒ අභිඤ්ඤා නේ කියල කියනවා. මේවා ලේසි නෑ. සිතුවිලිවලට ගන්න බැරි බොහෝ දේ අභිඤ්ඤා ඥානයට හසුවෙනව. අති සියුම්. ඒ ඥානයට අවධි වන්න ඕන. එදිනෙදා කටයුතු සියල්ලම ඥානයෙන් කරන්න ඕන. කවුරුහරි මොකක් හරි කියනව. ඔය කියන ඒව වැඩක් නෑ. අපි කියනව දැනෙන එක පොඩ්ඩක් බලන්න මෙහෙණින් වහන්ස. ඔය දැනෙන්නෙ කියන එක නෙවෙයි නේ. ඥානයට අවධි වෙලා ඉන්නෙ.

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. ඔබ වහන්සේ විශාල දහම් පර්යායක් දේශනා කරනවනේ. මේ ඔක්කොම දකින්න තියෙන්නෙ එක් ක්ෂණික සිතට නේ. සියල්ල අවබෝධ වන්නෙ. එතකොට ආර්යයන් වහන්ස දැනෙන තැනම තමයි මේක දකින්න තියෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** දකින්න නෙමෙයි හැබැයි මේ දෙන පණිවුඩය දැනෙනව මෙහෙණින් වහන්සේට. මෙහෙණින් වහන්සේට දැනෙනව මේ කියන කතාව. මේ ආර්යයන් වහන්සේ දෙන සිග්නල් එක අසුවනව මෙහෙණින් වහන්සේට. මේ කියන්නෙ සිතුවිලි නෙවෙයි තනිකරම ඥානයට එන්නෙ. **"ඤායස්ස අධිගමාය" කියන තැන ආර්යයන් වහන්සේ වැඩ සිටිනවා කාටවත් පේන්නෙනෑ. ආර්යයන් වහන්සේ අවධි වෙලා තියෙනව ඥානයට. ඒ ඥානයෙන් ආර්යයන් වහන්සේ ධර්මය දේශනා කරනවා. ඒක කුඩු කරන්න කිසිකෙනෙකුට බෑ. සත්ව පුද්ගලයෙකුට බෑ.** ඥානයෙන් ආර්යයන් වහන්සේ ධර්මය දේශනා කරනවා. ධම්ම අභිඤ්ඤාවෙන් ධර්මය දේශනා කරනවා. මේ සූත්‍රවල තියෙන ඒවා මතු කරල පෙන්වනවා. මොකක්ද 'ඕභාසය' කියන්නෙ. මොකක්ද ඡේමක භික්ෂූන් වහන්සේ කියන්නෙ. මේ දෙකම එකබව පෙන්වනවා. කිසි කෙනෙකුට මේක 'ටැලි' කරන්න ලේසි නෑ.

මොකද මේ වචන කීපයක් මේ දෙකේ හසුරුවන්නෙ. මේ වචන ඒ වචන නෙවෙයි. හැබැයි එකම සංඥාවක් කියල ආර්යයන් වහන්සේ කියනව. මේ එකම කතාවයි කියන්නෙ කියල. මේ ඔක්කොටම වැඩිය වෙනස් 'මාලුඛ්‍යපුත්‍ර' සූත්‍රයට ගියහම. එතනත් තියනව කතාවක්. හැබැයි මේ එක වචනයක්වත් නෑ එතන. බලන කොට. එතන තියෙන්නෙ වෙනින්ම විදියකට. ඒ කතා කරන විදියේ වචන නෙවෙයි මෙතන තියෙන්නෙ. 'ඛේමක' සූත්‍රය තුළ. 'ඛේමක' සූත්‍රයේ ඒත් කියන්නෙ ඒ කතාවමයි. එතනදි කියන්නෙ පංචඋපාදානස්කන්ධය ආත්ම වශයෙන් නොගනී. අන්න එතන කියන්නෙ එහෙම. දැන් උපක්ලේෂ සූත්‍රයට ගියහම කියන්නෙ රූප දර්ශනයෙන් මිදුණා කියන කතාව. මෙතන තියෙන්නෙ පංච උපාදානස්කන්ධය ආත්ම වශයෙන් නොගනී කියල. මේ එකම කතාව කියල කාටද තේරෙන්නෙ.

රූප දර්ශනයෙන් බැස නොගනී කිව්වත් එකයි, පංච උපාදානස්කන්ධය ආත්ම වශයෙන් නොගනී කිව්වත් එකයි. මේව ගළපග න්න බැරිව නිවන් දකින්නේ කොහොමද? ප්‍රායෝගික වුණොත් විතරයි මේක තේරෙන්නෙ. මේ එකම අරමුණේ එකම කතාව මේ කියන්නෙ මිදෙන හැටි. වෙන කතාවක් නැහැනේ. අරමුණේ මිදෙන හැටි නේ කියන්නෙ. අර ඕභාසය මතුවන හැටි කියනව. ඒ කියන්නෙ **රූප දර්ශනය කියන්නෙ ආයතනවලට ආයතන කියන්නෙ පංච උපාදානස්කන්ධය ආරම්මණය.**

අපි කියනව නේ "ආතාපි සම්පජානෝ සතිමා" කියලා. 'ආතාපි' කියන්නෙ කෙලෙස් තවන වැර ඇතිව "සම්පජානෝ සතිමා" කියන්නෙ සිහිය තියෙන්න ඕන. සතිමා කියන්නෙ මොකක්ද? මේ සිහිය. මේ සම්මා ඥාන දර්ශනයෙන් උපදින සම්මා සතියට එන්න ඕන. "අතාපි සම්පජානෝ සතිමා" කියන එක ලෞකික සමාධිවලත් තියෙනව. ඒක උපක්ලේෂ සූත්‍රවලදී බුදුන් වහන්සේ පෙන්වනව ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා කියල විදර්ශනා සමාධිවලත්. "ආතාපි සම්පජානො සතිමා" දෙකේම තියෙනව. **බොජ්ජංග සූත්‍රවල තියෙනව බොජ්ජංග ද්වයං වදාමි" කියල සප්ත බොජ්ජංග බොජ්ජංග 14ක් විදියට.**

කාටද මේව හසුවෙලා තියෙන්නෙ නේද? කොහොමද මේව අල්ල ගන්නෙ? තේරුම් අරගන්න ඕන. ප්‍රායෝගික වන්නත් ඕන. ලෞකික භූමියේ

සමථය වඩන කොටත් ඒ වචනම තමයි බුදුන් වහන්සේ විදර්ශනාවෙදි පැහැදිලි කරන්නෙ. විදර්ශනාව වචන භාවිත කරනව පමණයි. ඒ වචන ටිකම ගන්නව පැහැදිලි කරන්න.

දැන් මේක අවබෝධයක් නැති අය මොකක් හරි දැක්ක ගමන්ම, ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියල, හිතන්නෙ ලෞකික සමාධියක් ගැන. ධර්මය දැක්කෙ නැත්නම් දැන් කොහේ හරි තිබුණොත් එහෙම විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියල, මේ කතා කරන්නෙ ලෞකික සමාධිය කියල හිතන්නේ. එයා කවදාවත් නිවන් දකින්නෙ නෑ. ඇයි ඒ? එයා විදර්ශනා සමාධි දන්නෙ නෑ. බුදුන් වහන්සේ කියන්නෙ විතක්ක විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා කියන්නෙ විදර්ශනා සමාධියෙත් මේකම තියෙනව කියන එක. ඒක දන්නෙ නැත්නම් මොකද වෙන්නෙ. කවදාවත් නිවන්මග හම්බ වන්නෙ නෑ. **අරමුණ බාහිර ඇත්ත වෙන කොට විතක්ක විචාර තියෙනවා. ඒකේ සත්‍ය දකින තැන විතක්ක විචාර සංසිඳෙනවා. එතකොට ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා අර විදියටම එනව.**

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. එන අරමුණ හටගෙන නිරුද්ධ වෙන කොට මේ කියන ස්වභාවය දැනිලත් ඉවරයි. නේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ ක්ෂණයෙම වෙලා ඉවරයි. ඒ කියන්නෙ දර්ශන ඥානය තියෙන කෙනා, අරමුණ ඒ මොහොතෙම දර්ශන ඥානය තියෙන කෙනාට ආත්ම වෙන්නේ නැහැ. දෙයක් වෙන්නේ නැහැ. එතනම ඒකෙ කම්පනය නැතිවෙනව. ඇත්තටම මේක වෙලා ඉවරයි. දර්ශන ඥානය තුළ ඒ සිද්ධ වෙන මට්ටම අනුව තමයි කෙනකෙනාට මේක සිද්ධ වෙන්නෙ. හොඳට දියුණුවක ඉන්න කෙනාට කෙලින්ම ඛණික සමාධියට ඇවිල්ල ඉවරයි. ඒක දෙයක් වෙන්නෙම නැහැ. ආත්ම දෘෂ්ටිය බැස ගන්නේ නැහැ. ආත්ම සංඥාව එන්නෙත් නැහැ හරියටම ධර්මය ප්‍රත්‍යක්ෂ වෙලා තියෙනව නම්. ආත්ම සංඥාව දුරුවෙනවා කියන එක, එක මොහොතින් හිතල කරන්න පුළුවන් එකක් නෙවෙයි. ඒක මේ process එකේම අවසාන උත්තරය. **ඒ කියන්නෙ මේ සිස්ටම් එක අවබෝධ කිරීමේ න්‍යාය ඇතුළෙ තියෙන අවසාන උත්තරය. අරහත්වය තුළ ආත්ම සංඥාව නොදැනෙන ස්වභාවයට එන්නෙ. ඒක ලේසි නෑ.**

**මෙහෙණින් වහන්සඃ** අවසරයි ආර්යයන් වහන්ස. හොඳ පැහැදිලි කිරීමක් කරා. අවසාන ලේයර් එක පෙන්නුව තැන. එතනදි ආර්යයන් වහන්ස ආත්ම සංඥාවයි, ආත්ම දෘෂ්ටියයි. ඔබ වහන්සේ හොඳට පැහැදිලි කළානෙ එතන. මහ මුහුදෙ තියෙන ඔරුවක වතුර **වැහුව නැත්නම්, වතුර වහන තැන ආත්ම දෘෂ්ටිය බිඳෙන තැන. ඊට පස්සෙ තියෙන්නෙ ඔරුවට ආපු වතුර ටික හිඳින්න විතර නේ.** ආර්යයන් වහන්ස. එතකොට දැනෙන කම්පනය ආසවක්ඛය ඥානයට නේ අහුවන්නෙ ආර්යයන් වහන්ස. ක්‍රියා සිත දකින තැන කෙනා ඉන්නව කියන තැන.

**ආර්යයන් වහන්සේඃ** ප්‍රශ්න අහන විදියට තමයි නේද පැහැදිලි වෙන්නෙ.

**මෙහෙණින් වහන්සේඃ** එහෙමයි. ඔබ වහන්සේ එතන පැහැදිලි කළා. තියෙන ගැටලු ඔක්කොම කුඩුවෙලා යනව වගේ දැනෙනව ඒ පැහැදිලි කිරීමත් එක්ක. ඒ කියන්නෙ සිදුර වහන තැන ආත්ම දෘෂ්ටිය බිඳෙන හැටි. ඊට පස්සෙ වතුර ටික හිඳින්න තමයි ඊළඟට අපට ඉතුරු වෙලා තියෙන්නෙ.

**ආර්යයන් වහන්සේඃ** ඒ කියන්නෙ මේ **දර්ශන ඥානයෙන් තමයි ඔරුවෙ සිදුර වැහෙන්නෙ. ඔරුවෙ සිදුර වැහුණොත් තමයි වතුර ආයෙ පිරෙන්නෙ නැත්තෙ.** ඒ කියන්නෙ දර්ශන ඥානයෙන්ම තමයි, ආයෙත් කෙලෙස් හට නොගන්නෙ. **"සබ්බ පාපස්ස අකරණං" කියන තැනට එන්නෙ දර්ශන ඥානය. කෙලෙස් හට ගන්නෙ නෑ. එහෙම වුණොත් තමයි තියෙන කෙලෙස් ක්ෂය වෙන්නෙ. නැත්නම් තියෙන කෙලෙස් ක්ෂය වෙන්න කලින් ආයෙත් කෙලෙස් එකතු වෙනවා.** එතකොට මේකම තමයි පෙන්වන්නෙ ඒකම තමයි පැහැදිලි කරන්නෙ. ආත්ම සංඥාව ගිලිහෙන්න නම් නැවතත් ආත්ම සංඥාව සකස් නොවී තියෙන්න ඕන. ඇත්තටම සතර සම්‍යක් ප්‍රධාන වීර්යයත් ඔතනම තමයි තියෙන්නෙ.

"උප්පානං පාපකානං අකුසලානං ධම්මානං ප්‍රභාණාය" කියනව නේ. එතනත් ගත්තම නේ ඡන්දං ජනේති වායමතී, වීරියං චිත්තං පග්ගංහාති පජහති කියල. එතකොට **"උප්පානං කුසලානං ධම්මානං තිඨියා භීවෝභාව වේපුල්ලයාය භාවනා පරිපූරාය" කියන තැනනේ**

**විදර්ශනා භාවනාව ඔතනට නේ එන්න ඕන.** ඔය අවසාන තැනට නේ එන්න ඕන "ධීතියා" කියන තැන. ඒ කියන්නෙ උපන් කුසලය පවත්වා ගෙන යනහැටි. **කුසලය කියන්නෙ සිහියත් එක්ක මෙතන දෙයක් නැති බව, දිගටම ඒක දියවී ගෙන යන ස්වභාවයට පවත්වාගෙන යන්න එපැයි ඕභාසයට** ඒකනේ කුසලය කියන්නෙ. ඥාන සම්ප්‍රයුක්ත කුසලය නේ. වටිනවා නේද ඔරුවෙ සිදුර වහනවා කියන එක.

**මෙහෙණින් වහන්සේ:** එතනදි ආර්යයන් වහන්ස හොඳටම දැනෙනව නේ අරමුණේ බැස ගෙන නැත්නම් කෙලෙස් හට ගන්නෙ නැහැනේ එතන ඊට පස්සෙ දෙයක් කර ගත්ත දේවල් නිසා මතුවන කෙලෙස් ස්වභාවයන් තාම අභ්‍යන්තරයේ තියෙනව නේ. කම්පන ස්වභාවයන් එන්නෙ ඒ නිසා නේ. කම්පනයක් විතරයි දැනෙන්නෙ. එතකොට ආර්යයන් වහන්ස සිහිය නිතරම එතනටනේ අවදි වන්නෙ. එතකොට අරමුණ මිදිලද? අරමුණට මොකද වුණේ කියන තැන ආර්යයන් වහන්ස සිහියට අසුවෙලා ඉවර නේ. එතනදි ආර්යයන් වහන්ස අමුතුවෙන් කරන්න දෙයක් ඉතුරු වන්නෙ නැහැ නේද? දැනෙන ටික දැනගැනීමක් විතරයි නේද?

**ආර්යයන් වහන්සේ:** ඒක හරි. ඒක ඇත්ත.

(ඉහත දේශනාව, දේශනා 2 හා සම්බන්ධ වේ.)

# 02

# මම උපදින්නේ මැරෙන්නේ මේ මොහොතේ

**මෙහෙණින් වහන්සේ:** ඔරුවක වතුර සිඳිල ගියාම සම්පූර්ණ වතුර ටික වේලිලත් නෑ. සියුම්ව තියෙන ස්වභාවය වගේ. පස්සෙ කම්පනය වන්නෙ නැහැනේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔය වගේ දෙයක් තමයි 'ඛේමක' සූත්‍රයේ කියන්නෙ. රෙද්දක් සෝදන්න දෙනව නම් ඒ රෙද්දෙ ගඳ, සෝදන කුඩුවල සුවඳ එහෙම, **රෙද්දෙ ගඳක් තියෙනව කියනව රෙද්ද පිරිසිදු කළාට. ඒ රෙද්දෙ සෝදපු කුණුවල ගඳ. ඒ ගඳත් යන්න ඕනියි කියනව. අරක ඔය උපමාව තමයි දෙන්නෙ අවසානයේදී අර ආත්ම සංඥාව දියවෙන ස්වභාවය පෙන්වන්න. ඒක ගඳ විදියට පෙන්වනව.** 'ඛේමක' සූත්‍රයේ තව උපමාවක් දෙනව මලක සුවඳ පෙන්නල. මලක සුවඳ ඒ මල් පෙත්තෙන්ද එන්නෙ, රේණුවලින් ද එන්නෙ ඒක කියන්න බෑ කියනව. හැබැයි ඒ මලේ අවසානයේදී ඒ සුවඳත් නැති වෙන්න ඕන කියනව. ඒ සුවඳත් නැති වෙනව පෙන්වනව. සුවඳ නැති තැනක් කියන්න බැරි බවකුත් පෙන්වනව, ඒ කියන්නෙ ආත්ම සංඥාව ආරෝපණය වෙන්නෙ අප සාමාන්‍යයෙන් කියනව නේ චිත්තාරෝපණය මේක අභිසංකරණයක් තුළයි සකස් වන්නෙ කියල. ඒක වේගෙට සකස් වෙන එකක් බව අභිසංකරණය තුළ සකස් වෙනවයි කියන එකක්. මේ චිත්ත ආරෝපණය. ඒක නේ සංඥාව දියවී ගෙන යන ස්වභාවය පෙන්වන්නෙ. ඒක නේ ක්ෂය ධම්ම වය ධම්මං කියන්න ඕන නැහැනේ.

ගොඩක් අයට තියෙන ප්‍රශ්නයක් තමයි දැන් මේ ක්ෂණය මේ මොහොත විතරනේ මේ දර්ශනය දකිනව නේ. දර්ශනය දකින කොට

මේ මොහොතෙ මේ ක්ෂණය විතරයි නේ. ක්ෂණ සම්පත්තිය කියන්නෙ ඒකනේ.

"අතීතං නාපග්ගමෙය්‍යය - අප්පටි කංඛෙ අනාගතා
පච්චුප්පන්නාස යේ ධම්මා - තත්‍ර තත්‍ර විපස්සති"

කියන කොට මේ මොහොත විතරයි නේ. මේ මොහොතත් ඇත්ත නෙවෙයි නේ. එහෙම නේද? එතකොට තව ප්‍රශ්නයක් අහනව. මේ මොහොත විතරක් නම් ඔය කියන ක්ෂය ධම්මා කොහොමද වෙන්නෙ? කියන එක. එහෙනම් ඒක එන්නෙ කොහොමද කියල අහනව. ඒ කියන්නෙ මේක මේ මොහොතෙම තමයි සකස් වෙන්නේ. මේ මොහොත සකස් වන්නෙත් වේගයක් මතයි. ඒ කියන්නෙ පෝනෝභවිකා කියන ස්වභාවය තියෙනව මේකෙ. මේ මොහොතෙ භවය සකස් වන්නෙ. මේ මොහොතෙ තමයි බිත්තිය කියන එක එන්නෙ. මේ මොහොතෙමයි සකස් වෙන්නෙ. මේ මොහොතෙ සකස් වෙන්නත්, ඒකටත් හේතුවක් තියෙනව. මේකෙ තියෙනව මේ වේගය තුළ. අපට ඒක අල්ල ගන්න බැරි ස්වභාවයක්.

වේගය තුළ අල්ල ගන්න බැරි ස්වභාවයට, මේක දිගටම යන ස්වභාවයක් දැනෙනව. ඒක දැනෙන එකක් මිසක් ඒක මේ මොහොතෙ සිද්ධ වෙනව කියන එකත්, නොවෙනව කියන එකත් නෙවෙයි. මේ මොහොතෙ තමයි වෙන්නෙ. නමුත් අපිට ඒකෙ **වේගෙට අල්ල ගන්න බෑ ඒ තරම්ම ක්ෂණයෙන්ම සිද්ධ වෙනවා. ඒ නිසාම කලින් ඒවත් මේකට ගලා ගෙන එනවා. ඒක තමන්ට නවත්ත ගන්න බෑ. ඒකයි බඹරෙට උපමා කරන්නෙ සංඥා අභිසංස්කරණය කියල**. ඒක ප්‍රායෝගිකව ඒ මොහොතට සීමාකර ගන්න බෑ. ඒක කොහොමත් වේගෙට මේ මොහොත දකින කොටම පරණ ඒව මේ මොහොතෙ වෙලා ඉවරයි.

ඒක ඉන්ද්‍රිය ගෝචර නෑ මේ මොහොතේ සාස්‍රවීය ස්වභාවය කොහොමද තියෙන්නෙ කියලා. මේ 'පෝනෝභවික' කියන ස්වභාවය "අජ්ජෝසාය තිට්ඨති" මේ මොහොතේ භවය, "යාරෑපේ නන්දි තදුපාදානංභවෝ" ඒක හරි. **මේ මොහොතේ මේ අරමුණේ සත්‍ය දකිනව. ඒකත් හරි. නමුත් අපට නොපෙනෙන මායිමේ තියෙනව අරෑපයක්. ආත්ම සංඥාවක්.** ඒ අරෑපය තමයි මේකේ දෙයක් වගේ

දැනෙන ගතිය දිගටම දුවන්න. දිගටම දුවනව පේන්නෙ නෑ. මෙතනත් තියෙනව. ඊළඟ එකෙත් තියෙනව. ඊළඟ එක ඉවර වෙන්නත් කලින් මේකත් ඇවිල්ල ඉවරයි. අධික වේගය නිසා ඒක අපට අල්ල ගන්න බෑ. ඒක කෙනෙක් පුද්ගලයෙක්ට අල්ල ගන්න බෑ. මේක සිස්ටම් එකක් නේ වෙන්නෙ. සිස්ටම් එකෙන්ම දිගටම ගිනිබෝලය කරකවන කොට වලල්ල වගේ ගිනිබෝලය සොයන්න බෑ වගේ.

ප්‍රායෝගිකව මේක දකිනඑක විතරයි වෙන්නෙ. "සංඛිත්තේ නිබ්බිදාය" කියන්නෙ අවබෝධ කරනව මේක වෙනහැටි. එහෙම නැතුව මේක කිසි කෙනෙකුට මස් ඇසින් දකින්න බැහැ. මේ සිස්ටම් එක මස් ඇසින් දකින්න බැහැ. නුවණට මේ සිස්ටම් එක හසුවෙනවා මේක මොකක්ද වෙන්නෙ කියන එක." ඇයි මේක දිගටම දුවන්නෙ කියන එක. මේකෙ තේරුම මේ මොහොතෙ දෙයක් වෙන්න නෑ කියන එක නෙවෙයි. මේ මොහොතෙ තමයි මේක වෙන්නෙ. හැබැයි වේගය තුළ ඒක දැනෙන්නෙ නෑ. වේගයට හසුවෙලා තියෙන්නෙ. ඒකයි මේක අභිසංකරණයක් කියන්නෙ. බඹරයක් කියල කියන්නෙ. මේ සිත බඹරයකට උපමා කරන්නෙ. මේ සිත සංඥා අභිසංකරණයකට උපමා කරන්නෙ. වේගෙට උපමා කරන්නෙ. සිත කියල දෙයක් නෑ කිව්වෙ ඒකයි. **සිත කියන්නෙ වේගයක්. අපි කැරකෙනව කියල හිතමු එක තැන. වේගයෙන් කැරකෙන කොට අපිට හිතා ගන්න බැහැ නේ කොයි පැත්තෙද ඉන්නෙ කියල දැන් බලාගෙන** තේරෙනවද කියන කතාව.

ඔබ වේගයෙන් කැරකෙන කොට ඔබ කොයි පැත්තද බලාගෙන ඉන්නෙ කියල කවුරුහරි ඇහුවොත් කොහොමද කියන්නෙ. කියන්න බෑ. අන්න ඒ වගේ මේක වේගෙයකට හසුවන්නෙ. ඒකයි සිතේ උපමාවට දෙන්නෙ ගඟ ගලනවා, වැස්ස වහිනවා. වාතයෝ හමනවා. සිත කියන්නෙ ප්‍රවාහයක් වේගයක්, **සිතුවිලි ගලන වේගයකටයි සිත කියන්නෙ.** සිත කියල එහෙම තියෙන එකක් නෑ කොහේවත්, තියෙනව කියල ගත්තොත් මිථ්‍යා දෘෂ්ටියක්. දැන් ස්පාක් වෙන වේගෙට නේ සද්දයක් වුණත් එන්නෙ. ස්පාක් වෙන වේගෙට නේ වර්ණයක් එන්නෙ. තියෙන එකක් නෑ කොහේවත්. ඒකයි ඨිථත්ථ අඤ්ඤතත්ථං පඤ්ඤායතී" 'ඨිතියක්' නෑ කියල කිව්වෙ. මේක මහ පුදුම කතාවක් නේ, මේක දකින්න ඕන. මේ

සිත දකින එක තමයි විචිත්‍රවත්ව සිද්ධිය කියල බුදුහාමුදුරුවො දේශනා කරන්නෙ ඒකයි. මේක මහා වටිනා කතාවක් නේද? ඔන්න ඔය ස්වභාවය තමයි සාසවීය ස්වභාවයට හේතුව. ඔය ස්වභාවයම තමයි අවසානයේ ආශ්‍රව කෙලෙස් ක්ෂය වෙන ස්වභාවය, ටික ටික වෙන්න හේතුව. ඒකයි සංඛත ධම්ම ක්ෂය ධම්ම වය ධම්මා කියන්නෙ. ඒක වේගයක් තුළ තියෙන එකක්. මේක වේගයක් තුළ සිද්ධියක්. ඒක දෙයක් වගේ දකින සිතුවිලි ස්වභාවය තියෙන පිළිවෙළ තමයි, ඒක දෙයක් වගේ දකින එක. හැබැයි ඒක දෙයක් වගේ එකක් නෑ. ඔන්න ඕකයි කතාව චිත්ත ස්වභාවය.

මුල් දේශනාවල යනව නේ සිත කියල දෙයක් නෑ කියල. සිත කියල දෙයක් නෑ කියන්න හේතුව දිට්ඨි සංයුක්තය. 'දිට්ඨි සංයුක්තය' බැලුවම තේරෙනව මේක වේගයක්. දිට්ඨි සංයුක්තය පටන් ගන්නෙ වාත සූත්‍රයෙන්. වාත සූත්‍රයේදී බුදුන් වහන්සේ වාතයෝ නොහමති කියල. කවුරුහරි සුළං කියල දෙයක් තියෙනව කියල ගත්තොත් ඒක මිථ්‍යා දෘෂ්ටියක් කියලයි කියන්නෙ. සුළඟ කියල දෙයක් නෑ. ගලන වේගයටයි සුළඟ කියන්නෙ. සිත කියල දේකුත් නෑ. ප්‍රවාහයකටයි සිත කියන්නෙ. වේගයකටයි සිත කියන්නෙ. එතකොට සාසවීය ස්වභාවය එහෙම නැත්නම් ඔය ආත්ම සංඥාව වේගයක් තුළයි තියෙන්නෙ. ඒකයි ක්ෂය ධම්මා වය ධම්මා කියන්නෙ. සිත අවබෝධ කරන කොට තමයි මේක තේරෙන්නෙ. මොකක්ද මේ සාසවීය ස්වභාවය. මොකක්ද මේ ආශ්‍රව කෙලෙස්. මොකක්ද මේ ආත්ම සංඥාව. ආත්ම සංඥාව කියන්නෙ 'ඉත්ථ සංඥාව' තියෙනව වගේ දැනෙන සංඥාවක්, ඕකයි දුරු වෙන්නෙ.

තියෙනව වගේ දැනෙන සංඥාවක බැස ගෙන අපි තියෙන ලෝකෙක ඉන්නව වගේ දැනෙන සංඥාවක ඉන්නව. තියෙන ලෝකෙක ඉන්නව කියන්නේ මම ඉන්නව කියන සංඥාව. ඕක තමයි ඉත්ථ සංඥාව. ඉත්ථ සංඥාව තමයි අනිත්‍ය සංඥාව කියල අවබෝධය තුළයි, ඉත්ථ සංඥාව දුරු වෙලා එන්නෙ අනිත්‍ය සංඥාව, අනිත්‍යය සංඥාව කියල හිතන එකක් නෙවෙයි. **ඉත්ථ සංඥාව දුරු වෙනකම් අනිත්‍ය සංඥාව මතුවන්නෙ නෑ.** ඉත්ථ සංඥාව තමයි දිගටම තියෙන්නෙ. ඒකට හේතුව පෘථග්ජන ස්වභාවයෙන් තමයි මේකට එන්නෙ ආර්ය භූමියට. එතකොට

ආර්ය භූමියට පෘථග්ජන ස්වභාවයෙන් එනව කියන්නෙ පෘථග්ජන ස්වභාවය ඉත්ථ සංඥාව අරගෙනයි එන්නේ එතකොට ඉත්ථ සංඥාව නැතිවෙනකම් අනිත්‍ය සංඥාව කාටවත් නෑ. අනිත්‍ය කියල හිතන එක නෙවෙයි අනිත්‍ය සංඥාව කියන්නෙ. **ඉත්ථ සංඥාව දුරු වෙන එකයි අනිත්‍ය සංඥාව.** ඒ දෙකක් කතා ධර්මය බොරු කරන්න බෑ. ධර්මය හරි තැනින් ඇල්ලුවෙ නැත්නම් සර්පයාගේ වලිගයෙන් ඇල්ලුවා වගේ. **අනිත්‍ය සංඥාව මෙනෙහි කරන එකක් නෙවෙයි මේකෙ තියෙන්නෙ. ඉත්ථ සංඥාව දුරු වෙනව ධර්මය දකින කොට, ඉත්ථ සංඥාව දුරු වෙන එකයි අනිත්‍ය සංඥාව කියන්නෙ.**

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. ඒ ඉත්ථ සංඥාව දුරුවුණ අරමුණුවලින් නේද අභ්‍යන්තරයේ කිසිම පසුතැවීමක් නැතිව අරමුණු ඔහේ ගලාගෙන යන්නෙ?

**ආර්යයන් වහන්සේ:** එතනයි 'ඕභාසය' ප්‍රකට වෙන තැන. ඒ ස්වභාවය ඊට පස්සේ සම්මුතිය තුළ එදිනෙදා වැඩකරනකොට ප්‍රසාද මට්ටමක් විතරයි නේ තියෙන්නෙ. කතා කරන, වැඩ කරන හැම තැනකම. සෙන්ස් ටිකක් විතරයි නේ. එතකොට එතන ඒ සාමාන්‍යයෙන් රූප දර්ශන ස්වභාවය නේ. රූප දර්ශනය දෙයක් වන්නේ නැහැ ඕභාසය මතුවන ස්වභාවය තුළ. රූප දර්ශනය මතුවන ස්වභාවය තුළ ඕභාසෙත් නෑ. ඕභාසය කියන්නෙ සමාධිමත් ස්වභාවයයි. ඕභාසය කියන්නෙ දෙයක් වගේ දැනෙන ස්වභාවයෙන් මිදුණ ස්වභාවය. ඒක තමයි අවධිමත් ස්වභාවය කියන්නෙ.

**මෙහෙණින් වහන්සේ:** ඒ කියන්නේ ආර්යයන් වහන්ස නොපෙනෙන සත්‍ය කියන සාකච්ඡාවෙන් තමයි ගොඩක් සියුම් විදියට හොඳටම ලිහිල පේන්න ගත්තෙ. බැස ගත්තේ නැති එකත් බැස ගත්තා කියන තැන හිටියේ. ඔබ වහන්සේගේ දෙපා නමදිනව ආර්යයන් වහන්ස. මෙන්න මේ සියුම් තැන දකින්න, එදා ඒ පටලැවුණ පටලැවිල්ල අද නෑ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ ගැඹුරු තැන් ටික ටික ඕන මේක සුද්ධ කරන්න. මේක පත්තියම් වෙන්න ඕන. ඉස්සෙල්ල පත්තියම් වෙන්න ඕන මේ ඉත්ථ ස්වභාවය. **රූප දර්ශන ස්වභාවයෙන් මිදුණ ඕභාසයට තමයි**

**කියන්නෙ, මිදුණ ස්වභාවය අත්දකිනව කියල. සක්මන් කරන කොට එහෙම ඒ කමටහන වැදගත්. ඒ තද ගතියට ආත්මයක් නැති බව තමන් මෙනෙහි කරන්න ඕන. සුළඟ වදින කොට එතනත් ආත්මයක් නැති බව මෙනෙහි වන්න ඕන. ඒ ඕභාසය හඳුනා ගන්න ඕන. ඒ ඕභාසය බලගන්වා ගන්න ඕන. ප්‍රකට වෙන්න ඕන. ප්‍රකට වුණා නම් ඒක නැති වෙන්නෙ නෑ.** අන්න එතනට එන්න ඕන. ඒකට මාසයක් දෙකක් යන්නත් පුළුවන්. ඒක හිතනවට වැඩිය ප්‍රායෝගික වීම තුළයි තියෙන්නෙ. කෘත්‍ය ඥානය තුළයි තියෙන්නෙ. අරහත්වයට පත්වෙන අන්තිම තැනට තමයි ඔය කතාව කියන්නෙ. හැබැයි මෙතනට එනව නම් මෙන්න මේ ටික හොඳට දැනගෙන එන්න. මේකෙ රහසක් තියෙනව කියන්න.

අපි ඔය බැස ගන්නව කියනව නේද? දැන් මේකට බැසගෙන, මේකට බැසගෙන කියලා. අපි ලේයර්ස් 5ක් පෙන්නුව නේ. බාහිර කියන අන්තයෙත් බැස ගන්නව සිත කියන අන්තයෙත් බැස ගන්නව මිදුණ ස්වභාවයෙන් බැස ගන්නව ඔහොම කිව්වනේ. අපි කිව්වා නේ දුක නොවන දුක, සතුට නොවන සතුට ඒවා කිව්ව නේ. ආයතනවල මොකුත් බැස ගත්තෙ නැති ස්වභාවයක් කියල කිව්ව නේ. **මේ කතාවේ නොපෙනෙන පැත්තක් තියෙනව. කියන්න ඕනෙ තැනක් තියෙනව. ඒ කියන්නෙ බැස ගන්නව කියල හිතන තාක් කල් බැස ගන්නව** මේ කතාවේ තේරුම. අපි හිතුවොත් මේකට බැසගෙනයි කියලා ඒකට බැස ගන්නව. දැන් කල්‍යාණ මිත්‍රයාගේ පණිවුඩය තුළ බැස ගන්න තැනක් හම්බවන්නෙනෑ. හොඳට බලන්න. ඔය ලේයර්ස් ටික බැලුවහම. ඔය ලේයර්ස් ටික බැලුවම කොතනද බැසගන්න තැනක් තියෙන්නෙ. දුකටත් බැසගෙන නෑ. සතුටටත් බැසගෙන නෑ. සිතුවිලිවලට බැස ගෙනත් නෑ. කොහේද බැසගෙන තියෙන්නෙ.

ඇත්තටම කිව්වොත් මේකෙ බැස ගන්නව කියල හිතන එක මිසක්, බැස ගන්න එකක්නෑ. ගොඩක් අයට තේරෙන්නෙ නෑ මේ කතාව. **හිතන නිසා බැස ගන්නව මිසක් ඇත්තටම බැස ගන්නව නෙවෙයි. මම ඉන්නව කියල හිතන නිසා දෘෂ්ටිය නිසයි බැස ගන්නෙ.** හැබැයි ඒ දෘෂ්ටිය නැත්නම් බැස ගන්න තැනකුත් නෑ. **'සක්කාය දිට්ඨිය' ප්‍රහීන වෙනව කියන්නෙ බැස ගන්න තැනක් නැතිවෙනව කියන එකයි.** හිතනව නම් මේ දුක මේ බැසගෙන, මේ සතුට මේක බැසගෙන. **දැන් බැස ගත්ත**

**තැන් සොයනව කියන්නෙ කවුරුහරි දහම හරියට පිරිසිදු කරගෙන නෑ.** ආර්යයන් වහන්සේ නොකියපු රහස ඒකයි. ඒක් කිව්වෙ නැත්තෙ, ඒක කිව්වොත් එහෙම මේ කතාව අරමුණු දකින්න ඒ අයට ගළපා ගන්න බැරිවෙන්න පුළුවන් කියල.

ඇත්තම කිව්වොත්, ඕකෙ ආර්යයන් වහන්සේ දිගටම අහගෙන ආව, කොතනද බැස ගන්නෙ කියල අහන්න හේතුවක් තියෙනවා. "පේර ගසට" බැස ගත්තද ඔය "පේර ගෙඩියට" බැස ගත්තද, බැස ගන්නව කියල හිතන තාක් කල් බැස ගන්නව. ඒ කියන්නෙ ආත්ම දෘෂ්ටිය තියෙන තාක් කල් කොහේ හරි බැස ගන්නව. ආත්ම දෘෂ්ටිය නැත්නම් බැස ගන්න තැනකුත් නෑ. ඕකෙ අවසාන උත්තරය තමයි බැස ගන්නව කියල හිතන තාක් කල් බැස ගන්නව කියන්නෙ ආත්ම දෘෂ්ටිය තියෙන තාක් කල් බැස ගන්නව ආත්මයක් නැත්නම් කොහේද බැස ගන්නේ? මොකටද බැස ගන්නේ. සිතුවිලිවල ද බැස ගන්නේ. මොන එකේද බැස ගන්නේ? අන්න එදාට තමයි ඇත්තටම ඕභාසය මතුවෙන්න ගන්නෙ. අන්න එදාට කිසිම තැනක බැස ගන්නෙ නැති ස්වභාවයක් අත්දකිනව. ඒ අත්දකින ස්වභාවය තුළ ඕභාසය මතුවෙනවා. ඕභාසය මතු වුණාට නැවතත් බැස ගන්න ස්වභාවය පුරුද්ද නිසා එනව. මේ බැස ගන්න ස්වභාවය පුරුද්දට එනව අනුසෝතයට පෘථග්ජන ස්වභාවයට. ඒ කියන්නෙ ආත්ම සංඥාව අනුසෝතයට කියන්නෙ.

**දෙයක් කියල ගත්ත සංඥාව, ඒක දිගටම බහුලීකතා වෙලා තියෙන්නෙ. අභිසංකරණයට ලක්වෙලා තියෙන්නෙ. ඒ නිසා ඒක පුරුද්දට එනවා. හැබැයි ඒ පුරුද්දට එන බවත් තමන්ට අවබෝධයක් තියෙන්න ඕන. එතකොට ඒකත් බැස ගන්නෙ නැති ස්වභාවය අන්න එදාටයි එන්නෙ.** හරි ගැඹුරුයි. ප්‍රායෝගිකව අත්දකින්නයි ඕන. අත්දකින කොටයි මේක තේරෙන්නෙ. මේක බැස ගන්නෙ කොහොමද කියන එක.

**මෙහෙණින් වහන්සේ:** අවසරයි ආර්යයන් වහන්ස. අර සෙන්සර් එකක් විතරයි කියල දැනෙන තැනේදි මේක ගොඩාක්ම ලිහිල යනව නේද? ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔව්. එකින් එක එකින් එක එන්න ඕන. මේ කතාවේ සෙන්සස් විතරක් දකින තැනින් තමයි පටන් ගන්නෙ. එතනින් තමයි අරහත්ත සමාධියට එන්නෙ අනාගාමී භූමියෙන් පස්සෙ ඒක තමයි මේ කියන්නෙ. මේ තනිකරම කියන්නෙ අරහත්ත සමාධියට එන හැටි. ඕක ලේසිනෑ. ඔය කිච්චත් බැස ගන්න තැන් තියෙයි. ඒ නිසා සිහියෙන් ඉන්න ඕන.

**මෙහෙණින් වහන්සේ:** ආර්යයන් වහන්ස සතියට අහුවෙන විදියට මෙන්න මෙතනින් තමයි මේක ලිහෙන්න කියන එකත් දැනෙනව ආර්යයන් වහන්ස. ප්‍රායෝගිකවීම තුළ තමන්ට දැනෙන ස්වභාවයන් තියෙනව නේ. එතනදි දැනෙනව මේ 'සෙන්සර්' එක විතරයි කියන දැනීමක් එනව. දැකීම දැකීමක් විතරයි. එතනින්මයි මේක ලිහිල යන්න කියන එක තේරෙනවා.

**ආර්යයන් වහන්සේ:** දැන් මෙහෙම දෙයක් තියෙනවා. ඔය සිතුවිලිවලින් හිතනඑක නෙවෙයි මේ කතාව. අභ්‍යන්තරයට හසුවන්න ඕන. අභ්‍යන්තර පරිවර්තනයකට ලක්වෙන්න ඕන. දැන් ආර්යයන් වහන්සේ සමහර දේවල් කරනව කියනව. එතකොට අනිත් අයට ප්‍රශ්නයක් තියෙනව. මේ ආර්යයන් වහන්සේ බැසගෙන නැහැයි කියනව නේ. ඒ වුණාට ආර්යයන් වහන්සේ බැස ගෙනනේ. ආර්යයන්වහන්සේ මේ ධර්මය දන්නව.දන්නහුටයි "ජානතෝ අහං භික්ඛවේ" කියන තැන ආර්යයන් වහන්සේ ඉන්නව. ආර්යයන් වහන්සේ දන්නව මේකෙ කිසිම තැනක් බැසගෙන නෑ කියලා ආර්යයන් වහන්සේගේ අවබෝධය තුළ බැසගැනීමක් අභ්‍යන්තරයට දැනෙන්නෙ නෑ. හැබැයි බලන් ඉන්න කෙනාට ඒක නෙවෙයි. දෙන්නෙක් එකට හිටියොත් සොයන්න බෑ. දෙන්නම සමානයි බාහිරින්. ඒ වුණාට අවබෝධය තියෙන කෙනයි අවබෝධය නැති කෙනයි අතර වෙනස ඕකයි. අති සියුම් කියන කතාව. එතනින් තමයි ආර්ය භූමියයි, පෘථග්ජන භූමියයි වෙන් වෙන්නෙ. ඔය දෙන්නම හැබැයි එතනමයි ඉන්නෙ. සමහරවිට දෙන්නම එක වගේ පේන්නේ.

බුදුන් වහන්සේ 'තුච්ඡ පෝට්ල' කියල සත් වතාවක්ම කියල ජේතවනාරාමයෙන් එලවනව. හැබැයි බුදුන් වහන්සේ බැස ගෙන

නැහැ. බුදුන් වහන්සේ මේ දර්ශනය හොඳින් දකින කෙනා. බුදුන් වහන්සේට කොහොමද එහෙම වෙන්නෙ. බුදුන් වහන්සේ දන්නව එකක්වත් බැස ගෙන නැහැ කියලා. **දැන් මේ පෘථග්ජන් ස්වභාවය මොකක්ද? එයාට තියෙන්නෙ රාග, ද්වේෂ, මෝහ ස්වභාවය. එයා හැමදේම ගන්නෙ බැස ගත්තයි කියල අරගෙන. දෙයක් කරගෙනයි ගන්නෙ.** ආර්ය භූමියේ ස්වභාවය මොකක්ද? ඔය එක තැනකවත් දෙයක් නැහැ කියල ආත්ම දෘෂ්ටිය නැතුව බලනව. **ආත්ම දෘෂ්ටිය නැතුව බැලුවොත් මොකද වෙන්නෙ? එහෙම දෙයක් හම්බ වෙන්නෙ නෑ.** බැස ගන්න දෙයක් නෑ. නමුත් හැසිරීම එක වගේ. පික්චර් එකක් වගේ හරියට. රූප දර්ශනයක් විතරයි. මේක ලේසි නෑ. අති සියුම් කතාවක් තියෙනව ඔතන. කතාව අති සියුම්. මේක සිහියට ඥානයට හසුවන කතාවක්. මේ බැස ගත්ත ස්වභාවය මොකක්ද කියල. මොකක්ද මේ බැස නොගත්ත ස්වභාවය කියල. ඔතන තියෙනව ලොකු ගැටයක් ලිහා ගන්න නේද?

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස. අභ්‍යන්තර සිහියත් එක්කමයි ලිහා ගන්න තියෙන්නෙ. අභ්‍යන්තර සිහියට නේ ආර්යයන් වහන්ස මේ ඔක්කොම දැනෙන්නෙ. එතැනින් තමයි මේක ලිහා ගන්න තියෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** දැන් මේ ස්වභාවය යෝගාවචර භූමියේ තමයි උපක්ලේශ වැදගත් වෙන්නෙ. යෝගාවචර භූමියෙන් පස්සෙ ඵලය හම්බ වෙන්නෙ 'අවිතක්ක අවිචාර' ස්වභාවය. එතනදී බැස ගන්න කතාවක් හම්බ වෙන්නෙ නෑ. හැබැයි මාර්ගයේදී හම්බ වෙනව. ඒ කියන්නෙ මාර්ග යේදී එයා සිහිය නුවන පවත්වනව ඒක බැසගෙනද නැද්ද කියන එක. එතකොට තමයි උපක්ලේශ සූත්‍රවල තියෙන ටික හම්බ වෙන්නෙ. ඇයි මේ ස්වභාවය නැති වෙනව බැස ගන්නව කියල හිතන තාක් කල්. බැස ගන්නව කියල දැනෙන තාක් කල්, නැහැ තමයි. ඇයි? දෘෂ්ටි තියෙන තාක් කල් බැස ගන්නවම තමයි.

**අභ්‍යන්තරයේ ලොකු අවබෝධයකින් තමයි මේ බැස ගැනීම නවතින්නෙ. එක තැනකින් නෙවෙයි. මේක හුරුවට මතුවන හැටි. අර**

**වේගය තුළ කාලයක් තිස්සේ ආපු නිසා ඒ අභිසංස්කරණය තුළ එන හැටි. මේ ඔක්කොම අවබෝධයක් තියෙන්න ඕන. එතකොට තමයි එයාට ඒක හසුවෙනව.** එයාට හසුවෙන කොට එයා දන්නව බැසගෙන නෑ කියල. කවුරුත් කියන්න ඕන නෑ. එයාට ඒ ස්වභාවයනේ තියෙන්නේ. අරමුණ නේ බැස ගන්නෙ. අරමුණ එන්නෙ කොහොමද කියල එයා දන්නව. එයා දන්නව මගේ පුරුද්දට මේක එන්නෙ කියල. මේක දෙයක් නෙවෙයි. මේක බැස ගත්ත නෙවෙයි. පුරුද්දට එන එකක් බව එයා දන්නව. එතන ආත්ම ස්වභාවයක් නැති බව. එකින් එක එකින් එක ලිහාගෙන යන්න ඕන. සිතිවිලිවල ස්වභාවය. ඒවා බැස ගත්තද, නැද්ද? එතකොට වේදනාව කාය ප්‍රසාද වේදනාව. ඒවා හරි ගැඹුරුයි. ඒව බැසගෙනද නැද්ද කියන එක. **ගොඩාක් ප්‍රශ්න අහන්නෙ කාය ප්‍රසාදය සොයා ගන්න බැරුව නේ. වේදනාවට හිමිකාරයෙක් නැති බව.**

**මෙහෙණින් වහන්සේ:** අර දුකක් නොවන දුකක් ඔබ වහන්සේ පැහැදිලි කරනව නේ.

**ආර්යයන් වහන්සේ:** ඒව හරි ගැඹුරුයි. දුක නොවන දුක හරි ගැඹුරුයි. සතුට නොවන සතුට හරි ගැඹුරුයි. ඒකෙ එක කෑල්ලක් විතරයි සම්පූර්ණ කතාවේ එක කෑල්ලක් විතරයි. දැන් මෙහෙණින් වහන්සේලා කී දෙනෙක් අපෙන් ඇහුවද ආ... පේර ගෙඩියට මම බැස ගත්ත නේ. මට ඒකට ආසාවක් ඇති වුණා. අපි කියනව නෑ නෑ. මෙහෙණින් වහන්සේ කියනව නෑ නෑ බැස ගෙන කියලා. අපි කියනව එහෙනම් බැස ගෙන තමයි. ඇයි එයා බැසගෙන කියල හිතනව නම් අපට නවත්වන්න පුළුවන්ද? බැසගෙන කියල හිතන එකත් බැස ගැනීමක්ම තමයි. හැබැයි බැස ගෙන නැති බව හිතුවොත් තමයි දැනෙන්නෙ, බැස ගත්තේ නැති බව. එතකම් දැනෙන්නෙත් නෑ. 'ජානතෝ නැතුව එස්සතො' නැහැ. හිතෙන නිසා බැස ගත්තේ.

මේක 'මච්චු දේව' සූත්‍රයේ එනව. සිතන විදියට හිතෙන්නෙ. සිතන විදියට බැස ගන්නෙ කියන එක. මච්චු දේව සූත්‍රය කියල එකක් තියෙනව. එතනදි තමයි කියන්නෙ **'මාර මාර, මාර කියන්නෙ දෙයක් කියල ගත්තොත් නේ. හිතෙන විදියට හිතනව. හිතන විදියට ගත්තොත්**

**මාරය ඉන්නව. එහෙමයි ගන්නෙ. දෙයක් කියල ගත්තොත් ආත්මයක් කියල ගත්තොත්, බැස ගත්තොත්, ආත්මයක් තියෙනව දෙයක් තියෙනව මාරයත් ඉන්නව**. ඕකයි මච්චු දේව සූත්‍රයේ පෙන්වන්නෙ. එහෙම ගත්තෙ නැත්නම් මාරයත් නැහැ කියනව පුදුම කතාවක් නේ. මුළු ධර්මයම තියෙනව. ආර්යයන් වහන්සේ එක්ක කතා කරන්න, ඕන කියල හිතෙනෙව නේද කතා කරගෙන යන කොට.

**මෙහෙණින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස. ලිහෙන්න ලිහෙන්න තමයි සරලව වැටහෙන්න දැනෙන්න පටන් ගන්නේ.

**ආර්යයන් වහන්සේ:** ගොඩාක් දියුණුවක් කරා යනව නේද? තේරෙනව නේද?

**මෙහෙණින් වහන්ස:** එහෙමයි. ඔබ වහන්සේගේ මේ දවස්වල දේශනා හසුරුවන්නෙත් ඒ පැත්තටම නේ.

**ආර්යයන් වහන්සේ:** අපිට ඕන මේ කට්ටිය අවසානය කරාම ගෙනිහිල්ල, අවසානය පෙන්වන්න ඕන මේ කට්ටියටම. අපි දන්නව පිටිපස්සෙන් විශාල පිරිසක් අපිත් සමග එනව කියල. අපි දන්නව ඒ සේරම ඉස්සරහට ගන්න ඕන කියල. පස්සට වෙන්න දීල බැහැනේ. ඒ අය තව තවත් දිරිමත් වෙන්න ඕන. ඉතින් ඒ අයට තව තවත් මේ සූත්‍ර අරගන්න ඕන. ඒවා පෙන්වන්න ඕන. මේ කියන එක නිකම් කටවචනයක් නෙවෙයි. හිස් වචනයක් නෙවෙයි. ප්‍රත්‍යක්ෂ දෙයක් කියල ඒ අයට 'ඡන්දං ජනේති වායමතී වීරියං ආරාහති චිත්තං පග්ගහාතී පජාහතී' කියල නේද සතර සම්‍යක් ප්‍රධාන වීරිය අනුව කටයුතු සිද්ධ වන්න ඕන. ඇත්තටම මෙතනට එනකොට ගොඩක් අවබෝධයක් ඇවිල්ල තියෙනව. ආත්ම දෘෂ්ටිය මොකක්ද? ආත්ම සංඥාව මොකක්ද? ඒක දියවෙන ආකාරය මොකක්ද? මේක ඉතුරු ටිකත් සුද්ධ කර ගන්න පහසු වන්නයි මේ දේශනා කරන්නෙ.

**මෙහෙණින් වහන්සේ:** සමහර අවස්ථාවල දේශනා අහගෙන ඉන්න කොට ආර්යයන් වහන්ස මට දැනෙන්නෙ මටම කිව්වා වගේ, ඒ තියෙන ගැටලුව නැතිවෙන තැනටම කියනව.

**ආර්යයන් වහන්සේ:** එහෙනම් මේ ප්‍රමාණවත්. එහෙමද? එතන අපි ගොඩාක් කතා කළාට මගහැරෙන්න පුළුවන්. ඒකයි අපි එහෙම අහන්නෙ. ඒ කියන්නෙ මේ කාරණා ඇත්තටම එක දවසින් එක මොහොතින් අපට හිතන්න අමාරුයි. කෙනෙකුට ගන්න පුළුවන් වෙයි කියල. මොකද එයා සක්මනේ යෙදෙන්න ඕන. වටපිට බලනකොට හැම මොහොතකම ආත්ම සංඥාව නැතිව හැසිරෙන්න ඕන. අත්දකින්න ඕන. විශාල කටයුත්තක් ඇතුළෙයි මේ අවබෝධය ඇතිවන්නෙ. මේක බහුලීකතා වෙන්න ඕන. ඒකනේ පත්තියම් වෙන්න ඕන කියල අපි හැම තිස්සෙම කියනව නේ. **ඕභාසය පත්තියම් වෙන්න ඕනනේ. ඒක වුණාට පස්සෙ අවධිය බලවත් වුණාට පස්සෙ අර රූප දර්ශනය, ඒ කියන්නෙ මේ ආයතනවල බැස ගන්නව කියන එක අඩු වෙනව. හැබැයි අර අවිධිමත් ස්වභාවය නිතර නිතර, ඇත්තටම උදේ ඉඳල රෑ වෙනකම් කෙනෙක් මේක නුවණින් හොඳින් දකිනව නම් ආත්මයක් නැතිව හැසිරෙනවා, ලොකු දියුණුවක් කරා යනව.**

මේක නිකම් ඔඩොක්කුවට නිවන වැටෙනකම් ඉඳල හරියන්නෙ නෑ. යන්තම් හරි වීරියක් නැතුව බෑ. සිහියෙන් නුවණින් යන ගමනක්. අතින් පයින් කරන එකක් නෙවෙයි. බොහොම ප්‍රඥාවන්තයින්ගේ දහමක්. ප්‍රඥාගෝචරයි මේ දහම. මේක විඤ්ඤාණ මායාවට හසු නොවන දහමක්. සිතුවිලිවලට ගන්නත් බෑ. අර දැනෙන ස්වභාවයත් එක්කම යන්නත් ඕනි. බොහොම සියුම් කතාවක් තියෙනව. අශ්ව ලෝමයක් සියක් කඩකට පැලෙන්න විදිනවා වගේ තමයි. අති සියුම් ගමනක් තියෙනව මෙතන පේන්නෙ නැති. ඒක සිද්ධ වෙනව හැබැයි ඒක නවතින්නෙ නෑ. මේ මට්ටමට එන කෙනෙක් කොහොමත් ඉතුරු ටිකත් යනවම තමයි. නමුත් ඒකට කාලය යන හින්දා තමයි තව ටිකක් හොඳින් සුද්ධ කරල දුන්නොත් එයාට එච්චර කාලයක් යන්නෑ. එහෙම නැත්නම් ඔතනම හිරවෙලා ඉන්නව. සෝතාපන්න භූමියෙම මිය යන්නෙ ඒක නේ අනාගාමී නොවී. අනාගාමී භූමියෙන්ම මිය යනවනේ. ඒ කියන්නෙ එතන අපි කතා කරන්නෙ හුස්ම ටික යනවනේ. හැබැයි ඉතින් ආත්ම දෘෂ්ටිය ලෝක සංඥා නැති නිසා පහළ ලෝකෙක සකස් වෙන්නෙ නෑ. ඒක නිසා ශුද්ධාවාස තමයි පනවන්නෙ. ඔය ලෝක සංඥා බිඳ වැටෙන කොට ඒ කියන්නෙ සත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ වැටෙනව නේ. **බල්ලො, පූසෝ,**

**ගෙවල් දොරවල් ඉරහඳ මේ සේරම ශබ්ද වර්ණවලට කැඩෙනව නේ. ශබ්ද වර්ණවලට කැඩෙනවා කියන්නෙ ලොකු දෙයක් ආයේ උපදින්නෙ නෑ. කෙළින්ම ශුද්ධාවාස තමයි, ආයේ ගර්භයක සකස් වන්නෙ නෑ.**

"දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ" කියන තැනින්, "කාමේසු විනෙය්‍ය ගේධං නහිජාතු ගබ්භ සෙය්‍යං පුනරේතීති" කියන්නෙ මේ ශබ්ද වර්ණවලට කැඩුණාට පස්සෙ ආයෙ එන්නෙ නෑ ගර්භයකට. ගර්භ සකස් වෙන්නෙ නෑ. ගති නිමිති කම්ම නිමිති සකස් වෙන්නෙ නෑ. එතැනින්ම නියත සම්බෝධි පරායණ වෙලා ඉවරයි. මේ ධර්මය අහන අය ඒකාන්තයෙන්ම නැවත උපදින්නෙ නෑ. ආත්ම භාවයක් නෑ. ආර්යයන් වහන්සේත් එක්කම නිවන් දකින කට්ටිය.

**මෙහෙණින් වහන්සේ:** ඔබ වහන්සේ කියන්නෙ අපි නිවන් දකිනවා කියන මතයේ පිහිටන්න කියල. ඒක නම් දැනෙනව ආර්යයන් වහන්ස නිවන් දකිනවාමයි කියලා.

**ආර්යයන් වහන්සේ:** මේක හරි පුදුම විදියට කියනව නේ. "අම්මේ අපි නිවන් දකිනවා" එහෙමයි කියන්නෙ. අම්මේ අපි නිවන් දකිනවා අම්මේ. හරි පුදුම කතාවක් ඒක. ඇත්තටම ඒක ආශ්චර්යයක්. ඒ වචනය කියන එකත් ආශ්චර්යයක්. හොඳයි එහෙම නම් දැනට මේ ප්‍රමාණවත්. ටිකක් ගැඹුරුයි නේ. හැමෝටම තෙරුවන් සරණයි.

# 03

# සත්‍ය ධර්මය නොදන්නා වූ අසෘතවත් පෘතග්ජනයාට සසර දිගය

**උපාසක:** ආර්යයන් වහන්ස හැම තිස්සෙම දකිනව එළියෙ අරමුණක් එනකොටම ඒ අරමුණ තමයි තියෙන්නෙ. අරමුණට පරිබාහිරව ඒ අරමුණ දකින කෙනෙක්වත්. අරමුණ විඳින කෙනෙක්වත් එළියේ නැහැ කියන අදහසක් අපට තියෙනව. මට තරහ යනව. තරහ ගියාට පස්සෙ ඇත්තටම මම දකිනව ආර්යයන් වහන්ස ඒ අරමුණ ගැටිච්ච අවස්ථාවෙදී ඒ අවබෝධය මට එනව. ආර්යයන් වහන්ස මේක නේද අපි යන්න ඕන මාවත.

**ආර්යයන් වහන්සේ:** ඩොක්ටර් මෙතනට එන්නෙ ත්‍රිවිද්‍යා හරහා තමයි මේ මාර්ගය විවර වෙන්නෙ. ඔය කෘත්‍ය ඥානය තමයි ඔය කතා කරන්නෙ. **හැබැයි අපි හැම තිස්සෙම මතු කරන දෙයක් තමයි සත්‍ය ඥානය නැතිව කෘත්‍ය ඥානය නැති බව.** ඒ කියන්නෙ මේ දර්ශනය තුළ පිරිසිදු වෙන්න ඕන කාරණාව තමයි මෙකෙ වැදගත්ම තැන තියෙන්නෙ. **ඒ කියන්නෙ මෙතන ආත්මය කොහොමද හැදෙන්නෙ කියන එක. ආත්ම සංඥාව තියාගෙන ආත්ම දෘෂ්ටියේ ඉඳගෙන අපි මැද්දෙන් සිතුවට මෙතන ආත්මයක් නෑ කියල සිතුවිල්ලකින් සිතුවට වැඩක් නෑ. ආත්මය හැදෙන හැටි අපි හොඳට පත්තියම් වෙනකම් හොඳට අපි ඒක දැනගන්නකම්, ඒ අවබෝධය තමයි ආත්ම දෘෂ්ටිය බිඳෙන්න හේතු වෙන්නෙ.** එතකම් අපි ආත්මය නෑ කියල සිතනවා. නෑ කියල හිතන්නෙ තියෙන ආත්මයෙන්. ඒ නිසා ඒක නැතිවන්නෙ නෑ. මේක දෘෂ්ටිය නැති වෙන්නෙ නෑ. අපි හැම තිස්සෙම මම ඉන්නව කියන තැනක ඉන්නේ අපට පේන්නෙ නැති වුණාට. අපි ආරෝපණයකට කොටුවෙලා තමයි

හැම තිස්සෙම කටයුතු කරන්නෙ. එතකොට මම ජීවත් වෙනව කියල මම දන්නව. මම ජීවත් වෙනව කියල මට තේරෙනව. මම ජීවත් වෙනව කියල මට තේරෙද්දි මම නෑ කියල හිතන එක සිතුවිල්ලක් විතරයි.

ඒ මමම හිතන සිතුවිල්ලක්. **මමම ඉඳගෙන මම හිතනව, මම නෑ කියල.** ඒක කවදාවත් වෙන්නෙ නෑ. ඒකට හේතුව මම ඉඳගෙන මම හිතනව. එතකොට මම ඉන්න එක නැතිවෙලා නැහැ. හීන ඇතුළෙ හීනයක් දැක්කා වගේ තමයි එතකොට. හීනයක් දකිනව, හීනෙන් හීනයක් දකිනව. එතකොට ඒ දෙකම හීනයම තමයි. කොහොමත් ඉන්නේ හීනනේ. සත්‍ය ලෝකයේ සැබෑ හීනය කියන්නෙ. ඒ හීනයක් තමයි අපිට මේ දරුවා, ගෙවල් දොරවල්, ඉර, හඳ, හැම එකම අපි තියෙනව කියල ගත්ත හීනයක් මේ තියෙන්නෙ. එහෙම එකක් නැහැ. අපි ශබ්දයක් තමයි මේ දාගෙන ඉන්නෙ. ඊට අමතරව **සද්දය වර්ණය එකතු වෙලා හැදුණ ආරෝපණයකට අපි කොටුවෙලා ඉන්නෙ. පේන්නෙ නැති වුණාට.** මේක 'ෆැන්ටසි' එකක්. **මේක ඇත්තක් නෙවෙයි. මේ ඇත්තට අවදි වෙන එක තමයි සත්‍යයට අවදි වෙන එක තමයි මේ දහම තුළ තියෙන සුවිශේෂම සිද්ධිය.** එතකම් අප මිථ්‍යා දෘෂ්ටිකයි. මේ සත්‍යයට අවදි වෙනවයි කියන එක අවබෝධයෙන් සිද්ධ වෙන්නෙ. "සංඛිත්තේ නිබ්බිදාය" අවබෝධ ඥානය නැතිව කිසි කෙනෙකුට සත්‍ය දන්නෙ නැතිව අරමුණෝ එහෙම මම නෑ කියල හිතුවට වැඩක් වෙන්නෙ නෑ. ඒක ප්‍රායෝගික නෑ. ඒක ඇත්තටම මම මාව තියාගෙන නිවන් දකින්න හදනව වගේ වැඩක්.

**නිවන කියන්නෙ මෙතන ආත්මයක් නැති බවම,** ඒ ආත්මයත් නැති වෙන්නෙ කොහොමද කියල අවබෝධ කරන එක මතයි මේ නිවීම කියන එක සිද්ධ වෙන්නෙ. **මේක හොඳටම ප්‍රත්‍යක්ෂ වුණ දවසට තමන්ට සැකයක් නැතිවම හැම මොහොතෙම දැනෙන්න ගන්නව මේ ආත්මය නැති බව. ඒක දැනෙන්න ගන්න එක තමයි අරමුණු දකිනව කියන්නෙ. ඒක දැනෙන එකක් මිසක් ඒක හිතන එකක් නෙවෙයි.** දැන් අපි කරන්නෙ මොකක්ද? අපි හිතනව ආත්මයක් නෑ කියල. ඒ වුණාට කවදාවත් ආත්මය නැති වන්නෙ නෑ. ඒකට හේතුව අපි ඉන්නව. ඉන්න අපි, අපි නෑ කියල හිතනව. ඒ කවදාවත් වෙන්නෙ නෑ. ඒකයි. 'පුබ්බේනිවාසානුස්සති

ඥානය' තමයි මේකේ විශාලම පරාසයක් යන්නෙ. කාටවත් ඒකට අවධානය යොමු වෙලා නැති බව පේනව. ගොඩක් අය ධර්මය දේශනා කරන ඒවත් එක්ක බලන කොට.

හැබැයි මේකේ පුබ්බේනිවාසානුස්සති ඥානයේ තමයි රහස තියෙන්නෙ. ඒ කියන්නෙ වේගෙට ආලෝකය සකස්වෙන ආකාරය වේගෙට චක්ඛු ප්‍රසාදය සකස් වන ආකාරය. සෝත ප්‍රසාදය සකස් වෙන ආකාරය කන් බෙරේ සෙලවෙන වයිබ්‍රේෂන් එක අපි කතා කරනව ශබ්දය කියල. එතකොට ශබ්දය කියන්නෙ වයිබ්‍රේෂන් එකක්. කන් බෙරය සෙලවෙන්නෙ. ඒක ධ්වනියක්. ඒ කන්බෙරය සෙලවෙන වයිබ්රේෂන් එකට සංඥාවක් විදියට චක්ඛු ප්‍රසාදයේ සිද්ධ වෙන ස්පාක් වෙන වේගෙට එන උද්දීපනය ඇත්තටම රූපය කියන්නෙ රූපය තියෙන එකක් නෙමේ, ස්පාක් වෙන වේගයක්. වේගෙ තමයි අප සම්මත කරල තියෙන්නෙ දීර්ඝ කාලයක්. මේ ඔක්කොම ඇහෙනව දැනෙනව පේනව කියන තැන බැස ගෙන ඉන්නෙ. නමුත් මේ කතාව අතිශයින්ම වෙනස්.

මෙතන තියෙන රූපෙකුත් නෑ. තියෙන සද්දෙකුත් නෑ. ඒව එකතු වෙලා දැනෙන දේකුත්නෑ. ආරෝපණ ටිකකට කොටුවෙලා ඉන්නෙ. මේක හොඳට තේරෙනවා. දුප්පත් අය ළමයි විකුණනව නේ. ළමයි එතකොට ඇමෙරිකාවෙ ඉන්න දෙමව්පියන්ට මේ දරුව විකුණුවොත් කියල අප දේශනා කරන්නෙ, ඒ දරුව දන්නෙ නැත්නම් මැරෙනකම්ම අම්ම කවුද කියල, ඒ දරුව මැරෙනකම්ම අම්ම කියල කියන්නෙ අර Mother කියන සද්දයයි හැඩතලයයි සුදු ජාතික හැඩතලය. එතකොට ඒ දරුවටත් දැනෙනව Mother කියන සද්දයත් අර සුදු ජාතික කාන්තාවත් අම්ම කියන අර බන්ධන බලය සමානව දැනෙනව. එතකොට මේ අම්ම ඉපදිලා තියෙන්නෙ ඒ දරුවට. කොහොමද ඉපදුණේ? ඇසට ආපු වර්ණයත්, කනට ආපු සද්දයෙන් තමයි අම්ම ඉපදුණේ. එතකොට ඒ දරුවගෙ අම්මද කියල ඇහුවොත් ඇත්තටම ඒ දරුවගෙ අම්ම නෙවෙයි. ඇත්තටම ඒ දරුවගෙන් අම්ම කවුද කියල ඇහුවොත් අම්ම තමයි ඒ. මොකද ඒ දරුවගෙ ආරෝපණයක් තියෙන්නේ. ඒ ආරෝපණ බලයක් තියෙනව. ඒ බලය අම්ම කියන කොට දැනෙන ගතියක් එහෙම. ඒ ගතිය එන්නෙ අර හැඩතලය ආවොත්. සුදු ජාතික කාන්තාව අම්ම නම්, ඒ mother කියන

ශබ්දෙත් එක්ක ආවොත් ඔය දෙකෙන් එකක් ආවොත් අර ආරෝපණය එනව. මේක ඇත්තටම ගුරුත්වාකර්ෂණය හැදෙන හැටි. එහෙම නැත්නම් ගුරුත්වාකර්ෂණය හැදෙන්නෙත් පෘථිවිය කැරකෙන වේගෙට ධන සෘණ අන්ත දෙක හැදිල ආකර්ෂණ බලයකට කොටු වෙනවා. ඒ විදියට තමයි විද්‍යුතය හැදෙන්නෙත්. ධන සෘණ චුම්භක අන්ත දෙක කරකවල ආරෝපන දෙක රතු පාටයි නිල් පාටයි කියල ධනයි සෘණයි ඇත්තටම ආරෝපණ දෙකක්. මේක මේ ස්වභාදහමක්.

මේක තව විධියකට දකින්න පුළුවන් මේ චිත්තාරෝපණයත් මේ විදියමයි ඒ කියන්නෙ ලී කෑලි දෙකක් එකට ඇතිල්ලුවම රත්වෙන එක. එහෙම නැත්නම් සුදු රෙදි කෑල්ලක් අරගෙන අතුල්ලන කොට ඇඟිලි දෙකෙන්, ඒකෙ එනවා ආරෝපණයක්. ඊට පස්සෙ ඒකට කෙස් ගහක් ළං කළොත් ඒක කෙළින් වෙනව ඇඹරෙනව. එතකොට තේරෙනවා මේ බලයක් හැදිල තියෙනව කියල. එතකොට මේ කම්පන රටාවකට බලයක් හැදෙන එක. මේක තමයි ශබ්ද හැදෙන්නෙත්. වර්ණය හැදෙන්නෙත්. කම්පන රටාවකට බලයක් හැදෙන එක. ඒකම තමයි ශබ්දය බලයක් වෙනව. වර්ණය බලයක් වෙනව. ඒ දෙක එකට එකතු වුණාම දෙකම එකට එකතු වුණු බලයක් හැදෙනව. ඒක තමයි අපි මේ චිත්තාරෝපණය කියන්නෙ. චිත්තය කියන්නෙ. චිත්තය කියන්නෙ කම්පනයක්. ඒකෙ තියෙන්නෙත් වේගයක්. ඇත්තටම මෙතන තියෙන්නෙ හැමතැනම තියෙන්නෙ රුප්පනයක්.

“රුප්පන්තිකෝ ආයුසෝ රූපං” රුප්පනයයි රූපය හැදෙන්න හේතු වෙන්නෙ. **එතකොට මේ කිසිම තැනක තියෙන රූපයක් නෑ. අපි ඇසුරු කරන්නෙ චිත්තයක්. පොත, මේසය, ඇඳ, ගෙදර මේවට තියෙනව අපට ඇසට ආපු හැඩතලත්, කනට ආපු ශබ්දත් එකතුවුණු ආරෝපණ බලයක්. ඒ හැම දේකටම වටිනාකමක් කියන්නේ බලයක් දීල තියෙනව. ඒ බලය මොකක්ද? අප නැගී සිටින්නේ ඒ බලය උඩ. මොකක්ද ඒ බලය. චිත්ත බලය. මොකක්ද ඒ චිත්ත බලය. දරුවො ඉන්නව ගෙවල් තියෙනව, අම්ම ඉන්නව, තාත්ත ඉන්නව, සල්ලි තියෙනව මම ඉන්නව.** මගේ රූපය මේක මම මෙහෙමයි මම මේ වගේ කෙනෙක්. මේ මොනවද

මේ. මේව ඔක්කොම චිත්තබල. චිත්ත බල කියන්නෙ ආරෝපණයක්. ඇත්තටම මෙතන කෙනෙක්වත්, පුද්ගලයෙක්වත්, සත්ත්වයෙක්වත් මොකුත් නෑ. මේක ස්වභාදහමක්. මේක අපට සත්‍ය මෙනෙහි වෙනව නම් හැම මොහොතෙම, හැම අරමුණකම කිසිම හරයක් අපට දැනෙන්නෙ නෑ. මේක තමයි ඇත්තටම නිවීම කියන්නෙ. **මේ චිත්තාරෝපණ බලය දුරුවෙන එක තමයි ක්ෂය ධම්මා වය ධම්මා කියන්නෙ. ඒ කියන්නෙ අබොප්පා චේතෝ විමුක්තිය කියන්නේ, මේ කම්පන ස්වභාවය කම්පනය නොවන ස්වභාවයක් බවට පත් වෙනවා.** මේ අවබෝධය තුළ කම්පනය නැති වෙනවා. උද්දීපනය නැති වෙනවා. 'උප්පිත්තදි' කියන තැන අන්න දිය වෙනවා. එතකොට නන්දිය තමයි 'උද්දීපනය'. නන්දිය තමයි තණ්හාව. රාග, ද්වේෂ, මෝහ. ඔය වචන ගොඩක් විතරයි. මේකෙ තියෙන්නෙ ආරෝපණයක්, ආරෝපණය දිය වෙනවා. **උපාදාන බලය සිඳෙනව. එතකොට සබ්බ සංඛාර සමථය** සංඛාර සමථයක් කියන්නෙ ඒකයි. ඇත්තටම සිතුවිලි සමථය වෙනව. වැටහුණා නේද?

**උපාසක:** එහෙමයි ආර්යයන් වහන්ස. දැනුමක් විදියට ඒක තියෙනව. ඒක apply කරන කොට අපි දැන් හැම අරමුණකටම ඔය විදියට සිහිය පවත්වන්න අමාරුයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** නෑ අපි "අජ්ජොසාය තිට්ඨති" කියන්නෙ බැස ගත්ත අරමුණු විතරයි මෙනෙහි වෙන්නෙ. එතකොට අනිත් ඒවා ආරෝපණය අඩුයි නේ. ආරෝපණය වෙන්නෙ නෑ. **දැන් අපි ගමනක් යන කොට ඔක්කොම මතක නෑ. හැබැයි ගියාට පස්සෙ මතක තියෙන්නෙ බැස ගත්ත එක විතරයි.** ඒක තමයි අනිත් අයට කියන්නෙ අන්න අහවල් තැන සතෙක් හිටියා වාහනේකට යට වෙලා. ඒක මතකයි හොඳට. අනිත් වටපිට බලන ඒවා මොකුත් දන්නෙ නෑ. හැබැයි **අපට වැදගත් වන්නෙ බැස ගත්ත අරමුණෙන් මිදෙන එක විතරයි.** මොකද ඒක තමයි අපේ තියෙන ගින්න. රාග, ද්වේෂ මෝහ ගින්න. ගින්න නිවෙනව කියන්නෙ බැස ගත්තදේයි නිවෙන්නෙ. එහෙනම් බැස ගත්ත අරමුණු මිදෙන එක තමයි නිවන් මග වෙන්නෙ.

"අජ්ජෝසාය තිට්ඨති යාරූපේ නන්දි - තදූපාදානං භවෝ" කියන තැන. දෙයක් කියල ගත්තොත් ඒ තමයි භවය. "භව නිරෝධෝ

නිබ්බානෝ" කියන්නෙ බැස ගත්ත අරමුණු මිදෙනව කියන්නෙ පුදුම සැහැල්ලුවක් තමයි දැනෙන්නෙ. සාන්ත ප්‍රණීත සුවය මේ නිවන් මග

**උපාසකඃ** ආර්යයන් වහන්ස, නෝන මට කීවා බබාට උණ කියල. ඒක කියන කොටම මම දැනගත්ත උණ කියන දේම තමයි මම කියන අදහස.

**ආර්යයන් වහන්සේඃ** ඔව්. ඒක තමයි ආත්ම සංඥාව.

**උපාසකඃ** එහෙම ගන්න ගමන්ම මට ඒ ගැන වෙනද විතර කම්පනය එන්නෙ නෑ. නොසන්සුන් ගතිය හිත තුළ නැහැ.

**ආර්යයන් වහන්සේඃ** ඒක හරි. ඒ කියන්නෙ ආයතන ටික දකිනව ආත්ම දෘෂ්ටියෙන් මිදිලා. කියපු එක හරි. ඕක අපි නිතරම කියනව ආත්ම දෘෂ්ටියෙන් මිදිලා ආයතන ටික දකින්න කියලා. එතකොට ගින්නක් නෑ. ඒක හරි ඒක නිවන් මග තමයි. අර ටික මෙතනට ඇප්ලයි වෙන කොට ඔය ටික තමයි වෙන්නෙ.

**උපාසකඃ** ආර්යයන් වහන්ස මම දේශනා තුළ ධර්මය තුළ අහල තියෙනව පංච උපාදානස්කන්ධයේ ඇත්ත දකින්න කියලා. හැම මට්ටමකදීම.

**ආර්යයන් වහන්සේඃ** පංච උපාදානස්කන්දයේ ඇත්ත දකිනව කියන්නෙ, අරමුණේ සත්‍ය දකිනව කියන්නෙ එකම කතාව. **පංච උපාදානස්කන්ධයම තමයි අරමුණු කියන්නෙ.** ඔය දෙකම එකයි. මෙනෙහි වෙන කොට අභ්‍යන්තරයේ තියෙන ගින්නයි නිවෙන්නෙ. ඒකයි නිවනට උපනිශ්‍රය වෙන්නෙ. ඒක හරි. **අරමුණුවල බැසගන්න එක මෙනෙහි වන එක තමයි ප්‍රැක්ටිකලි වෙන්නෙ අපි වෙනින් ඒව හිතුවට වැඩක් නෑ. වෙන්නෙ බැස ගත්ත අරමුණු දැකල මිදෙන එක තමයි. අනිත් ඒව කොහොමත් මිදිල තියෙන්නෙ.** ඒව මෙනෙහි කළත් මිදෙන එකනේ වෙන්නෙ. ඒත් මිදිල නේ තියෙන්නෙ. ඒව මෙනෙහි කරන එකේ තේරුමක් නෑ.

**උපාසකඃ** ආර්යයන් වහන්ස, තව මට ආපු ගැටලුවක් තමයි ඔබවහන්සේගේ දේශනා අහද්දි මම සාරාංශය වගේ ගන්නව මොකක්ද

මේ පොයින්ට් එක කියලා. මම ප්‍රධාන පොයින්ට්ස් කීපයක් ගත්තා. එකක් තමයි බාහිර ඇත්තක් නොවන බව එක. දෙවෙනි එක ආත්මය කියන එක සංඥාව ආරෝපණයක්. එහෙම නැතුව පවතින ආත්මයක් නැත කියන එක. ගිනිබෝලය කැරකෙනව වගේ අරමුණු අරමුණු එන එක. අන්තිම දේශනා අහද්දි මට දැනුණා මේක ආත්ම ආරෝපණයක් කියල එන්නෙ කියන එක, තේරුණා මට. එතකොට බාහිර ඇත්තක් නොවනවයි කියන එක. මට තර්කයක් ආව "බාහිර කෙනෙක් කතා කරන කොට අපි හිතනව නේ කන්බෙරය දක්වා ශබ්ද තරංගයක් විතරයි එන්නෙ එතන වචන තිබුණේ නැහැ කියන එකක්, විද්‍යානුකූලව ඒක මොළේට යන්නෙ කරන්ට් එකක්. එතකන් වචන තිබුණෙ නෑ. සිත ඇතුළෙ හැංගිච්ච එකක් තමයි කියන එක මේක. නමුත් ඒක එළියේ තිබුණෙ නැහැ කියන එක තවම මට හරියටම ප්‍රත්‍යක්ෂ වන්නෙ නෑ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අපි මෙහෙම කියමු. ඒ කියන්නෙ අහසෙ විදිල්ලක් කෙටුවොත් නේ ජනේල හෙලවෙන්නෙ. ඒ කියන්නෙ තව තැනක මේ වගේ කන් බෙරයක් හෙල්ලුණොත්නේ රබානක් හෙල්ලුණොත් නේ මෙතන කන් බෙරය සෙලවෙන්නෙ. එතකොට මේකෙ අපිට වෙන කතාවක් නැහැ. ඒ වගේම කන් බෙරයත් තව තැනක රබානක් වගේ හෙල්ලුවොත් මෙතන කන් බෙරය හෙල්ලෙනව. එතකොට ඒකෙ අංශු කම්පනයක් මිසක් ඒකෙ ඔය ශබ්දය කියල එකක් නෙවෙයි තියෙන්නෙ. එහෙම එකක් නෑ. සෙන්සර් එකක් නැතුව කාටවත් ඇහෙන්නෙ නෑ. දැන් කනක් නැති කෙනෙකුට ඇහෙන්න නෑ. වෙන සෙන්සස් තිබ්බට වැඩක් නෑ. එයාට බෙරයක්ම තියෙන්න ඕන හෙල්ලෙන්න. හෙල්ලෙන්නෙ මේකෙ බෙරය මිසක් වෙන මොකක්වත් නෙවෙයි. බෙරය හෙල්ලුණොත් තමයි සද්දය කියල තියෙන්නෙ. ඒක සෙන්සර් එකක් තියෙන්නෙ. එළියෙ සද්දයක් තියෙනවද නැද්ද කියන එක අදාළ නෑ. මෙතන තියෙන්නෙ සෙන්සර් එකක් තියෙනවද කියන එකයි. සෙන්සර් එකක් තිබුණොත් විතරයි දැනෙන්නෙ. සෙන්සර් එකක් නැත්නම් දැනෙන්නෙ නෑ. සෙන්සර් එකක් තිබුණොත් රේඩාර් එකක් හරි දැනෙනව. රේඩාර් දැනෙන්නත් සෙන්සර් එකක් තියෙන්නෙ ඕන. සමහර සතුන්ට රේඩාර් දැනෙනවනේ. රේඩාර් දැනෙන සෙන්සර් එක අපට තියෙන්න ඕන.

සෙන්සර් එකට දැනෙන එක කොහේවත් තියෙනව කියන්නත් බෑ. මේ කතාව සම්පූර්ණයෙන්ම අංශු කම්පන විදියට ගත්තොත්, (මේක උපමාවක් විතරයි.) මේක හොඳට තේරෙනවා. ඒ කියන්නෙ සේරම අංශු ගොඩක් කියල දැනෙනව නම්. එක අංශුවක් මේ අතට කම්පනය වුණොත්, ඒ අතට කම්පනය වෙන සෙන්සර් එකක් තිබ්බොත් ඒක අහුවෙනවා කියන එක. හැබැයි ඒ අතර අංශු කම්පනය වුණේ නැත්නම්, ඒ අතර කම්පනය සෙන්සර් එක අහුවෙන්නෙ නෑ කියන එක. ඇයි? එළියෙ ශබ්දයක් කියන කතාවක් අපට හම්බ වෙන්නෙ නෑ. අංශු කම්පනයක් විතරයි හම්බ වෙන්නෙ. අංශු එක අතකට කම්පනය වෙන එක තමයි වර්ණය කියන්නෙ. ඇයි, තරංගවලින් නේ කියන්නෙ ආලෝකය. හර්ට්ස් 20යි 20,000යි කියන්නෙ ඒකත් තරංගවලින් නේ කියන්නෙ තාපය පවා. එක එතකොට අංශු කම්පනය තව ආකාරයකට තාපය කියන්නෙ. එකම අංශුව කම්පනය වන ආකාර ටිකක් විතරයි වර්ණ ගන්ධ රස පහස කියන්නෙ. එහෙම දේකුත් නෑ. සෙන්සස් නිසයි දැනෙන්නෙ. සෙන්සස් ටික නැත්නම් ඒවත් නෑ. මේක පුදුම කතාවක් නේ.

**මේකෙ රූප භූමිය කියන්නෙ සෙන්සස් වලට කොටු වෙන භූමිය. අරූප භූමිය කියන්නෙ ඔක්කොම සෙන්සස් එකම කම්පනයක් කියල ගන්න භූමිය ඒකයි කම්පනයක් විතරයි අන්තිමට දැනෙන්නෙ.** ඔය ධර්මය අවබෝධ වුණාහම අවසානයට යන කොට අභ්‍යන්තරයට දැනෙන කම්පනය දියවීගෙන යන එක තමයි නිවනට උපනිශ්‍රය වෙන්නෙ. ඒකම තමයි අරහත්වයට පත්වෙන්නෙ. ඒක අභ්‍යන්තර සිහියට හසුවෙනව. යම්කිසි දෙයක් දකින කොට "ලස්සනයි", "මිහිරියි", "කැතයි", "රසයි", "ගඳයි" ඔය චුන් එකක් තියෙන්නෙ. චුන් එකක් කියන්නෙ කම්පනයක්. ඒ කම්පනය තමයි දිය වෙන්නෙ. ඒ කම්පනය නොවන ස්වභාවය තමයි "අබොප්පා චේතෝ විමුක්තිය" කියන්නෙ. ඒ තමයි අරූපය කියන්නෙ. **අරූපය කියන්නෙ දෙයක් වගේ දැනෙන කම්පනය දියවී ගෙන යන ස්වභාවය. අන්න එතන තමයි, "අබොප්පා චේතෝ විමුක්තිය" කියන්නෙ. ඝන සංඥා සුඛුම වෙනව කියන්නෙ. ඒකම තමයි ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ කියන්නෙ. එකම කතාව මේ කියන්නෙ. ආරෝපණය දිය වෙනව කියන්නෙත් ඕකමයි. කම්පනය වෙන ස්වභාවය දියවී ගෙන යනව. අන්තිමටම ශබ්ද වර්ණ කතාවක් හම්බ වෙන්නෙනෑ අනාගාමී භූමියෙන් පස්සෙ.**

**උපාසක:** තමන් කියන්නෙ, සිත කියන්නෙ අරමුණුමයි කියල දැක්කට පස්සෙ ආර්යයන් වහන්ස, ඒක දැනෙන්නෙ නේද, උදාහරණයක් විදියට කන කොට මේ කෑම තමයි මේ වෙලාවේ මගේ හිත කියල දැක්කම. වෙනදට රස දෙයක් සොයා ගෙන යන ගතිය අඩුවෙනව. කෑමේ අඩුපාඩු බලන ගතිය අඩුවුණා.

**ආර්යයන් වහන්සේ:** ඒක හරි. කම්පනයක් තමයි අන්තිමටම. ශබ්ද වර්ණ කියල දේකුත් හම්බ වන්නෙ නෑ. අන්තිමටම කම්පනයක් තමයි අභ්‍යන්තරයට දැනෙන්න ගන්නෙ. ඒක දියවී ගෙන යන එක තමයි එතකොට නිවන වෙන්නෙ. පැහැදිලියි නේද?

**උපාසක:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස**: තෙරුවන් සරණයි.

# 04

# ඔබ තුළ සිටින මාරයා ඔබේම සිතුවිලි

**ආර්යයන් වහන්සේ:** තෙරුවන් සරණයි

**උපාසක:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. ප්‍රතිපදාව සම්බන්ධව තවදුරටත් දේශනා කරන්න කියල ඉල්ලනව. ඔබ වහන්සේ මුල ඉඳන්ම ප්‍රතිපදාවම අපිට අවධාරණය කළේ. ඒක හරි වටිනවා. ඒ කියන්නෙ පූර්ව භාග ප්‍රතිපදාව. ඒ තුළින්මයි අපි මේ ගමනට පිවිසෙන්න ඕන. ඔබ වහන්සේ අන්තිම වෙන කොට ලස්සනට ගෙනාව බාහිර දෙයක් නෑ කියල පළමුවත්, ඇතුළත සිතමයි මේක හදා ගන්නෙ කියන එක. ඊට පස්සෙ සිතත් නැති කරල දැම්ම. ඇතුළෙන් මතුවන ඥානය මතුවන හැටි ගෙනල්ල පෙන්නුව. අන්තිමට බාහිර තියෙන ඒව තියෙන බව දක්වා ගෙනවා අපූරුවට. අලමරිය ඥාන දර්ශනය අන්තිමට ලේයර්ස් කතාව ලස්සනට ගෙනල්ල දුන්න. මේක මනෝමය දැනුමක් විදියට ඇවිල්ල අභ්‍යන්තරයට ගලා යන ස්වභාවය අපි ඉතාමත් සතුටින් සජීවීව අහගෙන යන්නෙ. කවුරුහරි දැන් සජීවීව සම්බන්ධ වන්නෙ නැත්නම් ඊයෙ හවස 6ට දාපු එක නැවත දිගුවක් විදිහට ලේයර්ස් එක්ක ඒ ආශ්චර්යමත් දේශනාව කරනව නම් හොඳයි කියල හිතනව.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම මේ දහම ප්‍රායෝගික දහමක්. ඇත්තටම ආශ්චර්යමත් දහමක්. මේකෙ කියන්න වචන නැති තරම්. ඒ කියන්නේ මේ දහම අවබෝධ වන්න ඕන, මේක කෙනෙකුට දැනෙන්න. ඇත්තම අති සුන්දර කතාවක් මෙතන තියෙන්නෙ. මේ දහම අවබෝධ වුණාට පස්සෙ පුදුම ආශ්චර්යක් මේකෙ තියෙන්නෙ. මේක වචනයෙන් කියන්න බැරි තරම්. ඒ කියන්නෙ ඔබ කුමන දේ කළත් ඔබ කුමන

කටයුත්ත කළත්, ඔබ කුමන දේ කතා කළත් ඔබ අති උතුම්. ශ්‍රේෂ්ඨයි. ඒකට හේතුව මෙතන පුද්ගලයෙක් නෑ. මෙතන සත්ව පුද්ගල ස්වභාවය සම්පූර්ණයෙන් බිඳ වැටෙනව. හැබැයි සම්මුතිය තුළ කවදාවත් මේක සොයන්න බෑ. පෘථග්ජන කෙනෙකුට මේක කිසි දවසක සොයන්න බැහැ. මේකෙ ඒ ස්වභාවයට පත්වෙනකම් කිසි කෙනෙකුට තේරෙන්නෙ නැහැ. බුදුන් වහන්සේ දිට්ඨි සංයුක්තයේ කිව්ව වගේ ආර්ය භූමිය දකින්න කිසි දවසක පෘථග්ජනයෙකුට බෑ. පෘථග්ජන භූමියට දකින්න බෑ. අසෘතවත් පෘථග්ජන උන්මත්තක මිථ්‍යා දෘෂ්ඨික භූමියට යමක් කියයිද ආර්ය භූමියට එය අසත්‍යයක්මයි. ඒ වගේම ආර්ය භූමියට යමක් කියයිද, මිථ්‍යාදෘෂ්ඨික පෘථග්ජන භූමියට එය බොරුවක් වේ. අසත්‍යයක් වේ.

අපි ලැහැස්තියි හෙට අනිද්දට දිට්ඨි සංයුක්තය ඉදිරිපත් කරන්නට. මේ දේශනා ඉදිරිපත් කරන්න ආර්ය භූමියට යමක් කියයිද, පෘථග්ජන භූමියට එය අසත්‍යයක්මයි කියන එක. ඒ කොහොමද වෙන්නෙ? පෘථග්ජන භූමියේ දෙයක් තියෙනවද ආර්ය භූමියේ දෙයක් නැහැ. මේක තමයි මේකෙ තියෙන මහා ආශ්චර්යමත් සිද්ධිය. මේක අවබෝධ කරන ධර්මයක් කියන්නෙ කණ්ණාඩියෙ දෙයක් නෑ කියල අපට අවබෝධයි. ඕන කෙනෙකුට මේක තේරෙනව. කණ්ණාඩියෙ දෙයක් නෑ කියල අවබෝධයි. **කණ්ණාඩියෙ අපට ඔක්කොම දේවල් පේනව. හැමදේම පේනව කණ්ණාඩියෙ, නෑ කියන්න බෑ. නමුත් කණ්ණාඩියෙ දෙයක් නෑ කියල අපට අවබෝධයි. මෙන්න මේ උපමාව ඉතාම වටිනව. ඇත්ත ලෝකයේ ඔබ වෙනදා විදියටම දකිනව. වෙනදා විදියටම ඇහෙනව. දැනෙනව. නමුත් ඔබගේ අවබෝධය කිසිදේක වටිනාකමක් අගයක් එකතු කරන්නෙ නෑ.** ඇත්තටම කිව්වොත් මේ මහා ආශ්චර්යයක්. පෘථග්ජන භූමියට මේක හඳුනා ගන්න බෑ. එකම දෙයයි කරන්න පුළුවන්. දහම අවබෝධ කරගන්න එක. මේ දහම අවබෝධ කළාට පස්සෙ ඒ දහම හොඳින් අවබෝධයට පත් වුණොත් ඔය බැස ගන්නව කියල හිතන කිසිම තැනක බැස ගන්නෙ නෑ.

ඒක හැබැයි කවදාවත් අනිත් අයත් එක්ක එකට තියල බැලුවොත් එක වගේ පේන නිසා සොයන්න බෑ. මේක හරි පුදුම කතාවක් තියෙන්නෙ. මේකෙ අවසානයට එන්නෙ එතැනට. තව පැත්තක් තියෙනවා. ඒක අපි

තව ටිකක් එහාට තියමු. ඔබතුමා කිව්ව වගේ ආර්යයන් වහන්සේ ගමනක් අරගෙන යනව මේ හැම කෙනෙක්ම. ඒ ගමනේ ගමනාන්තය පෙනෙන මායිමට ඇවිල්ලා තියෙනවා. හැබැයි තවම ගමනාන්තයට ගිහිල්ල නෑ. හැබැයි ඒ ළඟටම එක්ක ගෙන ඇවිත් තියෙනව. 'ඕභාසෙත්' පෙන්නුවා. රූප දර්ශනයත් පෙන්නුවා. ඕභාසය, රූප දර්ශනය දෙකම තියෙන මොහොත පෙන්නුවා අලමරිය ඥාන දර්ශනය වෙනද විදියටම පේනව. වෙනද විදියටම ඇහෙනව. වෙනද විදියටම දැනෙනව. වෙනද විදියටම කථාබහත් කරනව. හැබැයි වෙනද විදියටම සිතුවිලිත් තියෙනව. එතන සියල්ලෙන්ම මිදිල කියනවටත් වැඩිය, හැම දේකින්ම මිදීම කියන්න බෑ වචනයෙන්. මිදිල කියන වචනය කියන්න බෑ. ඒකට හේතුව අවදිමත් ගතියක් එනව හීනෙන් අවදිවෙලා වගේ. ඒ අව්ධිමත් ගතිය අභ්‍යන්තරයට දැනෙන්නෙ. ඒක කියන්න බැහැ. කියන්න ක්‍රමයක්නෑ. හැබැයි ඒ අවදිය නැතිවන්නෙ නෑ. නැති කරන්න බෑ. ඒක අවබෝධයෙන් එන්නෙ. " සංඛිත්තේ නිබ්බිදාය" කියන එක හරියටම හරි.

මේ අවබෝධයෙන් ඇතිවන අවබෝධය නැති කරන්න බෑ. කණ්ණාඩියෙ දෙයක් නෑ කියල අපට අවබෝධ වුණාට පස්සෙ ඒක කාටවත් නැති කරන්න බෑ. **ඇත්ත ලෝකයේ දෙයක් නැති බව හොඳින්ම ප්‍රත්‍යක්ෂ වෙන්න වෙන්න අර අභ්‍යන්තරයට අවබෝධයක් එනව, මෙහෙම කතා කළාට, මෙහෙම කිව්වට, මෙහෙම හිතුවට එහෙම දේවල් නැහැ.** ඇත්තටම හරි සුන්දරයි මේ කතාව. හැබැයි ඉතිං ඒ කතාව කියන්නෙ කාටද? කාටද ඒක දැනෙන්නෙ. මේක විශ්වාස කරන එකක් නෙවෙයි නේ. මේක දැනෙන්නෙ ඕන. ආර්යයන් වහන්සේලාගේ කතාව. තවත් ආර්යයන් වහන්සේ නමකට විතරයි දැනෙන්නෙ. මේක ඇත්ත කතාවක්.

ආර්යයන් වහන්සේලා කියන්නෙ ඇත්තටම සත්ත්වයෙක් පුද්ගලයෙක් නෙවෙයි. සමහර වෙලාවට අපි හයියෙන් කතා කරනව. සද්දෙන් කතා කරනව. එතකොට කවුරුත් පැහැදෙන්නෙ නෑ. කවුරුත් අපිට හොඳ කියන්නෙ නෑ. ඒක අපි දන්නව. ඒත් සමහර වෙලාවට සද්දෙන් කතා කරන එක අහල අපේ අම්ම කෙනෙක් කියනව ආර්යන් වහන්ස මම ඒකෙන් අවදි වුණා. ඒ සද්දය හරි ගාම්භීරයි. ආර්යන් වහන්සේ ඒ වගේ

සද්දෙන් කීවෙ නැත්නම් මම ඇවිස්සිලා එන්නෙ නෑ. මේ දහමට මෙහෙම තමයි ඒක කියන්න ඕන. ඒකත් ඕනි. අර හැමදේම ඕනැයි කියනව වගේ. වෙසක් කාඩ් එකයි තොරණයි, දන්සැලයි ඔක්කොම ඕනෙ කියනව වගේ. මැටි රූපයයි, බෝධියයි චෛත්‍යයි, බුදු මැදුරයි, අපේ හාමුදුරුවරුයි, ත්‍රිපිටක පොත් ටිකයි ඔක්කොම ටික ඕනි. ඇයි අර එකක්වත් එපා කියන්නෙ. ඇයි අපි දෘෂ්ටිවලට යන්නෙ. ඇයි අපි අන්තවලට යන්නෙ. අනේ අපේ හාමුදුරුවනේ හැමදේම හොඳයි. හැබැයි මේක අවබෝධ කර ගන්න. අවබෝධ කරාම එකක්වත් ප්‍රශ්න නෑ. කොහේවත් ප්‍රශ්න නෑ. ඇත්තටම ආර්යයන් වහන්සේ ගොඩක් වෙලාවට සමීපව කතාබහ කරන්නෙ බොහොම සුහදව "අම්මේ" කියල දැන් ඔබතුමාගේ කටහඬේ තියෙනව පුදුම කරුණාවන්තකමක්. ඇත්තටම අපේ තියෙන සුවිශේෂී ස්වභාවයන් ටිකක්. එකක් තමයි ආර්යයන් වහන්සේ උපක්‍රම විදියට සමහර වෙලාවට සමහර දේවල් සම්‍යයක් ප්‍රයෝග විදියට භාවිත කරනව. වචන පවා භාවිත කරනව. ඒ වචනවල ඇත්ත සොයන්න ගියොත් ඇත්තක් නෑ. හැබැයි ඒකෙ තියෙනව පණිවුඩයක්. යටින්. ඒක මොකක් හරි හේතුවක් නිසයි කියන්නෙ. ඒ කියන්නෙ අභ්‍යන්තරයට දැනෙන දෙයක් නිසයි කියන්නෙ. මොකකන්හරි සිද්ධ වෙන්න ඒකට උපනිශ්‍රය වෙන නිසා. ඒකට හේතුවෙන නිසා තමයි එහෙම කියන්නෙ. ඒකෙ නරකක් කොහේවත් නෑ.

අපට අභ්‍යන්තරයෙන්ම තියෙනව ආත්ම විශ්වාසයක්. ඒක අපේ අභ්‍යන්තරයට දැනෙන්නෙ. වචනෙට නෙවෙයි. මේ ධර්මයේ සමහර වෙලාවට මහා පුදුමාකාර ස්වභාවයන් තියෙනවා. සමහරවිට කෙනෙක් අපි නිසා වචනයක් අල්ලගෙන අපිට දොස් කියනව. සමහර වෙලාවට අපි සම්‍යයක් ප්‍රයෝග විදියට ඒ වැඩේ වෙනුවෙන් සමහර දේවල් හදල ඒ විදියට එයාගේ වැඩේ කෙරෙන විදියට දිරිමත් කරන්න වචන භාවිත කරනවා. එහෙනම් බුදුහාමුදුරුවෝ කිසාගෝතමියට අබ ඇට ගේන්න දරුව සනීප කරන්න පුළුවන් කියපු එක කාටහරි කියන්න පුළුවන්. ආ... බුදුන් වහන්සේ බොරු කිව්ව නේ. දරුවා සනීප කරන්න පුළුවන් කිව්ව නේ. ඒ වුණාට බුදුහාමුදුරුවෝ දරුව සනීප කළේ නැහැ නේ. බුදුහාමුදුරුවෝ බොරුකාරයෙක් කියල කියන්න පුළුවන්ද? එහෙම කළේ නෑ කියල බුදුහාමුදුරුවෝ බොරුකාරයෙක් නෙවෙයි. බුදුන් වහන්සේ

එහෙම කළේ කිසාගෝතමිය දිරිමත් කරන්න. නැගණිය වාඩිවෙන්න කියල කියන්නෙ පුදුමාකාර ධෛර්යයක් එනව නේද? හැමෝම එලව එලව ගිය කෙනෙකුට මළකුණක් කරේ තියාගෙන පිස්සියක් වගේ ජේතවනාරාමයට එනකොට නැගණිය වාඩිවෙන්න කියන කොට කොයිතරම් උතුම් ද? අපට දැනෙන්නෙ ඒ විදියටයි.

ඒ වගේම කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන්ගේ අම්ම, ආයෙ ගැබ්බර වෙලා ඉන්නෙ දෙව්දත්ගෙ ආරාමේ. දෙව්දත් එලවනව. බුදුන් වහන්සේ බාර ගන්නව. අන්තිමට දරුව ඉපදුණා. අවුරුදු 7න් සෝතාපන්නයි. කොහොමත් සෝතාපන්න වෙනව නේ. ඇයි ඒ කර්ම භූමිය නැහැ නේ. කර්ම භූමිය තියෙනව නම් කවුරුත් සෝතාපන්න වෙන්නෙ නෑ. ඒක කියන්න ඕන. **කර්ම භූමිය ඔළුවෙ තියා ගන්න කිසි කෙනෙක් සෝතාපන්න වෙන්නෙ නෑ.**

**දෙයක් තියෙනව කියල අරගෙන පින් කරන්න පුළුවන්. පව් කරන්න පුළුවන්.** මෙහෙම කියන එක බුද්ධාගම නෙවෙයි. අපි ඒව ගොඩක් කලින් කිව්ව. අපි පෙන්නුව පිරුවාණා පොත් වහන්සේගෙ දස ධම්ම සූත්‍රවල තියෙන්නෙ "භවිස්සති" කියල. භික්ෂුව විසින් බැහැර කළා කියල.

යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා - පාපකංවා තස්ස දායාදෝ"

තස්ස දායාදෝ භවිස්සාමීති කියල නේ කියන්නෙ. **"භවිස්සාමිති" කියන එක කර්මය භික්ෂුව භාර ගත්තා කියලද කියන්නෙ. නෑ භික්ෂුව කර්මය බැහැර කළා කියලා.**

"දිට්ඨේ දිට්ඨ මත්ථං භවිස්සති - සුතේ සුත මත්ථං භවිස්සති

විඤ්ඤාතේ විඤ්ඤාථ මත්ථං භවිස්සති **"භවිස්සති" කියන්නෙ මොකක්ද? බැහැර කළා කියල කියන්නෙ. කම්මස්ස කොම්හි කම්ම දායාදෝ - කම්ම යෝනි කම්ම බන්ධු කම්ම පටිසරණෝ යංකම්මං කවිස්සාමි කලයාණං වා පාපකංවා තස්ස දායාදෝ භවිස්සාමිති"** මොකද්ද මේ කියන්නෙ. බැහැර කරන්න කර්මය. කාටද කියන්නෙ. භික්ෂුවට කියන්නෙ. මේ කියන්නෙ පබ්බජිතේන අභිණ්හං පච්ච වෙක්ඛි තබ්බං" මේ කියන්නෙ භික්ෂුව විසින් කර්මය බැහැර කළ යුතුයි. නැත්නම් භික්ෂුවක් නෙවෙයි. අද කෝ ඒ භික්ෂුව?

අපි කියල දෙන්නම් **හේතුඵල දහම තුළ සියල්ලම සිතම වෙනව. බාහිර දෙයක් හම්බ වෙන්නෙ නෑ. එතන කර්ම ඵලයෙන් බාහිර දෙයක් තියෙනව කියල ගන්නව. තියෙන නිසා පින් කරන්නත් පුළුවන්. පව් කරන්නත් පුළුවන්. බාහිර දෙයක් තියෙනව. එතකොට හොඳ අන්තයකුයි නරක අන්තයකුයි තියෙනවා. මරුත් බඹුන් මිනිසුන් දෙවියන් සහිත මිථ්‍යාදෘෂ්ටික උන්මත්තක පෘථග්ජන භූමිය කියන්නෙ කර්ම භූමියයි. ඒකෙ 31 ලෝක ධාතුවක් තියෙනව.** ඒකෙ දිව්‍ය ලෝකයක් තියෙනව. ඒකෙ නිරයත් තියෙනව. ඉපදුණු පුංචි දරුව දන්නවද? කවුද මේව දැම්මෙ. බලන්න කවුද දැම්මෙ කියල.

ඒ කර්ම භූමිය දැමීම නිසා නේද නිවන් දකින්න බැරිවෙන්නෙ. මේක කාටවත් තේරෙන්නෙ නෑ. හැබැයි මේ දරුව ඉපදුණොත් ආරාමෙක මේ දරුවට හේතුඵල දහම දුන්නොත්, කර්ම භූමිය උගන්වන්න බෑ. එතකොට මොකද වෙන්නෙ. එයාට හේතුඵල දහම එකපාරින් ගත්තොත් මොකද වෙන්නෙ. සියල්ල හේතු නිසයි සකස් වෙන්නෙ. හේතු නැති වෙන කොට නැති වෙනව. ඇස, කන, දිව, නාසය, කය. මේ ප්‍රසාද. මේ නිසා හේතුව මේක 'ඵලය ආත්මය' හේතුඵල දහම එච්චරයි. සලායතන නිසා ආත්මයක් හැදෙනව. හැදෙන හැටි කියල දෙනව. එවිට මොකද වෙන්නෙ? ආත්මයක් නැති බව අවබෝධ වෙනව. දැන් මොකද වෙන්නෙ? අවුරුදු 7න් සෝවාන් වෙනව. හැබැයි බුදුන් වහන්සේගේ බුදුසමයට ගියහමත් ඕක තියෙනවා. නිගණ්ඨනාථපුත්තගෙ ධර්මය තමයි තිබුණෙ මහාමායා දේවියත් පන්සිල් රැක්කා පංච සීලයනේ. සත්තු මරන්න එපා. බොරු කියන්න එපා. සොරකම් කරන්න එපා. කාමයේ වරදවා හැසිරෙන්න එපා. සුරාමේරය කරන්න එපා. මේවා හොඳයි. කවුරුත් කියන්නෙ නෑ. නරකක් කියලා. ඇයි මේ? හේතුඵල දහමට මේක බලන්නකෝ. හේතුඵල දහම තුළ බාහිර සතෙක් ඉන්නවද මරන්න. බාහිර සොරකම් කරන්න දෙයක් තියෙනවද? මේ සේරම තමන්ගේ සිත නම් තමන් කාගෙ හරි ආයුෂ අඩු කරන්න ගියොත් තමන්ගෙ ආයුෂයි අඩුවන්නෙ.

**"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි"** කිව්වෙ ඇයි? මේ සේරම **චේතනා සිතුවිලි. අනුන්ගෙ ආයුෂ අඩු කරන්න සිතනව නම් තමන්ගෙ ආයුෂයි අඩුවන්නෙ. ප්‍රතිබිම්බයක් වගේ. මේ මොකද්ද මේ කියන්නෙ.**

**මේ හේතුඵල දහම. මොකක්ද හේතුඵල දහම කියන්නෙ. සිතමයි. බාහිර දෙයක් හම්බ වෙන්නෙ නෑ. හැබැයි සිතෙත් දෙයක් නෑ. මේ ඔක්කෝම සිතුවිලි. සිතනව. මේක බොරුවක්. බොරුවක් කියල තේරුම් ගත්තම මොකද වෙන්නෙ? කිසිම දේකට කම්පා වෙන්නෑ. සොරකම් කරන්න දෙයක් හම්බ වෙන්නෙ නෑ. පුදුම සංවරත්තයක් එනව. "සංවරත්තේන සීලානං" කියන තැනට එනවා.** දස සීලය රැකෙන්නෙ. දස සීලයටත් එහා ගිය ආර්ය උපෝස්ථ සීලය රැකෙන්නෙ. ඇත්තම කිව්වොත් ආර්ය කාන්ත සීලය රැකෙන්නෙ. මේ අරමුණෙ සත්‍ය දකින සීලය. උපාදානස්කන්ධයෙන් මිදෙන සීලය, මේකට වචන නෑ අපිට කියන්න. අවුරුදු 7 දරුවට තේරෙනවා. අපේ අම්මලට තේරෙන්නෙ නෑ.

ඔබට ඕන ඔබ වගේම, මහ කකුළුවා පොඩි උන්ට කෙළින් යන්න කියල දෙනව. උන් ඔක්කොම ලොකු වුණාම ඇදේට යනවා. ඒක නේ ඔබට ඕනි. මොකද ඒ ඔබේ දරුවා. අපිට කරන්න දෙයක් නැහැ. කල්‍යාණ මිත්‍රයට පුළුවන් පණිවුඩය දෙන එක විතරයි. අපි එක්ස්පෙරිමන්ට් එකක් කළා. ඒ දරුවො අදටත් දැක්කහම අපට කියනව ආර්යයන් වහන්ස ඔබ වහන්සේ නිසා මම සම්මා දිට්ඨියේ ඉන්නව. ඒ දරුවො දැන් ලොකු වෙලා. අපි කිව්වෙ ඇත්තටම බාහිර දෙයක් නෑ කියල. ඇත්තටම ආර්යයන් වහන්ස බාහිර දෙයක් නැති බව තේරුණා. ඇත්ත කතාව ඕකයි. දරුවන්ට තේරෙනවා අම්මලාට තේරෙන්නේ නැහැ. අම්මලා හැදුණු දවසට දරුවොත් හැදෙනවා.

**උපාසක**: ඔබ වහන්සේ දවසක් වෛද්‍යතුමෙකුට තදින් කතා කළා. තද වැඩියි නේද කියල හිතුණා.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම ඒ දෘෂ්ටියටනේ ගැහුවෙ නේද? ඒ පුද්ගලයෙකුට නෙවෙයි. ඒ දෘෂ්ටියටයි ගහන්නෙ. එයා ඉන්නෙ දැඩි මාන්නයක නේ. ඒ දෘෂ්ටියටයි ගැහුවෙ. ඒකට කරන්න දෙයක් නැහැ. එයා කියන එක අහන්නෙ නැහැ. එයා ගන්නෙ නැහැ. බුදුන් වහන්සේ 'තුච්ඡ පෝඨිල' කියන්නෙ ඇයි? පෝඨිල භික්ෂුවගෙ ගෝලයො රහත් වෙලා. පෝඨිල භික්ෂුව මහ මාන්නයකින් ලොකු සිවුරු ඇඳගෙන ඉස්සරහින් ඉන්නව. මහ තෙරක් විදියට පිරිවරාගෙන ඉන්නව ගෝලයො

ටික. එයාට මේ මාර්ගයවත් නෑ. ඒ කියන්නෙ රාග, ද්වේෂ, කෙළෙස් සංසිඳෙන මගවත් නෑ. දැනුමක් විතරයි තියෙන්නෙ. නමුත් අභ්‍යන්තරය එහෙම නැහැනේ. කෙළෙස් එහෙමම නේ. බුදුන් වහන්සේ තුච්ඡයි කියල කිව්වෙ පහත් වැඩක් කියලයි කිව්වෙ. එතකොට භික්ෂුවක් නෙවෙයි නේ. බුදුන් වහන්සේ එළියටම දැම්ම ජේතවනාරාමයෙන්.

මෙතන පුද්ගලයෙක් ඉන්නවද? ආත්මයක් තියෙනවද, තේරුමක් නෑ. අවංක වන්න. එළිපිට අවංකව නිර්මලව කතා කරන්න. එතන නිර්මලයි, අවංකයි. ඇත්තටම මේ දේශනා කවුරුහරි කරනව නම් සැනසුම් සුසුමන් පාවීලා කියල අපි නිතරම කියනව. හැමෝටම මහා සැනසීමක් ලැබෙන්නෙ. ඒක ඒකාන්තයි. ඇත්තටම මේ සාන්ත සුවය ගැන අපි තමා කරන්නෙ. මේ සිතින් මිදෙන තැනක්. ඒක මහා උතුම් කතාවක්. ඇත්තටම දෙයක් නැති තැන. ආත්මයක් නැති තැන. සත්වයෙක් පුද්ගලයෙක් හමුනොවන තැන. හරි සුන්දර කතාවක් නේද? මේක මහා විවෘත භාවයක් තියෙන්නෙ ඕන. ඒක හංගන්න හොඳ නෑ.

යෝගාවචරයෙක් නම් අපි කියනව නේ කමටහන් සුද්ධ කරනව කියල. සමහර වෙලාවට අපි අම්ම කෙනෙකුට කතා කරනව නේ. අම්මේ කියල ආදරෙන් කතා කරනව. පුතේ කියල දරුවකුට කතා කරනව. අපේ තියෙනව නේද ඒ ස්වභාවය. මුළු ලෝකෙටම ආදරයක් තියෙනව. අපි හැම කෙනෙකුටම දැනෙනව. ආර්යයන් වහන්සේ කෙරෙහි පුදුම විදියේ පැහැදීමක් කරුණාවක් තියෙනව. ඒක වෙන්නෙ නෑ. සාමාන්‍යයෙන් බැලුවොත් දෙයක් නොවන තැනක දෙයක් කොහේවත් තියෙන්නෙ නෑ. දුක නොවන දුකක් තියෙන්න පුළුවන්. සතුට නොවන සතුටක් තියෙන්න පුළුවන් නම් ආදරයක් නොවන ආදරයක් කතාවත් ඒකමයි. එතන ආදරයක් නැහැ. ඒකට හේතුව නාමරූපවලින් එන එකක් එන්නේ නැහැ. නාමරූප උපරුප්ජනය වෙන තැනක නාමරූප ආදර කතා නැහැ. ඒක නිසා ආර්යයන් වහන්සේලා කියන්නෙ පොදු වස්තුවක්. ආර්යයන් වහන්සේ කියන්න සුළඟ වගේ. හැබැයි ආර්යයන් වහන්සේ කියන්නෙ පෘථග්ජන හැඟීම් තියෙන කෙනෙක් නෙවෙයි. සත්වයෙක් පුද්ගලයෙක් පනවන්න බැහැ. ඒ ස්වභාවය වෙනස්. දකින්න බැරිව ඇති පෘථග්ජන කෙනාට. එක එක කෝණ තියෙනව දෘෂ්ටි තියෙනව. අන්ත තියෙනව.

ඔවුන් අන්තවල හිරවෙලා ඉන්නව. ඔවුන් ඉන්නව පෘථග්ජන භූමියේ. ඔවුන් ඉන්නව කර්ම භූමියේ. ඔවුන් ඉන්නව හොඳ කියන අන්තයක. ඉන්න ඕන කියල. ආර්යයන් වහන්සේ අන්තයක ඉන්න ඕන කියල. ආයෙත් වහන්සේට දෘෂ්ටි නැහැ. ආර්යයන් වහන්සේට නරක කිව්වත් කියන්න ඕන එක මූණටම කියල ඇති.

ආර්යයන් වහන්සේ හොඳ නෑ කියයි. ආර්යයන් වහන්සේ හරි නෑ කියයි. ආර්යයන් වහන්සේ වැරදියි කියයි. ආර්යයන් වහන්සේ හයියෙන් කෑගහනව කියයි. **ආර්යයන් වහන්සේ මෙහෙම කියන එක වැරදියි කියයි. ඔක්කොම වැරදියි. ඒත් ආර්යය භූමිය එහෙමයි. ඒකෙ හොඳ නරක අන්ත නැහැ. තියෙන්නෙ විවෘත භාවයක්. ඒ විවෘතභාවය තුළ යුතුකම් තියෙනව. යුතුකම සත්‍ය කතා කිරීමයි.** අන්තවල සිරවීම නේ. අන්තවලින් අපට පළක් නෑ. අපි හෙට මහපොළොවට පස් වුණත් අපිට එකී. අපිට දැනෙන්නෙ එච්චරයි. අපිට රකින්න දේවල් නෑ. අපිට බේරග න්න දේවල් නෑ. අපට තියෙන්නෙ පොදු අදහසක්.

මේ ධර්මය තුළ ඔබ ඔබගේ දුකින් මිදිල ඔබගේ ප්‍රශ්න විසඳලා ඔබ සාන්ත සුවයෙන් නම් කටයුතු කරන්නෙ එච්චරයි. මේ ඔක්කොම නවත්තල දාල ආර්යයන් වහන්සේ අන්ධ වනයට කැමතියි. ආර්යයන් වහන්සේ ආරණ්‍යවලට යන කොට ක්‍රමයක් තියෙනව. අපි යනව පයින් ඇවිද ගෙන. වීදි දිගේ ගිහින් කොළඹට. රෑ 12.00ට කොළඹින් බස් එකේ නගිනව. මිහින්තලයට ගියොත් එතන 5ට බස් එක නවත්වන්නෙ. උදේ 5 වෙනකම් බස් එකේ යනව. එතැනින් බැහැල යනව ගල්ලෙන් ටිකට පඩි පෙළ දිගේ යනව.

ඇත් වෙහෙරට මෙහායින් තියෙන ගල්ලෙන් ටික. එතනට ගිහින් සුළං කපොල්ල තියෙන ලෙනට ගිහින් වාඩි වෙනව. එහෙම නැත්නම් යනව පොළොන්නරුවට. අපට කියන්න පුළුවන් ගොඩක් තැන්. එක්කෝ රජගල පැත්තෙ කොහේ හරි. ආර්යයන් වහන්සේ ගොඩක් කැමති ඈත තියෙන ඔය පළාත්වලට. ඒකට හේතුවක් කියන්න දන්නෙ නෑ. සමහරවිට රෑ 12ට බස් එකට නැග්ගම එළිවෙන කොට නවත්වන දුර සමහරවිට වීදි දිගේ ගිහින් දුක් විඳින මිනිස්සුත් දිහා බලාගෙන. මේක අපි දකින කතාව

නේ. මේකත් එක්ක අපි යන්නෙ නිවන් මග නේ. ආර්යයන් වහන්සේ කැලේට ආසයි. පුංචි කාලෙ කැලේ හිටිය වගේ. බුදුන් වහන්සේ කිව්ව වගේ මේ රමණීය වන පෙත හරි සුන්දරයි. ආර්යයන් වහන්සේටත් කියන්න තියෙන්නෙ ඒ රමණීය වන පෙත හරි සුන්දරයි. මිනිස් දසුනෙන් ඈත් වෙලා මේ රමණීය වන පෙතේ ඉන්න තියෙනව නම්. එච්චරයි ඒක තමයි නේද ඇත්ත කතාව. ආර්යයන් වහන්සේ ධර්මය හෙළි කරල තියෙනව සෑහෙන දුරට. අපි හිතනව විශාල පාරාසයක් දැන් හෙළිවෙලා තියෙනව. මේක මුතු ඇට වගේ. අහුල ගන්න අය අහුල ගන්නව. මේකෙ තියෙන වටිනා සම්පත්. ඉතාම වටිනවා. නිවන් මග හොඳට විවෘත වෙලා තියෙනව. දෘෂ්ටීන් තුළ සිටින කෙනාට පේන්නෙ නැති වෙයි. දෘෂ්ටිවලින් අයිනට වුණ කෙනාට පෙනෙයි. ඒ සියල්ල මිණි මුතු වගේ වටිනව කියල තේරෙයි. ඒක තමයි ඇත්ත.

**උපාසක**: ඇත්තෙන්ම ආර්යයන් වහන්ස අපි ඔක්කොම නාමික බෞද්ධයෝ. ඔක්කොම හිරවුණේ කර්මඵල වාදයට.

**ආර්යයන් වහන්සේ:** හේතුඵල දහම තුළ ඇත්තටම දෙයක් නෑ. ඔය දිව්‍ය ලෝකෙ, බ්‍රහ්ම ලෝකෙ නිරය මේ ඔක්කොම මාරුන් බඹුන් මිනිසුන් දෙවියන් සහිත මිථ්‍යාදෘෂ්ටික උන්මත්තක පෘථග්ජන භූමියෙන් මිදුණෙ නැත්නම් 'මම සම්මා සම්බුද්ධත්වයට පත්වුණා කියල' කියන්නෙ නෑ කියල සම්බෝධි සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරනව. ඒක තමයි ඇත්ත කතාව. ඒකෙ හිරවෙලා ඉන්නකම් මිථ්‍යා දෘෂ්ටිකයි. හොඳ කියල අන්තයක් තියෙනව. කවුරුහරි හිතනව නම් හොඳ කියන අන්තයට ගිහින් හොඳ වෙනව කියල ආර්යයන් වහන්සේලාත් හොඳ වන්න ඕන. එතකොට ඔක්කොම හොඳ අය ඉන්නෙ. එහෙනම් අංගුලිමාල කවදාවත් නිවන් දකින්නෙ නෑ. දැන් අපි ගත්තොත් එහෙම හොඳ කාන්තාවො කොච්චර ඉන්න ඇද්ද ඒ කාලේ. නමුත් බලන්න අම්බපාලි ගණිකාවක්. අම්බපාලි රහත් වෙනව. අම්බපාලි රහත් වුණාට පස්සෙ කවුරුහරි කියනව නම් හොඳට හිටපු කාන්තාවො ඊර්ෂ්‍යා කරනව නම්, එයා කොහොමද මෙහෙම වෙන්නෙ, මෙයා ගණිකාවක් නේ. මෙයාට පුළුවන්ද රහත් වෙන්න, අම්බපාලියට ඒ විදියට කියපු අය සමහරවිට අදත් ඉන්නව ඇති සසරේ. මේක එහෙම සොයන්න පුළුවන් එකක් නෙවෙයි.

මේකෙ තියෙන්නෙ හිතින් මිදෙන මගක්. මේකෙ තියෙන්නෙ සත්‍ය ධර්මය අවබෝධ කරන එකක්. සිත කියල දෙයක් නැතිබව අවබෝධ කරන එකක් සිත හැදෙන හැටි අවබෝධ කරන එකක්. අවබෝධය තුළයි සියල්ල මිදෙන්නෙ. අවබෝධ කළොත් අංගුලිමාල වගේ රහත් වෙනව. මිනී දහස් ගණනක් මරල තිබ්බත් රහත් වෙනව. **අපි කියන්න කැමතියි මේ වැරදි වැඩ කරන අයට පවා ඔබ ඒ ගැන විඳවන්න එපා. ඔබ ඒකට ලතවෙන්නත් එපා. ඔබට ඊළඟ මොහොතේ සමහරවිට අතීතය නෙවෙයි තියෙන්නෙ. ඒ ප්‍රභාෂ්වරය. ඒ ප්‍රභාෂ්වරය මේ මොහොතේ වන්න පුළුවන්.**

අංගුලිමාල සූත්‍රයේ තියෙනව නේද බබාල හම්බ වෙන කොට අපේ අම්මල කියනව. ඒකෙ මොකක්ද කියන්නෙ? මම කිසි දවසක කිසි කෙනෙක් මරල නෑ කියල අධිෂ්ඨාන කරන්න කියල. ඒ කොහොමද, ඇත්තටම හැම මොහොතෙම ඒ මොහොත විතරයි. අංගුලිමාල භික්ෂුවක් විදියට මිනී මරල නෑ. අංගුලිමාල ඒ පෘථග්ජන ස්වභාවයෙන් නෙමෙයි භික්ෂුත්වය කියන්නෙ භික්ෂුත්වය කියන්නේ මේ මොහොතේ සිත ප්‍රභාෂ්වරයි. සත්‍ය දකින එක අන්න ඒ භික්ෂුව කවදාවත් මිනී මරල නෑ. **මේ මොහොතේ බුදුන් දුන් කමහටන තමයි මේ අවධිය ඇති කරන්න අංගුලිමාලට ප්‍රභාෂ්වරයි ඔබ කියන එක.**

**ඇත්තටම රහත්වෙන්න අතීතය අවශ්‍යම නැහැ. අතීතය සම්පූර්ණයෙන්ම බිමට වැටෙනව. මේ මොහොත අවබෝධ වුණොත් මේ මොහොතේ ඔබ රහත් වෙනවා. මේ ධර්මය අතිවිශිෂ්ටයි.** කවුරුහරි හිතනව නම් හොඳ කියන අන්තයට යන්න ඕන, හොඳ ඔක්කොම කරන්න ඕන. රහතන් වහන්සේ හොඳවන්න ඕන. හොඳ වැඩ විතරයි කරන්න ඕන. ඔබ තවම 'ථේර ථේරී' ගාථා දන්නෙ නෑ. තවම දන්නෙ නෑ රහතන් වහන්සේලාගේ සත්‍ය කතාව කුමක්ද කියන එක. ඒ රහතන් වහන්සේගේ ස්වභාවය තවම ඔබ අවබෝධ කරගෙන නෑ. බුදුන් වහන්සේ නීති දාන්නේ රහතන් වහන්සේලාට. පෘථග්ජනයන්ට නෙමෙයි. ඇයි ඒ? රහතන් වහන්සේලා නැත්නම් විනයකට ගන්න බැරි වුණොත් ගිහියන් රහතන් වහන්සේලාට පැහැදෙන්නෙ නෑ. අන්න ඒ ගිහියන් අපැහැදෙන එක නවත්වන්නයි රහතන් වහන්සේලාට නීති දාන්නෙ.

අවුරුදු 20ක් යනකම් නීති දාන්නෙ නෑ. එතකම් රහතන් වහන්සේලා බුදුන් වහන්සේ සමගයි කටයුතු සිද්ධ වන්නේ බොහෝ වෙලාවට. ඊට පස්සෙ එක එක විදියට පැවිදි කරන්න ගන්නව. භික්ෂූන් වහන්සේලා වැඩි වෙනව. භික්ෂූන් වහන්සේලා පෘථග්ජන ස්වභාවයෙන් ඉන්නව. එතකොට බුදුන් වහන්සේට සිද්ධ වෙනව දැන් පිරිස වැඩියි. රහතන් වහන්සේලාට අපැහැදෙන හැම තැන්වලටම නීති දානවා. අම්බලමක සැතපෙන කොට රහතන් වහන්සේ, එතන කාන්තාවක් ඉන්න කොට ගිහියන් පැහැදෙන්නෙ නැති නිසා දැම්මා ඒක අකැපයි. රහතන් වහන්සේට සුදුසු නැහැ. රාත්‍රි කාලයේ පිණ්ඩපාතේ වඩින කොට සිද්ධ වෙන අකටයුතුකම් කීපයක් දැකල බුදුන් වහන්සේ නීති දානව රාත්‍රී කාලයේ පිණ්ඩපාතයේ වැඩීම අකැපයි කියලා. බුදු සමයේ මුල් යුගයට ගියහම ගොඩක් දේවල් තියෙනව. සමහර තැනක සිටුවරයෙක් පැවිදි වෙලා රහත් භාවයට පත්වෙලා. දේපළ තියා ගන්න කෙනෙක් නෑ කියල දරුවන් ඉල්ල ගෙන එනව ගිහි කාලයේ බිසව. එතකොට දරුවෙක් දෙනව. ඒකත් බුදුන් වහන්සේ නීතියක් දානව විනය නීතියක් පනවනව.

විනය නීති පනවන්නෙ මේ රහතන් වහන්සේලාට. ඇයි මේ රහතන් වහන්සේලාට ඇත්තටම කිසිම දෙයක් "න සංඛං ගච්ඡන්ති" ගණනකට ගන්නෙ නෑ. ඊට පස්සෙ රහතන් වහන්සේලාට වෙනත් ස්වභාවයක් තියෙන්නෙ. හැබැයි ඒ ස්වභාවය තුළ ගිහියන්ගේ අපැහැදීම සිද්ධවෙන්න බෑ. රහතන් වහන්සේට කිසිම වැරැද්දක් කරන්න අවශ්‍යතාවක් නෑ. එහෙම දෙයක් පනවන්නත් බෑ. ඇත්තටම කිව්වොත් මේකේ සැබෑම ස්වභාවය දකිනව නම් කවුරුහරි සත්වයෙක්, පුද්ගලයෙක් නැති මිදුණු ස්වභාවය හරිම සැහැල්ලු ස්වභාවයක්. ඒක තුළ ඔය කථා මොකුත්නෑ. රහතන් වහන්සේලාට යම්කිසි විනයක් තියෙන්න ඕන. රහතන් වහන්සේලාගේ යුගයක් එනව නම් අනිවාර්යයෙන්ම අපි කතා කරන්නත් ඕන. රහතන් වහන්සේලා කෙසේ විය යුතුද? අල්පේච්ඡත්වයට එන්න ඕන. රහතන් වහන්සේලාට විනය හදන්නෙ නැත්නම් ඒ ආර්යය විනය නැත්නම්, ඔබ රහතෙක් නෙවෙයි. කපටියෙක් එච්චරයි අපිට කියන්න තියෙන්නෙ. පරිස්සම් වන්න. සැබෑ රහතන් වහන්සේට කවමදාවත් ඒ දේවල් කරන්න බෑ. ඒක දකින්න මේ ආර්යය භූමියට එන්න ඕන. පෘථග්ජන භූමියට ඒක දකින්න බෑ.

එහෙම නැත්නම් අපිත් කලින් වගේ ව්‍යාපාර කරගෙන ඉන්න ඕන. අපිට ඒව කරන්න බෑ. ඇත්තම කිව්වොත් ආයෙ කවදාවත් මුදල් උපයන එකක් කරන්න බෑ. අපට අවුරුදු 10ට 15ට එහා ඒව තිබුණා. අපිට දැන් ඒව බෑ. කෑලි කෑලි කපා ගෙන අරගෙන ගියත් අපට කරන්න බෑ. අපි තව කෙනෙකුට පිහිට වෙනව විතරයි. අතේ තියෙන ඔක්කොම දීල දානව. ඇට මස් ලේත් ඕන නම් දීල දාන්නම්. සුදුසු වෙලාවට ඉතුරු ටික කියන්න සූදානම්. අද ඒකට වෙලාව නෙවෙයි. ආර්යයන් වහන්සේ දවසක එළියට ඒවි. එළියට ඇවිල්ල දවසක කතාවක් කරාවි. එදාට මීටත් වඩා නොකියපු දෙයක් තියෙනව.ඒ නිසා සේරම දේවල් හෙළි කරාවි. දැනට ඇත්ත කතාව කියන්න ඕනි. ඉන්න තැනක් නෑ කියන කොට මෙහෙණින් වහන්සේලාට යන්න තැනක් නෑ කියන කොට ආරණ්‍ය හදල දෙනව. ඒ කොහොමද? ආර්යයන් වහන්සේගේ ඒ ස්වභාව දහමෙහි විශාල දායාදයන් තියෙනවා. ආර්යයන් වහන්සේට මොනවද දැනෙන්නෙ? ඒ දේ සිද්ධ වෙයි. ඒ දේ වෙනව.

ඇත්තටම ආර්යයන් වහන්සේට කවුරුහරි කිව්වොත් මෙහෙම දේවල් තියෙනව කියල ආර්යයන් වහන්සේ කාට හරි කියවල ඒ දේවල් එයාට ලැබෙන්න සලස්වනව. මේ කතාව අති නිර්මලයි. ආර්යයන් වහන්සේගේ හෘදය සාක්ෂියට එකඟව. අපට එහෙම නේ සම්මුතිය තුළ කතා කරන්න වෙන්නෙ. ඔබ කියන විදියට හෘදය සාක්ෂියට එකඟව. මේ වගේ ගොඩක් දේවල් තියෙනව. හැබැයි ඒක ඇතුළෙ නොකියන කතාවකුත් තියෙනව. ආර්යයන් වහන්සේට කිසිම දෙයක් නැත්තෙ නෑ. හැබැයි ආර්යයන් වහන්සේට කිසිම දෙයක් ඇත්තෙත් නෑ. ආර්යයන් වහන්සේට හැමදේම තියෙනව. හැබැයි ආර්යයන් වහන්සේට හැමදේම නෑ. මේ කතාවේ ලොකු තේරුමක් තියෙනව. ඇත්තටම මේක දැන් කුලියට ගත්ත වාහනේ වගේ තමයි. මේ ශරීර කූඩුව නිකම් ඔහේ වාහනයක නැගල පාවිච්චි කරනව වගේ වැඩක් සිද්ධ වෙනව. කොයි වෙලාවක හරි ඒක පොළොවට පස්වෙලා යයි. ඒකෙන් වැඩක් නෑ. මේ කියන වචන ටික ඒ ටිකට වඩා වැදගත් වේවි.

ඒක තමයි හොඳ. හැම දෙයක්ම අයිනට වෙලා බොහොම සාන්ත සුවයෙන් ඉන්න ඕන. ඇත්තටම එළිකරගෙන ආව ගමන තවම

නැවැත්තුවෙ නැහැ. වේගයෙන් යනව තවම තව ටිකක් අපට තේරෙනව මෙහෙම කළොත් හොඳයි කියල. කොච්චර මොන දේවල් කවුරු කීවත්, කොහොමහරි බලනව උත්සාහ කරනව. ස්වභාව දහම නේ. කෙනෙක් නැහැනේ. පුද්ගලයෙක් නැහැනේ. ශරීර ධාතුව පොළොවට පස්වෙනව. මේ ධර්මය ඔබ ගන්න. මේ ධර්මය හරි නිර්මලයි. හරි සුන්දරයි. හේතුඵල දහම කියන කොට කර්ම ඵලය ගැන කතා තියෙන අය කොච්චර කම්පා වෙනවද? කර්මය තියෙනව කියල දේවාල හදාගෙන පන්සල්වල කර්මය කරන්න හදාගෙන පින් කරන්න හදාගෙන අන්තිමට එක එක දේවල් හදාගෙන ඕව කියල තේරුමක් නෑ. හේතුඵල දහම තුළ ඇත්තටම දෙයක් හම්බ වෙන්නෙ නෑ.

අපි දන්න සුන්දරම සූත්‍රය තමයි 'ප්‍රථම නිබ්බාන' සූත්‍රය. ඇයි ඒ? න පඨවි න තේජෝ. න වායෝ න ආකාසඤ්ඤායතන.. න විඤ්ඤායතන.. නායං ලෝකෝ.. මොලොවක් නෑ කියන කොට අපි ආපු පාර හොඳටම කියවෙනවා. "න පරලෝකෝ" පරලොවක් නෑ. "න උභෝ චන්දිම සූරියෝ" සඳ හිරු කියල දෙයක් නෑ. න ගතිං න ඨිතිං... න අපටිත්තං න අපවත්තං න අණාරම්මණං ඒ සොවන්තෝ දුක්ඛස්සාටී" මෙයයි මහණෙනි දුකින් මිදීම කියල. කොයිතරම් සුන්දරද? ආයෙ ඉපදීමක් නෑ. මරණයක් නෑ. ඒමක් නෑ. යාමක් නෑ. සිටීමක් නෑ. ඊට වැඩිය දෙයක් තියෙනවද? සුන්දරම සූත්‍රය, ප්‍රථම නිබ්බාණ සූත්‍රය හරි සුන්දර කතාවක් ඕකෙ තියෙන්නෙ. ඒ කියන්නෙ ආරම්මණයකුත් නෑ ඒමක් නෑ. යාමක් නෑ. සිටීමක් නෑ. පැවැත්මක් නෑ. මේව අහගෙන අපේ අය කර්මය තුළ හිරවෙලා ඉන්නව නේ. හොඳ කියල දේවල්, නරක කියල දේවල් තියෙනව කියල. මෙතන තියෙන්නෙ සිද්ධියක් විතරයි. සිද්ධියකුත් නෑ. ඇත්තටම හරි සුන්දරයි. මොහොත දකිනව නම් මොහොතක් නෑ. ඇත්තටම විඳවන්න කිසිම දෙයක් නෑ. පසුතැවෙන්න ලතැවෙන්න කිසි දෙයක් හම්බවෙන්නෙ නෑ. හරි සුන්දර කතාවක්. එතනට එන්න පුළුවන් නම් කොච්චර වටිනවද?

සම්මුතිය තුළ දරුවෝ ගෙවල් දොරවල් යාන වාහන මිල මුදල් ඔබට ජීවත් වෙන්න ඔය එකකටවත් මේ දහම බාධාවක් නෑ. මේ දහම තුළ ඔබ විශාඛා වගේ සිටු දියණියක් වුණත් සෝතාපන්න වෙනවා. ධර්මය

අවබෝධ වෙනවා. කුජ්ජුත්තරා වගේ වැඩකාර මෙහෙසියක් වුණත් ඔබට මේ දහම අවබෝධ වෙනවා. මේකෙ තියෙන්නෙ ඔබට අවබෝධ කරන්න විතරයි සද්ධර්ම ශ්‍රවණය, මේකෙ ප්‍රධානම තැන තියෙන්නෙ කල්‍යාණ මිත්‍රයාගේ පණිවුඩය. මේක ඔබට ප්‍රත්‍යක්ෂ වෙනවා. ඇතුළෙන් දකින්න. මේකයි සුන්දරම කතාව. ඔබ අහන්න. ඊට වැඩිය ඔබට ලෝකෙකුත් නෑ. මේ කතාවම තමයි තියෙන්නෙ. "ධම්මං විනා නත්ථි පිතාච මාතා" කිව්ව වගේ නිස්සත්ථෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ කිව්වෙ ඒකයි. මෙහෙම කිව්වට වැඩක් නෑ. අවබෝධ කරගන්නම ඕන.

තෙරුවන් සරණයි.

# 05

# 'ලෝකය' යනු සැබෑ නොවූ සිහිනයක් පමණි

**උපාසිකා:** ආර්යයන් වහන්ස 'ජබ්බි සෝදන' කිව්වම අකුර එනකොටමම සිතට ආවා ඡපන්නක සූත්‍රය. ඒකෙ සත්තු 6 දෙනා 6 පැත්තට අදින ආයතන හය. එතන මට දැන් චිත්ත රූප මැවෙනව. දැන් මේ ආයතන 6 වෙනුවට සත්තු 6 දෙනෙක් බලය තියෙන පැත්තට ඇදල යන්න කියන එක. ඒක සිහියට එනවත් එක්කම ආවා එතන එහෙම දෙයක් නැහැනේ කියනඑක. ඒක චිත්තයක් නේ. ඔබ වහන්සේ අදත් විස්තර කළේ සංඥාවක්නේ එතන කිසිම දෙයක් නැහැනේ කියල. මේ ආයතවලට එන ඒවත් දැනීමක් මිස ඒක ඇත්තටම විස්තර කරන්න බැරි දෙයක් නේද කියල. අප රස්නය කිව්වත් සද්දයක් නේ. එහෙම රස්නයකුත් නැහැනේ කියන එකත් තදින් දැනුන මෙතන චිත්තය කියන එක නේද කියන එක.

**ආර්යයන් වහන්සේ:** චිත්ත කියන්නෙ මෙතන සංඥාවක්. සංඥාවක් කියන්නෙ දැනීමක් විතරයි. ඒ කියන්නෙ සංඥාවමයි විඤ්ඤාණය. සංඥාව කියන එක ඇවිල්ල අපි පෙන්නුවේ ඒකයි වේදනාවක් නැතුව සංඥාවක් නැහැ කියල. වේදනාවේ නිරූපණයන් සංඥාව කියන්නෙ. සංඥා වේදනා එකට මිසක් වෙන් වෙන්නෙ නෑ කවදාවත්. ඒ කියන්නෙ වේදනාවකින් තොර සංඥාවක් නෑ. "යං වේදයිති තං සංජානාති" ඒ කියන්නෙ විඳීමක් කියන්නෙ සැප දුක් නෙවෙයි. දැන් කිරණයක් වුවත් ඒක දැනෙන එකට තමයි සංඥාවක් දැනෙන්නෙ. ආලෝකය වුණත් සංඥාවක්. ශබ්දයක් වුණත් සංඥාවක්. වර්ණයක් වුණත් සංඥාවක්. සංඥාවක් කියන්නෙ චින්තනයක් කියන එක. සංඥාවක් කියන්නෙ මේක

දැනෙන එකක් දේදුන්න වගේ. ශබ්ද සංඥාව කියන්නෙ චිත්තයක්. ඒ කියන්නෙ මේකෙ සෙන්සර් එකක්. සෙන්සර් එකින් එක ඉලිප්පීමක්. ඉලිප්පීමක් කියෙන්නෙ රුප්පනයක්. කරන්ට් එකක් වගේ චිත්තයක්. හැබැයි කරන්ට් එකක් කියල එක සමාන නෑ. කරන්ට් එක කියන එක වෙනමම ස්වභාවයක්. සිතක් කියන්නෙ ඒ වගේ ඒ වුණාට ආරෝපණයක්. ඒ කියන්නෙ චුම්භක ආරෝපණය. විද්‍යුත් ආරෝපණය චිත්ත ආරෝපණය එවේලෙම දැනෙන එකක් සංඥාවක්. දැන් ශබ්ද සංඥාවක්, සංඥාවක් කියන්නෙ චිත්තයක්. චිත්තයක සද්ද නෑ. සද්දයක් කියන්නෙ කන් බෙරය සෙලවෙන එකෙන් එන 'වයිබ්‍රේෂන්' එක. ඒක කම්පනයක්. තරංගයක්. ඒක සංඥාවක් විදියට බැලුවොත් සංඥාවක් කියන්නෙ කරන්ට් එකක් කියන කොට ඒකෙන් ඇතිවන කරන්ට් එක නිසා අපට පුළුවන් ෆෑන් එකක් දාන්න. හැබැයි ෆෑන් එක වැඩ කරන්නෙ නෑ කරන්ට් එක නැත්නම්. මේ වගේ මේක ඇවිල්ල පටිඝ සම්පස්සයට අධිවචන සම්ඵස්සයක් කියන තැනින් එන්නෙ.

**සංඥාවට හේතුව ස්පර්ශයයි. ස්පර්ශය කියන එකක් නැතුව සංඥාවකුත් නෑ.** එතකොට මේක දිගුවක්. මේ කියන්නෙ සංඥාවක් කියන එක වේගෙට සකස් වෙනව කියන්නෙත් ඔන්න ඔය නිසාමය. ඒ කියන්නෙ **ස්කන්ධ විග්‍රහයේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ. එතකොට සංඛාර කියන්නෙ මේක නැවත නැවත එකම සංඥාව බලගැන්වෙනව. ඒකම තමයි විඤ්ඤාණය කියන්නෙ.** එතකොට මේ ඔක්කොම එකම දිගුවක් කියන්නෙ. රුප්පනයක් තමයි මේකෙ වෙන්නෙ. රුප්පනය තමයි රූප වේදනා කියන්නෙ වේදනාව රුප්පනය නිසයි. වේදනාව රුප්පණය කියන්නෙ ශබ්දයක්. ශබ්දයක් රුප්පනයක්. ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප රස රූප පොට්ඨබ්බ රූප. එතකොට ඇසුරු කරන්නෙ කරන්ට් එකක් වගේ එකක්. වෙන විදියක් නෑ මේක පෙන්වන්න. ඇත්තටම චිත්තයක් සංඥා. **සංඥා කියන ඒවා එළියෙ තියෙන ඒවා නෙවෙයි. සංඥා කොහේවත් තියෙන ඒවා නෙවෙයි. සංඥා කියන්නෙ චිත්තයක්. චිත්ත ස්වභාවයක්.** චිත්ත ස්වභාවයක් කියන කොට මේක ශබ්ද සංඥා වර්ණ සංඥා, ගන්ධ සංඥා රස සංඥා පොට්ඨබ්බ සංඥා උණුසුමත් සංඥාවක්. ගඳත් සංඥාවක්. රසත් සංඥාවක්.

සද්දෙත් සංඥාවක්. වර්ණයත් සංඥාවක්. **සංඥාවක් කියන්නෙ ස්නායු පද්ධතිය ඔස්සේ දුවන කරන්ට් එක වගේ එකක්.**

ඒකයි මේ '**නානත්ථ සංඥා**' එකතු වෙලා '**ඒකත්ථ සංඥාවක්**' පෙන්වන්නෙ හේතුව. **ඒ කියන්නෙ මොන පාට පාට තිබුණත්, සුදු පාට ඇතුළෙ ඔක්කොම පාට තියෙනව මෙන්න මේ කතාවේ සුදුපාට වලින් තමයි අනිත් පාට හැදෙන්නෙ, මෙන්න මේ වගේ. මේක අලියගේ පාද ලාංඡනය ඇතුළෙ සේරම සතුන්ගෙ පාද ලාංඡනය තියෙනව වගේ.** ඒ කියන්නෙ කරන්ට් එක තියෙනව නම් සීතල හදන්නත් පුළුවන්. රස්නය හදන්නත් පුළුවන්. ඕනම එකක් හදන්න පුළුවන්. කරන්ට් එකක් තියෙනව නම්. බලන්න ෆෑන් එකක් දාන්න. ළිපක් පත්තු කරන්න. හැබැයි කරන්ට් එක නැතුව බැහැනේ. මේක හරියට ශබ්ද සංඥාවේ ශබ්ද නෑ කියන කොට, ඒකත් චිත්තයක් කියන්නෙ සංඥාවක් කියන එක හීනයක් පේනව වගේ. හීනෙන් අපිට පේනව. හීනෙන් අපිට ඇහෙනව. හීනෙන් අපි චිත්‍රපටියක් දකිනව වගේ ඇත්ත වගේ පේනව, හීනෙත් ඇත්ත වගේ. හීනයක් තුළ ඇත්තක් නෑ, හැබැයි ඇත්ත ලෝකයත් හීනයක්. සේරම සංඥාවක් විතරයි. දැන් මෙතන කවුරුහරි ඉන්නව. කතා කරනව, පේනව ඇහෙනව ඔක්කොම පේනව සේරම දකිනව කියමු. ශබ්ද වර්ණ ඔක්කොම මේ මොහොතේ හැමදේ, ඒක් සංඥාවක් විතරයි. දුකක් දැනුණා කියමු. ඒකත් සංඥාවක් විතරයි. අපි තිබූ ආත්මයක් තියෙනවා වගේ දැනෙනවා කියලා ඒක සංඥාවක් විතරයි.

සංඥාව තමයි විඥ්ඥාණය කියන්නේ. සංඥාව බලගැනුණු අවස්ථාව විඥ්ඥානය කියන්නේ. මේ සිතුවිලිත් සංඥාවක් විතරයි. හැම එකම සංඥාවක් විතරයි. හැම එකම සංඥාවක් විතරයි කියන්නෙ, සංඥාව කියන්නෙ ශබ්දත් නෙමෙයි වර්ණත් නොවෙයි ගන්ධත් නොවෙයි රසත් නොවෙයි, මොකක්වත් නෙවෙයි. කරන්ට් එකක් වගේ එකක්. මේකයි ඒකත්ථ සංඥා කියන්නේ දැන් දරුව කියන්නෙත් සංඥාවක්. අම්ම කියන්නෙත් සංඥාවක්. මහත්තය කියන්නෙත් සංඥාවක්. සංඥාවක් කියන්නේ තමන්ගෙ සිතේ ඉන්නෙ දරුවා. තමන්ගෙ හිතේනෙ ඉන්නෙ මහත්තයා. තමන්ගෙ හිතේනේ ඉන්නෙ අම්මා. **තමන්ගෙ හිතේනේ සල්ලිත් තියෙනව කියන්නෙ. තමන්ගෙ හිතේනේ තියෙන්නෙ සල්ලි නෑ කියල.** එතකොට හිත කියන්නෙ මොකක්ද? සංඥාවටයි.

දුක හිතුණත් සංඥාවක්. සතුටක් දැනුණත් සංඥාවක්. ඒක කරන්ට් එක වගේ. ඒක කියන්න වෙන වචනත් නෑ. අර ඔක්කෝම තියෙනව මේක ඇතුළෙ. සංඥාවක් කියන්නෙ සංඥාවක්. සංඥාවක කිසිම දෙයක් නෑ. සංඥාවක කිසිම දෙයක් පනවන්න බෑ. සංඥාව කියන්නෙ හීනයක් වගේ. දැන් අපි චිත්‍රපටියක් දකිනවා, චිත්‍රපටිය දකින කොට ඒ චිත්‍රපටිය ඇතුළෙ මොකුත් නැහැනේ. හැබැයි චිත්‍රපටිය තුළ ඔක්කොම පේනව නේ. මෙන්න මේ වගේ. සංඥාවක් කියන කොට මොකුත් නෑ එතන. සද්දත් නෑ. වර්ණත් නෑ. ගඳත් නෑ, රසත් නෑ, දුකත් නෑ. සතුටත් නෑ. කිසි දෙයක් නෑ. හැබැයි අර චිත්‍රටිය පේනව වගේ ඒ සේරම තියෙනව. සංඥාවක් විදියට. ඒ කියන්නෙ සංඥාවට අර කතාව නෑ ඕලාරික ශබ්ද වර්ණ කතාව නෑ. හැබැයි ඒක සංඥාවක් විතරයි. මේක හරියට සිම් කාඩ් එකක් හදනව වගේ. **සිම් කාඩ් එක දාල ඊට පස්සෙ අපි කලින් කිව්ව ශබ්ද වර්ණ ටික එකතු කරල ප්‍රෙෂ් කරල සිම් කාඩ් එකක් හැදුවොත් ඒ සිම් කාඩ් එක කොහේ හරි ගැහුවොත් ඔක්කොම ටික වැඩ කරනව කියල මේක සංඥාවක් විතරයි.** හැම එකක්ම සංඥාවක් විදියටයි අපට ඊට පස්සේ මතු වන්නේ. පරණ ඒව මතක් වෙනව. ඒකත් සංඥාවක් විතරයි. මේක 'කන්වර්ට්' වෙනව වෙනත් ශක්ති ස්වභාවයක් බවට කිව්වොත් හරි. නමුත් වචනය කියන්න බෑ. ඒ වචනය කිව්වොත් ඒකත් වැරදියි. හැබැයි මෙතන එහෙම දෙයක් නෑ. ශක්ති ස්වභාවයක් කිව්වත් දෙයක් තියෙනව වගේ වෙනව. එහෙම දෙයක් නෑ. හේතු තිබ්බොත් සකස් වෙනව වගේ, හේතු නැත්නම් නැති වෙනව කියන එක හරියට හරි. "හේතුං පටිච්ච සම්භූතා"

කලින් ස්පාර්ක් එකක් වුණා නම්, ඒ වගේ තවත් ස්පාර්ක් එකක් ආයේ සකස් වෙන්න පුළුවන්. ඒ කියන්නෙ ඒක සංඥාවක් විදියට සකස් වෙන හේතු වෙනව. මේක දැක්මකින් කියන්නෙ. මේක කියන්නෙ මස් ඇසකින් මුකුත් පෙනෙන එකකින් නෙවෙයි. මේක නුවණට හසුවෙනව. මේ සංඥාව කියන එක තමයි අපි ඇසුරු කරන්නෙ. ඒක හීනයක්. හීනයක කිසිම දෙයක් නෑ. හීනයක සද්දත් නෑ වර්ණත් නෑ. හැබැයි ඇත්ත ලෝකයත් හීනයක්මයි. ඒ කියන්නෙ සංඥාව නිසයි. දරුව කියල හිතනව කියන්නෙ සංඥාව ඇසුරු කරන නිසයි. ශබ්දය කියල අපට ශබ්දයක් කියල කනෙන් මෙහෙන් ඕලාරිකව දුන්නට, ඒක ඊට පස්සෙ අපි

හිතන එකක් තියෙන්නෙ. එතකොට ඒ ශබ්දය පවා සංඥාවක් විදියටයි තියෙන්නෙ. පූසා කියන කොට පූසා කියන ශබ්දය පවා සංඥාවක්. පූසා කියල තව කවුරුහරි ශබ්දයක් දැම්මොත් අපිට ශබ්ද වර්ණ ඔක්කොම එකතු වුණ සංඥාව සකස් වෙනව.

දැන් මේ මොහොතෙ බලන් ඉන්න කොට ඇහෙන, පෙනෙන, දැනෙන සේරම එක ෂොට් එකක් ගහනව වගේ කියල අපි කියනව ඔය ලොවම දෙදරයි කියන දේශනාවල. ඒක කියනව තාත්තට 11000ක් ස්පාර්ක් වෙනව, දරුවට 5000ක් ස්පාර්ක් වෙනව කියල. ඒ කියන්නෙ මෙන්න මේ ස්පාර්ක් එක, සංඥාව කියන්නෙ. **පොඩි කාලේ ඉඳන් වෙච්ච සේරම ස්පාර්ක් වුණ ඒවා මේ එක මොහොතෙ සංඥාව තියෙනවා. ලෝකෙම තියෙන ඒවා සංඥාවේ සකස් වෙන්නෙ ඒ මොහොතෙමයි සකස් වන්නෙ. ඒ මොහොතෙමයි ඇතිවන්නෙ.** කරන්ට් එක 33,000 කිව්වත්, 5000 කිව්වත්, 200 කිව්වත්, කරන්ට් එක, ඕලාරිකව ගොඩක් කියල පෙන්වන්න ක්‍රමයක් නෑ. හැබැයි වැදුණොත් වදිනවා. ඒ වගේ මේකට අංශුවක් වත් නෑ සංඥාවට, චිත්තයක් විතරයි. මුළු සංඥාවම එක සංඥාවෙ තියනව. ඝණ සංඥා කිව්වෙ ඒකයි. **ඝන සංඥාව ඇතුලේ ඔක්කොම සංඥා ටික තියෙනවා. හැබැයි ඒක 'සුඛුම' වෙනව කියන්නෙ අර සේරම ටික තියෙනව කියල ගත්ත ඉත්ථ සංඥාව බිඳ වැටෙන කොට, ඉත්ථ සංඥාව ඇතුළෙ ට්‍රිලියන ගාණක තිබුණ 'ඩේටාවල' තිබුණ අගය වටිනාකම 'වැලිව්' එක 'කරන්ට්' එක බහිනව. එතකොට ස්පාර්ක් වෙන්නෙ නෑ. ඒකයි රූප්පනය වෙන්නෙ නෑ කිව්වෙ.** ඒකයි ඡන්ද රාගය දුරු වෙනව කිව්වෙ. එතකොට සංඥාව බලගැන්වෙන්නෙ නෑ. ඒ සංඥාව බලගැන්වෙන එක තමයි තරංගය වගේ ආයෙත් තව තැනක සකස් වන්නෙ. තරංග සිස්ටම් එකෙන්.

'සිරස' මෙහේ අල්ලනව කියන්නෙ, යාපනෙත් අල්ලනව කියන්නෙ. අමෙරිකාවත් අල්ලනව කියන්නෙ. හැබැයි සිරස අහුවෙන්නෙ නෑ කියන්නෙ, **අපි කියන්නෙ මෙතන ධර්මය අවබෝධ කරපු කෙනාට ලෝකයක් තියෙන බවට දැනෙන්නෙ නෑ. ඔක්කොම අවබෝධ වෙනව මේක බොරුවක් කියල. ශබ්ද වර්ණවලින් හැදෙන එක අම්ම, තාත්ත කියලවත් අගයක් එන්නෙ නෑ. දරුව කියලවත් අගයක් එන්නෙ නෑ.**

**ඒ කියන්නෙ වටිනාකමක් එන්නෙ නෑ. ගින්නක් නෑ. පත්තු වෙන්නෙ නෑ. එතකොට සමානයයෙන් නියුට්‍රල් වුණා වගේ 'නිෂ්ක්‍රීයයි.'** හැබැයි සාමාන්‍ය විදියට කතාබහ කරන ඒවා ඔක්කොම සංඥා සිස්ටම් එකට වගේ වැඩ කරන්නෙ. 'ඩේටා බේස්' එකක් විතරයි. ඒකෙ 'වැලිව්' එකක් නෑ. අර කාම භූමිය බිඳ වැටුණා කියන්නෙ, ඒකෙ වටිනාකම නැති වෙනවා. එතකොට රූප සංඥා කියන්නෙත් කාම සංඥා කියන්නෙ ඒකෙ අගයක් දීල තියෙනව. ඒක බිඳ වැටෙන කොට ඊගාවට එන්නෙ ඊළඟ අවස්ථාව. **ඒ කියන්නෙ ඒක රූප සංඥාවලින් තමයි අගය ඇතිවෙලා තියෙන්නෙ. රූප සංඥාත් බිඳ වැටෙන කොට අන්න එකම සංඥාව අරූප සංඥාවට එනව ඔක්කොම කරන්ට් එකක් වගේ දැනෙන තැනක්.**

**දැනෙනව විතරයි, කම්පනයක් විතරයි තියෙන්නෙ අවසානයේ කරන්ට් එක දැක්ක වගේ වෙනවා සංඥාව දකින එක.** මේක අති ගැඹුරුයි. **එතන තමයි අපිට අකම්පිත ස්වභාවය එන්නෙ.** එතකොට දහම තුළ ගොඩක් අවබෝධයක් තියෙනව. ඇත්තටම එතකොට ඕලාරික වෙන ඒවා නැහැ. ඒ ඕලාරික කතාවලට කොටු වෙන්නේ නැහැ. එතකොට තැන්පත් වෙනවා. විතක්ක අඩුවෙනවා. ගොඩාක් දේවල්වල පරිවර්තනයක් සිද්ධ වනවා. 'වැලිව්' එක කොහොමත් එන්නේ නැහැ. අගය එන්නේ නැහැ. වටිනාකම එන්නේ නැහැ. ඡන්ද රාගය දුරු වෙනවා. රස, පටිසංවේදී රස රාග න පටිසංවේදී කියල. 'පටිසංවේදීතාව' කියන්නෙ අපට දැනෙන ස්වභාවය නේ. ඒක දුරු වෙනවා. "රස පටිසංවේදී රස රාග න පටිසංවේදී" ඒකට තියෙන ඇල්ම නෑ. තණ්හාව නැති වෙනවා නන්දිය නැති වෙනවා කියන තැන. "තණ්හක්ඛයෝ නිබ්බානෝ" එතනමයි එන්නෙ.

***උපාසිකා***: ඇහැ ඇරෙන කොටම ලෝකය මැවෙනවා කියන්නෙ එක ආයතනයක් ඇරෙන කොට ඔක්කොම සංඥා ටික තියෙනවා කියන එක නේද? ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** නෑ නෑ නෑ ඉත්ථ සංඥාවක් එන්නෙ සත්ව සංඥාවක්, තියෙනව කියන සංඥාව විතරයි එන්නෙ. එක ආයතනයකින් එන්නෙත් ඒකමයි. ආයතන පහෙන්ම එන්නෙත් එකමයි. ඉත්ථ සංඥාවක් විතරයි තියෙනව වගේ දැනෙන එකක් එනව. ඒකයි කරන්ට් එක. ඒකයි මේ ආත්මය ඇහෙන් හැදෙන එකමයි ඒකමයි කනෙන් හැදෙන්නෙත්.

අඹ ගහේ කොළ 5000ක් තිබුනට එක අඹ කොළේ හරියට දැක්කොත් කොළ 5000ම දැක්කා කියන එක. ඇස කියන තැන එන සිද්ධිය සංඥාව සකස් වෙන එක සිද්ධිය කොතනින් ආවත් එන්නෙ ඉත්ථ සංඥාවක්. ඒ කියන්නෙ තියෙනව කියන සංඥාව. ඉත්ථ සංඥාවක් එන්නේ ඇසට එන ආලෝකයත් ඉත්ථ සංඥාවක් දෙනව. කණට එන ශබ්දෙත් ඉත්ථ සංඥාවක් දෙන්නේ තියෙනව කියන සංඥාව. තියෙනව කියන සංඥාවමයි බිඳ වැටෙන්නෙ. තියෙනව කියන ඉත්ථ සංඥාව එතන බිඳ වැටෙන කොට අනිත්‍ය සංඥාව එනව කියන්නෙ ඒකයි. නිත්‍ය කියල එහෙම කිය කියා ඉන්න එකක් නෙවෙයි. ඉත්ථ සංඥාව බිඳ වැටීමමයි අනිත්‍ය සංඥාව. අනිත්‍ය සංඥාව එහෙම කාටවත් ගන්න පුළුවන් එකක් නෙවෙයි. හිතල ගන්න පුළුවන් එකක් නෙවෙයි. මේ අවබෝධය තුළයි ඉත්ථ සංඥාව බිඳ වැටෙන්නෙ.

"සංඛිත්තේ නිබ්බිදාය" ඒ අවබෝධය තුළ අනිත්‍ය සංඥාව මතුවෙනවා. ඉත්ථ සංඥාව බිඳ වැටෙනව. ඒකයි තථාගත කියල කියන්නෙ. 'ඉත්ථ' 'ථතා' 'ඉත්ථත්වය', තථාගත කියන කොට ඉත්ථභාවය බිඳ වැටිල සත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ වැටිල සත්ව කථාව නැතිවෙලා අනාත්ම ධර්මයට එනව. සත්වයෙක් පුද්ගලයෙක් හමුවන්නේ නැහැ. මේක අවබෝධයෙන් එන්නෙ. "සංඛිත්තේ නිබ්බිදාය" කිව්වෙත් ඒකයි. මේක අවබෝධ කරන ධර්මයක්. මේක භාවනා කරල කරන්න පුළුවන් එකක් නෙවෙයි. මේකට විදර්ශනා භාවනාව කියල කියන්න හේතුවක් තියෙනව. විපස්සනා ඛණික සමාධිය. මොකද මෙතන සමාධියක් උපදිනව. මේ උපදින සමාධිය සේරගෙන්ම මිදුණ සමාධියක්.චේතෝ විමුක්තියක් උපදිනව. 'චිත්ත' විමුක්තියක්. ඒකයි චේතෝ විමුක්තිය කියල කිව්වෙ. ඒ චේතෝ විමුක්තිය තුළ චිත්ත ස්වභාවවල බලගැන්වීමයිනැති වෙන්නෙ ඒකෙ වටිනාකමක් නැහැ. හරයක් නැහැ ආත්ම සංඥාව බිඳ වැටෙන තැන. ඒ ටික පැහැදිලියි. ඔය කියපු සූත්‍රය තමයි ඡපන්නායක සූත්‍රය. ඒ කියන්නෙ වලිග ටික ගැට ගහල සත්තු 6 දෙනෙක්ගෙ එක සතෙක් එක පැත්තකට අදින කොට ඔක්කොම සත්තු ඇදෙනව කියන එක. හැබැයි මේක යෝගාවචරයාට විතරයි වැදගත් වන්නෙ. යෝගාවචර භූමියේ ආයතන ටික ඇදගෙන යන හින්දා එයා ආයතනයේ බැසගෙන ඉන්න කෙනෙක්. මූලික අවස්ථාව. ආයතනයෙන් මිදිල නෑ. හැබැයි ආයතනයෙන්

මිදුණ අවස්ථාව මීට වැඩිය ගැඹුරු තැනින් පෙන්නුවා. හැබැයි ඒකට කලින් අවස්ථාවක් තමයි 'ඡපන්නායක සූත්‍රයේ' පෙන්වන්නෙ. සළායතන ආයතන ඇඳ ගන්න එක. රූප දර්ශනයට ඇදගෙන ඉන්න එක හැම තිස්සෙම. එක ආයතනයකින් ඇදගෙන යනවා කියන එක. ඒක මූලික අවස්ථාවක්. ඡපන්නායක සූත්‍රයේ තියෙන්නෙ. හැබැයි කිංසුඛසෝම සූත්‍රයට ගියහම පෙන්වනව එන පණිවුඩය වැරදියි කියල. ඒ කියන්නෙ මේකෙ අනිත්‍ය සංඥාව, ඉත්ථ සංඥාව බිඳ වැටෙන එක.

මෙකෙ හැම තිස්සෙම දෙන්නෙ ඉත්ථ සංඥාවක් නේ. ශබ්දයක් ආවත් කිංසුඛෝපම තියෙනව. වර්ණයක් ආවත් තියෙනව. ඒක තමයි කිංසුඛෝපම සූත්‍රයේ පෙන්වන්නෙ. තියෙනව කියල ගන්න නිසයි සත්තු 6 දෙනාගෙන් එක සතෙක් ප්‍රකට වෙනව කියන්නෙ. එක ආයතනයක් තියෙනව කියල ගන්නව ඒ කිංසුඛෝපම සූත්‍රයත්, ඡපන්නායක සූත්‍රයත් එකටයි යන්නෙ. ඒ කියන්නෙ මාර්ගයේ යන ආකාරය. මාර්ගයේ යන ආකාරය කියන්නෙ, කෘත්‍ය ඥානය තුළ තියෙන්නෙ. අවබෝධ කරපු ධර්මය ඊට පස්සෙ ආයතන දකින කොට මේක පේන්න ගන්නව. ඡපන්නායක සූත්‍රයත් පේන්න ගන්නව. කිංසුඛෝපම සූත්‍රයත් පේන්න ගන්නව. එතකොට දෙන සංඥාව වැරදියි ඉත්ථ සංඥා. හරි සංඥාව තමයි මේකෙ එහෙම දෙයක් නෑ අනිත්‍ය සංඥාව. ඒක මතුවෙන්නෙ යථාභූත ඥානයයි. යෝනිසෝමනසිකාරයයි. "යථාභූතං පජානාති" කියන තැනින් ධර්මය දකින්නෙ. ඔය පැහැදිලි කිරීම හරිම නිර්මලයි. නිවන් මගට උපනිශ්‍රය වෙනවා. නිවන් මග විවර වෙනව. ගොඩාක් වටිනව. ආයතන නිරෝධය දකින්න අර ඕභාසය මතුකර ගන්නෙ රූප දර්ශනයෙන් මිදෙන්නයි මේ ටික ඕන වෙන්න. රූප දර්ශනයනේ මතුවෙලා තියෙන්නෙ. ඒකනේ අප හිරවෙලා ඉන්නෙ. එතනින් මිදෙන්න මේ ටික ඕන. පැහැදිලියි නේද එහෙම නම් හොඳයි.

# 06

# මරුවාට අසුවිය නොහැකි තැනක් තිස්එක් ලෝකධාතුවෙහිම නැත

**උපාසිකා:** සද්දය, වර්ණය එහාට ගිය තැන දැනෙනවා. අවසානයේ කම්පන ස්වභාවය විතරයි කියන එක හොඳටම දැනෙනව ආර්යයන් වහන්ස. ඒ කියන්නෙ කම්පන ස්වභාවය තමා අපට දැනෙන්නේ. අපට මාරු කර කර ෆීලින්ග්ස් ගන්න පුළුවන් නේද කියල මම ප්‍රශ්නයක් ඇහුවා. දුකක් ඕනෙ නම් අරමුණ මාරු කරල ඒ කම්පනය ගත්ත හැකියි.

**ආර්යයන් වහන්සේ:** ඒ කියන්නෙ අපිට පුළුවන් හිතල දුක් වෙන්නත් පුළුවන්. සමහර ළමයි අඬන කොට හිත හිතා අඬන්නෙ ඒ ක්‍රමයට. අම්මලගේ ආදරය දිනාගන්න ඕන වුණාම හිත හිතා අඬන්නේ. හිතල දුක ගන්න පුළුවන්. ඒක හරි. හිතල සතුට ගන්න පුළුවන්. හැබැයි ඒක සිතුවිල්ලෙන් එන්නෙ. ඒක අභ්‍යන්තරයේ තියෙන ගින්න නෙවෙයි. තියෙන සතුටකුත් නෙවෙයි. ඒක සිතුවිල්ලකින් එන්නෙ.

**උපාසිකා:** ඔය කම්පන ස්වභාවය කියන්නෙ සංඥාවල ඉත්ථභාවය ඝනකමද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ **කම්පන ස්වභාවයට හේතු වෙන්නෙ කම්පන ස්වභාවයට දැනෙන එකක්. ඉත්ථ භාවය කියන්නෙ වේගෙට දැනෙන එකක්. දෙයක් වගේ. ඒක තමයි ඉත්ථ භාවය.** 'ඉතිරූපං' ඒක අපට බලන්න ඕනතරම් ක්‍රම තියෙනව. ගිනි බෝලය වළල්ල වගේ ජේනව වගේ. බඹරය කරකවන කොට බඹරය බලගැන්වෙනව වගේ. වේගයක් මත තමයි දෙයක් ජේන එක. දුවන ළමයෙක් ඇඳල පිටු 200ක පොතක් පෙරළන කොට දුවන ළමයෙක් ජේනව වගේ. එහෙම නැත්නම්

ප්‍රොජෙක්ටර් එකකින් යන කොට ෆිල්ම් රෝල වේගයෙන් යන කොට චිත්‍රපටිය පේනව වගේ. බුදුන් වහන්සේ දෙන උපමාව තමයි ගඟ ගලනව කියන එක. ගඟක් කියල කතා කරන්නෙ වේගයෙන් ගලන නිසා. හැබැයි තියෙනව වගේ පේනව තියෙන ගඟක් නෑ වේගෙට තමයි ගඟ කියන්නෙ. වේගෙට මැවෙන එකක් තමයි මුළු කතාවම. මුළු කතාවම කියන්නෙ අප සම්මුතිය තුළ කතා කරන 'ගැලැක්සිය' පවා, විශ්වය පවා, කම්පනයක් තියෙන්නෙ. කම්පනයක් නැත්නම් අපට පේන්නෙනෑ. අපට පේන හැම තැනකම තියෙන්නෙ කම්පනයක්. අංශු කම්පනයන් මොන ආකාරයට ද වෙන්නෙ, කම්පනයක් තමයි පේන්නෙ.

ඒ කියන්නෙ ශබ්දයක් විදියට ආවත්, කිරණයක් විදියට ආවත්, ආලෝක හැඩතලයක් විදියට ආවත්, මොන විදියට ආවත්, අපේ සෙන්සස්වල තියෙන්නෙ කම්පනයන්මයි. සෙන්සස් කියන්නෙම කම්පනය ඉන්ඩිකේට් කරන එකක්. කම්පනයක් නැත්නම් කම්පන ඉන්ඩිකේට් කරන්නෙ නෑ. ඇත්තටම කීවොත් අපි පේනව කියල ගැලැක්සියක් හරි ඔක්කොම තියෙන්නෙ මේ කම්පන කතාවක් විතරයි. වේගෙට සකස් වෙන එකක්. බලයක් කියන්නෙ වේගයක් මත නිර්මාණය වන බලයක්. කම්පනයක් නැති බලයක් නෑ. **අන්ත දෙකක් නැති බලයක් නෑ. ධන ඍන අන්ත දෙකක් තියෙනව කියන්නෙ එතන කම්පනයක් තියෙනවමයි.** පෘථිවිය කැරකෙන වේගෙට තමයි ගුරුත්වාකර්ෂණ බලය තියෙන්නෙ. කැරකෙන වේගෙට බඹරය වුණත් එහෙමයි. කැරකෙන වේගෙට බලයක් හැදෙනව.

දිය සුළියක් වුණත් එහෙමයි. ඒ පැත්තට ගලන කොට බාධාවක් දැම්මොත් ඒකට එන බලය තමයි අනික් පැත්තට හැරවෙන්නෙ, එවිටයි දිය සුළිය වෙන්නෙ. ඒක බලගැන්වෙන කොට ඒක නැවත නැවත බලගැන්වෙනවා. ඒක තව තව තව වෙනස් වෙනව. විපරිනාම වෙනව. ඔය විදියට තමයි පෘථිවිය නිර්මාණය වුණත් සම්මුතිය තුළින් බැලුවොත් මේක පේනව. **මේකම තමයි විඤ්ඤාණ මායාවෙත් නිර්මාණය. තියෙනව කියල දැනෙන එක ධන, හැබැයි තියෙනව කියල ගත්තම එහෙම එකක් නෑ ඍණ.** හැම තිස්සෙම යෝ හන්තේ අන්ත 2ක් තිබුණොත් බලයක් තියෙනව. තියෙනව වගේ දැනෙන එකක් ආවොත් දැනෙන එකත් එක්කම

බලයක් උපදිනව. ඒ දැනෙන එකම කරන්ට් එකක් වගේ තමයි. ඒකයි අර විද්‍යුතය වික්ටෝරියා ඩෑම් එකේ වතුර දාල චුම්භකය කරනව වගේ.

චුම්භකයක සාමාන්‍යයෙන් ද්‍රව 2ක් තියෙනව. ධනයි ඍණයි. ඒ ද්‍රව 2ක තව තව බලගැන්වෙනව කැරකෙන කොට බලගැන්වෙන කොට මොකද වෙන්නෙ, ඒ දෙක ගෙවල්වලට ගිහිල්ලා. 35,000, 11,000 ඒ විදියට නිවසට එනව ට්‍රාන්ස්පෝමර් හරහා බෙදල බෙදල ගෙවල්වලට බෙදල දෙන්නෙ. විශාල පවර් එකක් මෙගා පවර් එකේ විදියට ස්වභාදහමේම තමා ඔය ගන්නෙ. පවර් එකක් ඔය විදියට හදනව නේ සුළං මානය. ඔය විදියට හදනව නේ මුහුදු රැල්ලෙන් බලය අරගෙන බලය දෙනව විද්‍යුතය කරල.

ඇත්තටම මෙතනත් විඤ්ඤාණයේ බලයක් තියෙනව. විඤ්ඤාණය කියන්නෙ එහෙම එකක් නෙවෙයි. මෙතන ඉත්ථ දැනෙන ස්වභාවය බලයක් තියෙනව වගේ දැනෙනව. ශබ්දෙත් තියෙනව වගේ දැනෙනව. එකතු වෙන එකක් තියෙනව වගේ දැනෙනව. ඒකම තමයි මේ අපේ ආත්මය කියන්නෙ. ඒකත් පවතින එකක් නෙවෙයි. හැම මොහොතකම සකස් වෙන එකක්. වේගය මත සකස් වෙනව. ගඟ කියන්නෙ පවතින එකක් නෙවෙයි. ප්‍රවාහයක්. **මේ සිත කියන්නෙ ප්‍රවාහයක්. ඒක නිසා තමයි හුස්ම වැටෙන කම්ම සිතක් තියෙන්නෙ. හැබැයි ඒක ප්‍රවාහයක් ඇතිවන නැතිවන ප්‍රවාහයත් නැත්නම් ඒක වරදිනව හරියටම කිව්වෙ නැත්නම්. දැන් පොඩි කාලෙ ඉඳල එකම හිත තියෙනව නෙවෙයි, එතන එතන ඇතිවෙන නැතිවෙන වේගයක්.** වේගයක් කියන්නෙ තියෙන එකක් නෙවෙයි. නමුත් ඒක වේගයක්. බැලූ බැල්මට තියෙනව වගේ පේනව. ඒක තමයි අප පොඩි කාලෙ ඉඳලම ඉන්නව වගේ දැනෙන්නෙ. දියවෙන්නෙ තියෙනව කියන සංඥාවනේ ඉත්ථ සංඥාව. ඒ ඉත්ථ සංඥාව තමයි ආත්ම සංඥාව. තියෙනව කියල දැනෙන එක. අභ්‍යන්තරයේ අපට නොපෙනෙන්න අපට දැනෙනව ඉන්නව වගේ මම ඉන්නව වගේ, දැනෙන එකක් එනව. ඒක තමයි කරන්ට් එක. අන්න ඒක දියවෙනව. ඒ බලය දිය වෙන්නෙ පවර් එක නැති වෙනව. පවර් එක දියවෙන එක තමයි 'නිබ්බිදන්ති - විරාගන්ති - නිරෝධන්ති පටිනිස්සග්ගානු පස්සී' කියන්නෙ. අභ්‍යන්තරයට දැනෙන්නෙ ඒක සුඛුම ස්වභාවයකින්. සැහැල්ලුවකින්. ඒ

සැහැල්ලුව ආවෙ කොහෙන්ද කියල හිතා ගන්න බෑ. සැහැල්ලුව එන්නෙ ආතතිය තමයි අර පවර් එක බැඳිල තිබුණ බන්ධන බලය කුඩුවෙලා කුඩුවෙලා, අර බඹරය කැරකෙන කොට එන බලය. ඒ බලය වගේ එකක් අපට ආරෝපණය වෙලා තියෙන්නෙ නොපෙනෙන්න.

ඒ ආරෝපණය දියවී ගෙන දියවී ගෙන ගිහිල්ල අවසානයේදී අපට සැහැල්ලුවක් තමයි දැනෙන්නෙ නිවන් දකින කොට. **නිවන් දකින අත්දැකීම මොකක්ද කියල ඇහුවොත් සැහැල්ලුවක් විතරයි එයාට කියන්න දෙයක් නෑ. සැහැල්ලුවක් විතරයි දැනෙන්නෙ. එයමයි ශාන්ත, එයමයි ප්‍රණීත ඒතං සාන්තං ඒතං ප්‍රණීතං යදිදං සබ්බ සංඛාර සමථෝ කිව්වෙ ඔන්න ඔය නිසයි. එතන තියෙන එකක් නෑ, තියෙන බව නැතිවීම තුළ උපදින සැහැල්ලුව.** මාරයා අහනව ප්‍රශ්නයක් බුදුන් වහන්සේගෙන් බුද්ධත්වයෙන් පස්සෙ ඔබට සතුටුද මහණ කියල අහනව. එතකොට බුදුන් වහන්සේ කියනව 'මොනව ලැබුණාටද මාරය' කියල. එහෙනම් 'මහණ ඔබට දුකද' කියල අහනව. එතකොට අහනව මොනව නැති වුණාටද මාරය කියල. 'නැතිවුණා නම් නැතිවුණේ තිබුණා කියල හිතපු දෙයක් පමණයි' කියල කියනව. ඒ කියන්නෙ තිබුණා කියල හිතපු දෙයක් නැතිවුණා පමණයි. ඒ කියන්නෙ ආත්ම දෘෂ්ටිය නැතිවුණා පමණයි කියල. ආත්ම සංඥාවක් මෙතන පරිහරණය වෙනව. හැබැයි ආත්ම දෘෂ්ටිය ඊට උඩින් තියෙනව. පේන්නෙ නැති වුණාට, අයිසිං ටික කේක් එකේ තියෙනව, ආත්ම දෘෂ්ටිය විදියට යටින් කේක් එකකුත් තියෙනව. එතකොට අයිසිං ටික දිය කරන්නෙ නැතුව කේක් එක දිය කරන්නත් බෑ. මොකද හැමෝටම පේන්නෙ අයිසිංවලින් වැහිච්ච කේක් එක. අර තියෙන්නෙ අපේ කේක් කියල. නමුත් ආත්ම දෘෂ්ටිය කියන්නෙ සිතුවිල්ලක්. සිතුවිල්ලක් එනව මම ඉන්නව කියල. අර සිතුවිලි ගොඩේම සිතුවිල්ලක් උපදිනව මම ඉන්නව කියල සිතුවිල්ලක්.

අර රූපයයි ශබ්දයයි. නිමල් කියන කමල් කියන මොකක්හරි ශබ්දයක් අර හැඩතලයක් එක්ක ශබ්ද වර්ණ දෙක හැදෙනව. ගැට ගැහෙනව. ගැට ගැහිල මම හැදෙනව ඔතන. දෘෂ්ටිය. අරවත් දෘෂ්ටි තමයි. අම්මා තාත්තා හැදෙනව වගේම අම්ම තාත්ත ඔක්කොම. මේකත් දෘෂ්ටියක් තමයි මම කියන්නෙ. හැබැයි දැන් මේක සිතුවිල්ලක්.

සිතුවිල්ලක් කියන්නෙ ශබ්ද වර්ණ එකතු වුණු එකක්. මේක ආත්ම දෘෂ්ටිය, ආත්මය නෙමෙයි ඕක හඳුනා ගන්න ඕන දෘෂ්ටිය මොකක්ද කියල. **දෘෂ්ටිය තියෙන තාක් කල් ආත්මය නැති කරන්න බෑ. මම ඉඳගෙන සෙවණැල්ල නැති කරන්න හදනව. මම ඉන්නෙ සිතුවිල්ලකින් බැසගෙන පේන්නෙ නැති වුණාට.**

ඉස්සෙල්ලම මම කියන සිතුවිල්ල සක්කාය දිට්ඨිය නැති කර ගන්න ඕන. ඒක ඉන්නව තියෙනව වගේ අපි ගත්ත දෘෂ්ටියක් තියෙනව. **දැනෙන එක වෙනයි, දැනෙන එක නිසා උපදින දෘෂ්ටිය වෙනයි. ආත්ම සංඥාව වෙනයි. ආත්ම සංඥාව මත රැඳී පවතිනවා, සිතුවිල්ලක් ආත්ම දෘෂ්ටියක්.** ශබ්ද සංඥාව වෙනයි. ශබ්ද සංඥාවට එහායින් තියෙනව ශබ්දයකුත්. අන්න ඒ වගේ ආත්ම සංඥාව වෙනයි, ආත්ම සංඥාවට උඩින් තියෙන දෘෂ්ටිය තමයි පිනවන්නෙ. මම කියල පිනවන්නෙ දෘෂ්ටියකින්. ඒ මම තමයි. ශබ්ද සංඥාවෙ ශබ්ද නෑ. හැබැයි ශබ්දයක් නිසයි ශබ්ද සංඥාව තියෙන්නෙ. ඒකෙන් අපට තේරෙනව ආරෝපණය තමයි දැනෙන ගතියය තමයි සංඥාව. මේක දැනෙන ගතිය තමයි ආත්ම සංඥාව. හැබැයි ආත්ම සංඥාව දුරු වෙන්නෙ නෑ, ඊට උඩින් පිහිටල තියෙන්නෙ ආත්ම දෘෂ්ටිය. ශබ්ද වර්ණවලින් ගොඩ නැගුණු සිතිවිලිවලින් ගොඩ නැගිල වැහිල තියෙන්නෙ මේක. ලෝක සංඥා හැම එකක්ම මේකට හේතුවෙලා තියෙනව මේක වැහෙන්න.

කෙලෙස්වලින් වැහෙනව කියන්නෙත් ඕකම තමයි. ඒ ටික සේරම දෘෂ්ටිය බිඳ වැටෙන කොට ආත්ම දෘෂ්ටිය බිඳ වැටෙනව. මෙතන ආත්මයක් නැති බව ධර්මය තුළින් ඒක මෙනෙහි කිරීම තුළ අර 'ධම්මධීති ඥානය' තුළ එහෙම නැත්නම් මේක එන්නෙ යථා භූත ඥානයෙන්. මේක හැදෙන හැටි දකින එක යථාභූත වන හැටි. දකින එකෙන් මොකක්ද වෙන්නෙ දෘෂ්ටිය කුඩු වෙලා යනවා. දෘෂ්ටිය කුඩුවෙලා ගියහම මතුවෙලා ඒකට යටින් තියෙන්නෙ සැබෑම කතාව. අන්න ඒක තමයි ආත්ම සංඥාව දුරු වන්නෙ. එතකොට දෘෂ්ටියත් නෑ. ආත්ම දෘෂ්ටිය නෑ කියන්නෙ එයා දන්නව මෙතන ආත්මයක් නෑ කියල. දැනුමෙන් දන්නව. දන්නව කියන්නෙ දෘෂ්ටිය නැතිවුණා කියන එකයි. දන්න නිසා "ජානතෝ අහං භික්ඛවේ එස්සතෝ" දන්න කෙනාටයි මේක

ක්ෂය වෙන්නෙ. "ආසය්‍යවානම් ඛෙයය්‍යම් වදාමි" අන්න ඒක තමයි ක්ෂය වී ගෙන යන්නෙ ආත්ම සංඥාව. ඒක තමයි ආස්‍රව කෙලෙස් කියන්නෙ. ආත්ම සංඥාව තමයි චිත්තාරෝපණය තමයි එකම කතාව. ඝන සංඥා සුකුම වෙනව කියන්නෙ එකම කතාව. සංඥා සුකුම ස්වභාවයකට පත් වෙනවා. ඝනට තියෙනව කියල ආපු ආරෝපණයටයි ඝන සංඥාව කියන්නෙ. චිත්තාරෝපණ සංඥාවයි දුරු වී ගෙන යන්නෙ දියවීගෙන යන්නෙ. අර බඹරයේ බලය අඩුවෙලා අඩුවෙලා බඹරයේ කැරකෙන වේගය අඩුවෙනව වගේ.

**උපාසිකා**: චාර්ජ් එක බහිනව වගේ නේද?

**ආර්යයන් වහන්සේ**: අන්න හරි බැටරියේ චාර්ජ් එක බහිනව වගේ. ඉතින් ආර්යයන් වහන්සේ ඔක්කොම කියල තියෙන්නෙ නේද? කියන්න දෙයක් ඉතුරු කරල නෑ. එක තැනක කියනව අධිවේග මාර්ගයේ වාහනයක් දමයිද ඒ වාහනය යන්නෙ පෙට්‍රල් තියෙනකම් විතරයි කියල. ඒක කියන්නෙ රාග, ද්වේෂ, මෝහ කියන සබ්භූපදි පටිනිස්සග්ගෝ කියන එක තමයි ඔය පැහැදිලි කරන්නෙ. මෙතෙක් අල්ල ගත්ත උපාදාන ගොඩවල් උපධි ගොඩ දියවී ගෙන දියවීගෙන යනව. ඒකයි 'නිබ්බිදන්ති - විරාගන්ති - නිරෝධන්ති - පටිනිස්සග්ගානුපස්සී' කියල පෙන්නුවෙ. හරි සුන්දර කතාවක් ධර්මයේ කියවෙනව නේද?

**උපාසිකා**: එහෙමයි ආර්යයන් වහන්ස. කරන්න තියෙන්නෙ අපට එකම දෙයයි. සංඥාව සුකුම වෙනව කියල අප මේ ඇත්තම පෙන්වන්න ඕන.

**ආර්යයන් වහන්සේ: ඇත්ත පෙන්වන්න කෙනෙක් නෑ, ඇත්ත මෙනෙහි කරන්න ඕන. ඇත්ත දකින්න ඕන.** මෙතන අප කතා කරන භාෂා විලාසයේ පවා තියෙනව ආත්ම දෘෂ්ටිය. හරි පරිස්සම් වෙන්න ඕන. හැම තිස්සෙම කෙනෙක් නිරූපණය කරනවා භාෂාවත්. ඒ කියන්නෙ **දැන් මේසය කිව්වොත් මේසෙ තියෙනව, තියෙනව කියල අමුතුවෙන් කියන්න ඕන නෑ. පොත මේසය කියන කොටම තියෙනව වෙලත් ඉවරයි. භාෂාව කෙළින්ම ඇත්ත කරල තියෙන්නෙ.** ලෝකය ඇත්ත කරල තියෙන්නෙ මේ භාෂාවෙන්මයි. ඇත්තම කිව්වොත් මේ භාෂාව

අභිබවා ගිය පැත්තක් තමයි අවදි වෙන්නෙ. ඒක කියන්න බැරි වෙනව අවසානයේදී. ඒ කියන්නෙ භාෂාවෙන් කියන්න බෑ මේ කතාව. භාෂාවෙන් කියන්න බැරි භාෂාවේ තියෙනව දෙයක්. හැම තිස්සෙම භාෂාව දෙයක් නිරූපණය කරනවා. **නාමරූප නැතිව භාෂාවක් නෑ.** මේසය කිව්වොත් ඒත් රූපයක් තියෙනව. ශබ්දයක් තියෙනව. පුටුව කිව්වත් එහෙමයි. නෑ කිව්වත් තියෙනව. මොකක්වත් භාෂාවෙන් කියන්න බෑ. තනිකර කට වැහෙනව මේක අවසානයේදී මොකද දැනෙන ස්වභාවය කියාගන්න බැරි වෙනව. අවසානයේදී මේකෙ දෙයක් හම්බ වෙන්නෙ නැහැනේ. දෙයක් දැනෙන්නෑ, දැනෙන දේත් නැතිවෙලා යනව නේ. කවදාවත් මේ ආශ්‍රව ක්ෂය වෙච්ච එක කියන්න බැහැ. අවසානයේදී ඇත්තටම සිද්ධ වෙන්නේ නොකියන එකමයි. මොකද හේතුව මේක කියා ගන්න බෑ. එයා දන්නව එයාට අවබෝධයි, ප්‍රත්‍යක්ෂයි කියා ගන්න බෑ.

අවසානයේදී බුදුහාමුදුරුවො කිව්ව වගේ තිරත් ඉවරයි තෙලුත් ඉවරයි පහන නිවී ගිය තැනක් කොයින්ද කියන එකත් තමයි කියන්න වෙන්නෙ. වෙන කියක් දෙයක් ඉතුරු වෙන්නෙ නෑ. මොනම වචනයක්වත් කියා ගන්න බෑ. කොයි විදියෙන් බැලුවත් වචනයක්මයි. හැබැයි මෙතන අවසානයට මහෙච්ඡතාවය ගිහිල්ල අල්පේච්ඡතාවට වැටෙනව. ඒක අභ්‍යන්තරයෙන් එනව. එතනට ඇවිත් තමයි නවතින්නෙ. අල්පේච්ඡතාවට එනවා. අනිත් අයට තේරුම් ගන්න අමාරුයි. අභ්‍යන්තර අල්පේච්ඡතාවට එනව. බාහිරට සොයා ගන්න බෑ. අභ්‍යන්තරයේ කිසිම දෙයක් එයා අගය කරන්න නැති තැනකට එනව. එයාට කිසිම දේක වැලිච් එකක් නැහැ. ඒක නැති බව පේන්නේ නැහැ බාහිරට. මොකද සම්මුතිය තුළ ඒ විදියටම කතා කරනව. ඒ සම්මුති දැනගෙනයි කතා කරන්නෙ අවසානේ. එයා දන්නෙ නැතිව නෙවෙයි. හොඳටම දන්නව. මෙතන කිසි දෙයක් නැහැ. තේරුමක් නැහැ කියල දැනගත්තට කියන්නෙ නැහැ.

අනික් අයට ඕන විදියට තමයි ජීවත් වෙන්නෙ එයාට එයා නැහැ. හිනාවෙන්න කිව්වොත් හිනාවෙලා පෙන්වන්නත් පුළුවන්. අඬන්න ඕන නම් අඬලත් පෙන්වන්න පුළුවන්. අන්න ඒ දෙයත් සිද්ධ වෙනව. අවසානයේ තමන් නැතිවෙලා තමන්ට, තමන් අනිත් අයට ඕන දේ කරනව එච්චරයි. එයාට එයා නැහැ එයා මැරිල ඉවරයි. නමුත් අනිත් අය ඒක

දන්නෙ නැහැ. අනිත් අය හිතන්නෙ එයා ඉන්නව කියල. එයා සෙවරී අදහස් දාන්න යනව. නිවනට පත්වීම තුළ සෙවරී අදහස් නෑ. හැබැයි 'න සංඝං ගච්ඡන්ති' කියන තැනට වැටෙනව. ඒ කියන්නෙ ගණන් ගන්නෙත් නෑ කවුරුවත් එයා ගණන් ගන්නෙත්නෑ කවුරුත්. ඒකට හේතුව එයා අල්පේච්ඡතාව අගය කරන්නෙ. කම්පනයකුත් නෑ. හරි සුන්දර කතාවක් තමයි මතුවෙලා එන්නෙ. මේකෙ අවසානයේ කියන්න පුළුවන් එකම එක දෙයයි. පුදුම සැහැල්ලුවක් දැනෙනව එච්චරයි කියන්න පුළුවන්. නැතිනම් කියන්න පුළුවන් මහා ශාන්ත සුවයක් දැනෙනව. ගිහිල්ල ගිහිල්ල කියන්න බැරි එකකින් නවතිනව. හැබැයි කියන අවශ්‍යතාවකුත් එන්නෙත් නැහැ. කවුරුත් අහන්නෙ නැහැ. ඒ ස්වභාවයට ගියාට පස්සෙ එච්චර ඉලිප්පෙන්නෙ නෑ. රැප්පනය වෙන්නෙනෑ. රැප්පනය නෑ කියන්නේ නිවිච්ච ස්වභාවයට පත් වෙනව ලස්සනයි කියල එහෙම දේකුත් සොයන්නේ නැහැ. **මුකුත් හිතන්න එපා. හිතන එක විඤ්ඤාණ මායාවෙන් එන්නේ. හිතෙන ඒව මුකුත් ගණන් ගන්න එපා. විඤ්ඤාණ මායාවෙන් දෙනව මේක පුළුවන් වෙයිද? මේක බැරි වෙයිද? විඤ්ඤාණයට කරන්න පුළුවන් දෙයක්නෑ. නිහඬවම තමන්ගෙ ගමන යනකොට ඒක ඉබේම වෙනව. මුකුත් එහෙම කරන්න දෙයක්වත් හිතන් නැතුව ඉන්න ඕන. නිවන් දකිනව කියල කරන්න දෙයක් නෑ. සත්‍ය මෙනෙහි වෙන එක විතරයි වෙන්නෙ.**

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ
අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත.
ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීම